යුද අපරාධ හැඳින්වීම

අසිත මල්ලවආරච්චි

පටුන

මාතෘකාව පිටු අංකය

01. පරිච්ඡේදය

01. යුද්ධය පිළිබඳ පසුවදනක් 09

02. පරිච්ඡේදය

02. එක්සත් ජාතීන්ගේ සංවිධානය හා යුද අපරාධ හැඳින්වීම 21

02.1. එක්සත් ජාතීන්ගේ සංවිධානය 22

02.1.1. එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහිවීම හා එහි ව්‍යුහය 22

02.1.2. මහා මණ්ඩලය 26

02.1.3. ආරක්ෂක මණ්ඩලය 29

02.1.4. ආර්ථික හා සමාජීය මණ්ඩලය 31

02.1.5. අන්තර්ජාතික අධිකරණය 33

02.1.6. ලේකම් කාර්යාලය 33

03. පරිච්ඡේදය

03. යුද්ධය හා යුද නීතිය 35

03.1. යුද්ධය යනු කුමක්ද? 35

03.2. යුද නීතිය 38

03.2.1. සාම්ප්‍රදායික යුද නීතිය 39

03.2.1.1. පුරාතන අවධිය 40

03.2.1.2. මධ්‍යතන අවධිය 42

03.2.1.3. නූතන යුගය 44

03.2.2. ජාත්‍යන්තර මානව හිතවාදී නීතිය 46

03.2.2.1. ප්‍රාථමික මූලධර්ම 49
03.2.2.2. පොදු මූලධර්ම 51
03.2.2.3. විශේෂ මූලධර්ම 53
03.3. අපරාධය හා යුද අපරාධ 58
03.3.1. අපරාධයක් යනු කුමක්ද? 58
03.3.2. යුද අපරාධ 63
03.3.3. වර්ග ඝාතනය 74

04. පරිච්ඡේදය

04. යුද අපරාධ සම්බන්ධයෙන් පවතින්නා වූ නීති මූලාශ්‍රයන් 78
04.1. හේග් නීතිය 79
04.2. ජිනීවා නීතිය 83
04.3. ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 38 වගන්තිය 87
04.4. සාම්ප්‍රදායික ජාත්‍යන්තර මානව හිතවාදී නීතිය 88

• ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය 98

01

යුද්ධය පිළිබඳ පසුවදනක්.

මානව ඉතිහාසයේ ආරම්භයේ පටන් යුද්ධය හෙවත් සටන් මිනිසාට ආගන්තුක වූවක් නොවීය. ආරම්භක යුගයේ දී සිය පැවැත්ම සහ ආරක්ෂාව තහවුරු කර ගැනීම සඳහා වල් සතුන් සමඟ ද ගණ ගෝත්‍ර, සමාජය තුළදී වෙනත් ගෝත්‍රික කණ්ඩායම් සමඟ ද විවිධ හේතු සහිත ව සටන් වදින්නට මිනිසාට සිදු විය. මිනිසා ගල් ආයුධ භාවිත කළ යුගයේ පටන් ඔහු සටන් සඳහා සහභාගි වී තිබේ. අදට සාපේක්ෂ ව එම සටන් සරල වුව ද ඒවා බෙහෙවින් බිහිසුණු වුයේ, ස්වකීය ප්‍රතිවාදියාට අඩි කිහිපයක් නුදුරින් සිට සටන් කරන්නට සිදු වීම නිසාය. මානව සමාජය ක්‍රමයෙන් පරිණාමය වත් ම මිනිසාගේ සටන් කලාව ද පරිණාමයට බඳුන් වුයේය. ඒ අනුව හෙතෙම දියුණු ආයුධ මෙන් ම විවිධ උපක්‍රම ද සටන් ජයග්‍රහණය උදෙසා උපයෝගි කොට ගත්තේය.

මිනිසා විසින් ගංගා නිම්න ආශ්‍රිත ව ගොඩනඟා ගත් ශිෂ්ටාචාර යුගයේ දී ඔහු බොහෝ සටන් සඳහා දායක වී තිබේ. ශිෂ්ටාචාර බිඳීගිය පසු ඇතිවුණු කාල පරිච්ඡේදයේ දී ද ඉන් පසුව ද වර්තමානය දක්වා වූ යුගය තුළදී ද සටන් හෙවත් යුද්ධය මිනිසා සමඟ පැවතියේය. යුද්ධය කෙතරම් දරුණු වුව ද, එය කෙතරම් ම්ලේච්ඡ වුව ද, ඉන් ජීවිත විනාශ වුව ද මිනිසා සටන් කිරීම නම් නවත්වන්නේ නැත. ඒ සඳහා බලපාන

මනෝ විද්‍යාත්මක කාරණා තිබේ. ස්වභාවයෙන් ම මිනිසා තුළ ප්‍රචණ්ඩත්වය හා ලිංගිකත්වය යන ආශාවන් දෙක පවතින බව පෙන්වා දෙන සිග්මන් ෆ්‍රොයිඩ්, මිනිසා මූලික වශයෙන් මෙහෙය වන්නේ මෙකී බලවේග දෙක විසින් බව ද පවසයි. ඒ අනුව ප්‍රචණ්ඩත්වය මිනිස් ආශාවකි. සටන් කිරීම මිනිසා තුළ ස්වභාවයෙන් ම පවතින්නකි.

ලෝක ඉතිහාසයේ වර්තමාන කාල වකවානුව තුළ දී යුද්ධය වඩාත් තීව්‍ර අන්දමින් කෙරෙමින් පවතී. ඒ සඳහා ඉතා විශාල වශයෙන් නවීන තාක්ෂණය යොදා ගනිමින් තිබේ. එයින් විනාශ වන ජීවිත සංඛ්‍යාව අති විශාලය. වර්තමාන තාක්ෂණික යුද්ධය නිසා මිනිසාට මෙන් ම පරිසරයට සිදුවන හානිය ද නොසලකා හැරිය හැකි නොවේ. යුද්ධයෙන් ලැබෙන්නේ විනාශයක් පමණි. සදාකාලික අබිබගාතයන් බවට පත්වන ප්‍රමාණය ද ඉතා විශාලය. යුද්ධය තුළ මරණ නියත ව තිබේ. එහෙත් මිනිසා යුද්ධය අත් නොහරී. ඒ පෙර සඳහන් කළ මානසික බලපෑම නිසාය. යුද්ධය කෙතරම් පුළුල් අන්දමින් ජන ජීවිතය සමඟ බැඳී පැවතිය ද යත් වර්තමානයේ දී යුද විද්‍යාව, යුද කලාව ආදී වශයෙන් යුද්ධය පිළිබඳ වෙන ම අංශ පවා බිහි වී තිබේ. එමෙන් ම යුද මනෝ විද්‍යාව නමින් වෙන ම විෂය පථයක් සංවර්ධනය වෙමින් පවතී.

අප ජීවත් වන මේ යුගය තුළ ගෙවී ගිය කාල වකවානුවේ දී අති භයංකර යුද්ධ කිහිපයක ම අත්දැකීම් විඳින්නට ලෝක ජනතාවට සිදුවිය. ලෝක යුද්ධ නමින් හැඳින්වෙන, මුළු ලෝකය ම පාහේ සම්බන්ධ වුණු යුද්ධ දෙකක් අපි අත් වින්දෙමු. ඒ පළමු ලෝක යුද්ධය හා දෙවන ලෝක යුද්ධයයි. "වසර 04යි මාස 03යි දින 14ක් පුරා විහිද ගිය පළමු ලෝක සංග්‍රාමය 1918 නොවැම්බර් 11 වන දින අවසන් විය. යුද්ධය සඳහා සෘජු ව වියදම් වුණු මුදල ඇමරිකානු ඩොලර් බිලියන 186ක් බවට ඇස්තමේන්තු කර ඇත. යුද්ධය නිසා මියගිය සිරිස මිලියන 10කට ආසන්න වන අතර තුවාල ලද්දවුන්ගේ ප්‍රමාණය මිලියන 37කි. මෙම යුද්ධයේ දී රුසියාව විසින් යොදවන ලද සමස්ත බටයන්

ප්‍රමාණය 12,000,000ක් වූ අතර ඉන් 1,700,000ක් යුද්ධයේ දී මියගොස් තිබේ. 4,950,000ක් තුවාල ලබා තිබේ. 2,500,000ක් සිරකරුවන් හෝ අතුරුදහන් වූවන් බවට පත් ව තිබේ. රුසියාව විසින් යුද්ධයට සහභාගි කළ බට පිරිසෙන් 76.3 % යුද්ධය නිසා මරණයට පත්විය. නොමැතිනම් තුවාල ලැබීය. ඇමරිකා එක්සත් ජනපදය එම ප්‍රමාණය 8 % කි" (කංකානම්ගේ, 2006, 05 පිටුව).

යුද්ධයේ බරපතල ප්‍රතිඵල භුක්ති විඳිමින් තවත් වසර කිහිපයක් ගෙවී ගියේය. යළිත් යුද්ධයක් නම් මෙලොවට අවශ්‍ය නැති බව ලෝක ජනතාවට හොඳින් ම අවබෝධ වී තිබිණි. ඔවුන් කිසිවෙක් යුද්ධයක් බලාපොරොත්තු නොවීය. එහෙත් සාමයෙන් ගත කිරීමට ලෝකයට ඉඩ ලැබුණේ වසර විස්සක් පමණි. 1939 දී රටවල් 61ක ජාතීන් සම්බන්ධ කර ගනිමින් දෙවන ලෝක යුද්ධය ආරම්භ වූයේය. එය ද ජර්මනිය විසින් ආරම්භ කරන ලද්දකි. ඒ වන විටත් අධිරාජ්‍යයන් දෙකකට ම හිමිකම් කියූ ජර්මනියට තවත් එවැනි තෙවන අධිරාජ්‍යයක් ගොඩනඟා ගැනීමේ අවශ්‍යතාව තදින් ම දැනෙමින් පැවතිණි. යුදවාදී ජර්මනියේ එකි අවශ්‍යතාව මුදුන්පත් කිරීම 1933 දී එහි බලයට පැමිණි නාසි නායක ඇඩොල්ෆ් හිට්ලර් විසින් බාරගත්තේය. ඒ අනුව 1939 සැප්තැම්බරයේ දී ජර්මනිය විසින් ඇංග්ලෝ ප්‍රංශ පෝලන්ත අර්බුදය නිර්මාණය කරන ලදී. 1938 දී ජර්මනිය විසින් ඔස්ට්‍රියාව ආක්‍රමණය කරන ලද අතර මේ සඳහා ඉතාලියේ මුසෝලනිගේ සහයෝගය ජර්මනියට ලැබුණි. මෙහිදී මහා බ්‍රිතාන්‍යය සහ ප්‍රංශය ඔස්ට්‍රියාවට උදව් කළේය. 1939 දී හිට්ලර් පෝලන්ත සහ චෙකෝස්ලොවැකියාව ආක්‍රමණය කළේය.

යුරෝපයේ රටවල් එකින් එක යටත් කර ගනිමින් සිය අධිරාජ්‍යය පුළුල් කර ගනිමින් ඉදිරියට පැමිණි හිට්ලර් සිය අවධානය සෝවියට් දේශය වෙතට යොමු කළේය. සිය මවුබිම වෙනුවෙන් දැඩි අදිටනින් සටන් වැදුණු සෝවියට් ජනතාව හිට්ලර්ගේ යුද උමතුව පරාජය කිරීමට සමත් වූයේය. හිට්ලර් විසින් යටත් කොටගත් ස්වකීය ප්‍රදේශ නිදහස් කර ගැනීමෙන් නොනැවතුණු සෝවියට් හමුදාව හිට්ලර්ගේ ග්‍රහණයට නතු ව තිබූ යුරෝපයේ සෙසු ජනතාවට ද නිදහස

ලබා දීමට උත්සාහ කළහ. එයිනුදු නොනැවතුණු ඔවුහු ජර්මනිය තුළට ගමන් කරමින් අවසානයේ දී යුද උන්මාදයෙන් පෙළෙමින් සිටි ජර්මනිය යටත් කර ගැනීමට ද සමත් වූයේය. ඒ 1945 මැයි මාසයේ දී ය. ඉන් දින නවයකට පසු ව නාසිවාදි හිට්ලර් සිය දිවි නසා ගත්තේය. "දෙවන ලෝක යුද්ධය හේතුවෙන් යුරෝපයේ පමණක් මිලියන 20ක් මිය ගිය බව සඳහන් වේ. මේ සඳහා රටවල් 61ක බිලියන 1.7ක ජනතාවක් සහභාගි වී තිබේ. එය ලෝක ජනගහනයෙන් 3/4කි. ක්‍රියාන්විත සේවයේ යෙදුණු හට හමුදා ප්‍රමාණය මිලියන 110ක් වූ අතර ඉන් මිලියන 30ක් ම සෝවියට් හමුදා වූයේය. ජර්මන් බට හමුදා ප්‍රමාණය මිලියන 17කි. ඇමරිකන් හට හමුදා ප්‍රමාණය මිලියන 16කි. සමස්ත යුද්ධය සඳහා වියදම් වුණු මුදල් ප්‍රමාණය ඇමරිකන් ඩොලර් ට්‍රිලියන් 1ක් බව සඳහන් වේ. සෝවියට් දේශයේ ජාතික ආදායමෙන් 30 %ක් යුද්ධය නිසා විනාශයට පත් විය" (කංකානම්ගේ, 2006, 06 පිටුව).

දෙවන ලෝක යුද්ධයේ දී ගුවන් යානා සහ යුද ටැංකි තිරණාත්මක වූ බව යුද විශේෂඥයන් ගේ අදහසයි. නවින ආයුධ විශාල ප්‍රමාණයක් අත්හදා බැලූ අතර දුර ගමන් ගන්නා රොකට් වෙසසින් ම වැදගත් යුද අවියක් බවට පත් විය. කෙසේ වෙතත් අවසානයේ දී මෙතෙක් ලෝකයේ භාවිත කළ දරුණුතම ආයුධය වූ පරමාණු බෝම්බ ජපානය වෙත හෙළන්නට ඇමරිකාව නොපසුබට විය. ඇමරිකාව විසින් ජපානයට පරමාණු බෝම්බ හෙළන ලද්දේ ජපානය සිය යටත් වීම ප්‍රකාශ කළාටත් පසුවය. ඒ නිසා අහිංසක ජපන් ජනතාවට සිය ජීවිතයෙන් වන්දි ගෙවන්නට සිදු විය. පරමාණු බෝම්බයේ අහිතකර ප්‍රතිඵල අදටත් ජපානය තුළ දිස් වේ. තවමත් සමහර ජපන් මවුවරුන්ට උපදින දරුවන් අංගවිකලය. ඊට හේතුව මීට වසර ගණනාවකට ඉහත දී ජපානය මතට හෙළන ලද පරමාණු බෝම්බයේ බලපෑම බව විශේෂඥයෝ පෙන්වා දී ඇත.

සක්‍රිය ජගත් සංවිධානයක් ගොඩනඟා ගැනීමේ අවශ්‍යතාව වඩාත් තදින් ලෝක ප්‍රජාවට මතුවීමට ඉහත කී මානව සංහතියේ බලවත් අනතුරුදායක තත්වයකට පත් කළ සමුළු සාතන පරමාණු අවිය

ද හේතු විය. එවැනි අවි ගැටුම්කින් මුළු මහත් මානව ශිෂ්ටාචාරය ම පෘතුවි තලයෙන් අතුරුදහන් වීමට ද හැකිය, යන මතයක් මානව සමාජය තුළ සාකච්ඡාවට බඳුන් විය. එයට පදනම සකසන ලද්දේ මහා දාර්ශනික බර්ට්‍රන්ඩ් රසල් සාමිවරයා වැනි විද්වතුන්ගේ පුරෝගාමීත්වයෙනි.

ඒ අනුව 1919 දී ඇති කරගත් ජාතීන්ගේ සංගමය, 1945 දී අහෝසි වී සක්‍රීය ජගත් සංවිධානයක් පිහිටුවා ගැනීම සිදු කෙරිණි. ඒ සඳහා ලොව රාජ්‍යයන් 50ක් එක් වුණි. දෙවන ලෝක මහා සංග්‍රාමයෙන් ජයග්‍රහණය කළ මිත්‍ර පාක්ෂික රාජ්‍යයන්ගේ පුරෝගාමීත්වයෙන් සකස් කළ ප්‍රඥප්තිය පාදක කරගෙන මෙම නවතම ජගත් සංවිධානය **"එක්සත් ජාතීන්ගේ සංවිධානය"** නමින් ස්ථාපිත කෙරුණි. එක්සත් ජාතීන්, ලෝක සාමය හා සමාජ ප්‍රගතිය සාක්ෂාත් කර ගැනීම සඳහා ස්වේච්ඡාවෙන් එක් වී සිටින්නා වූ ස්වාධීන රටවල අනන්‍යසම සංවිධානයකි. සාමාජික රටවල් 51ක් සහිත ව 1945 ඔක්තොබර් 24 වනදා එය නිල වශයෙන් උපත ලැබීය. අද එය සාමාජිකත්වය රටවල් 192කි. කිසිදු රටක් එක්සත් ජාතීන් හැරගොස් නැත. කිසිදු රටක් එක්සත් ජාතීන්ගෙන් පළවා හැරීමක් ද කිසිවිටකත් නොවිය. අසල්වැසි මැලේසියාව සමඟ ආරවුලක් නිසා ඉන්දුනීසියාව 1965 දී එක්සත් ජාතීන්ගෙන් තාවකාලික ව ඉවත් වුව ද, ඊට පසු වර්ෂයේදී එක් විය. 2006 ජුනි 26වන දින සාමාජිකත්වය ලැබූ මොන්ට්‍රිනෙග්‍රෝ අවසන් වරට එක් වූ රාජ්‍යයයි.

රටක් වශයෙන් ගත් කල දැනට වසර 30කට ආසන්න කාලයක් ලංකාව ද ත්‍රස්තවාදී යුද්ධයකට මැදී වී සිටියේය. 1980 දශකය ආරම්භ වීමත් සමඟ ම උතුරුකරයේ ප්‍රජාතන්ත්‍රවාදී දේශපාලනය සම්පූර්ණයෙන් ම පාහේ සෝදා පාළුවට ලක් වූ අතර, දෙමළ සන්නද්ධ සංවිධාන ගණනාවක් ම බිහි වී සරු ලෙස වැඩෙන්නට විය. මේ සියලු ත්‍රස්තවාදී සංවිධානවල මූලික තේමාව ඊළම හෙවත් දෙමළ ජනතාව සඳහා වෙන ම රාජ්‍යයක් දිනා ගැනීම විම විශේෂත්වයකි. "හතු පිපෙන්නාක් මෙන් එක වැලට බිහි වූ මෙම දෙමළ ත්‍රස්තවාදී

සංවිධානයන්හි පසුබිම විමර්ශනය කිරීමේ දී පෙනීයන ප්‍රධාන ම කාරණාවක් වන්නේ, දෙමළ ජනතාවගේ දුක්ගැනවිලි මත පදනම් වූ වෙන ම දෙමළ රාජ්‍යය ක්‍රමයක් හෙවත් "ඊළාම්" සංකල්පය ඒවායේ මූලික තේමාව වී තිබුණ ද මතුපිටින් නොපෙනෙන පසුතලයේ විදේශීය බලවේග ක්‍රියාත්මක වූ බවයි. විශේෂයෙන් ම ඒ වන විට ශ්‍රී ලංකා රජය සතු ව පැවති ජාත්‍යන්තර දේශපාලන ප්‍රතිපත්තිය මත ඉන්දීය සාගර කලාපය කෙරෙහි බලපෑ අහිතකර තත්ත්වයන් ගණනාවක් ම උතුරුකරයේ සන්නද්ධ කණ්ඩායම් හරහා ක්‍රියාත්මක වුණු විදේශීය බලවේගන්ට පාදක විය, යන්න අසත්‍යයක් ද නොවේ"(දොඹගහවත්ත, 2009, 99 පිටුව).

ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් ත්‍රස්තවාදය ආරම්භ වන්නේ 1970 දශකයේය. 2005 දෙසැම්බරයේ දී මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා බලයට පැමිණෙන විට ශ්‍රී ලංකාවේ ත්‍රස්තවාදී ක්‍රියා ආරම්භ වී වසර 20කට ආසන්න කාලයක් ගත වී තිබුණි. ජනාධිපතිවරුන් හතර දෙනෙක් ඒ ඒ කාලවලදී පැවති විවිධ දේශපාලන පක්ෂ රජයන් ත්‍රස්තවාදය සමඟ ගැටුණි. ත්‍රස්තවාදය නැති කිරීම උදෙසා වසර ගණනාවක් පුරා නොයෙක් ව්‍යාපාර ගෙන යන ලදී. එහිදී යුද මෙහෙයුම්, සාම සාකච්ඡා හා අන්තර්ජාතික මැදිහත්වීම් සිදුවිය.

මුලින් ම 1987 දී ජනාධිපති ජේ. ආර්. ජයවර්ධන සමයේ ඉන්දු ලංකා ගිවිසුම ලංකාවට ගෙන එන ලදී. 1994 බලයට පත්වන ජනාධිපති චන්ද්‍රිකා බණ්ඩාරනායක "යුද්ධය වෙනුවට ජනවාර්ගික අර්බුදයට දේශපාලන විසඳුමක්" යන්න ආකර්ෂණීය සටන් පාඨයක් බවට පත් කර ගනිමින්, 1994 ඔක්තෝබර් මාසයේ දී ආණ්ඩුව හා කොටි සංවිධානය අතර පළමු සාකච්ඡා වටය ඇරඹුණි. සාකච්ඡා දිගින් දිගට ම පවත්වාගෙන ගියත් යුද්ධයට විසඳුමක් ලබා දීමට චන්ද්‍රිකා බණ්ඩාරනායකට නොහැකි විය. ඉන් අනතුරු ව බලයට පත්වන යු. එන්. පී. ආණ්ඩුව 2002 පෙබරවාරි 22 දින සටන් විරාම ගිවිසුමට අත්සන් කරන ලදී. සටන් විරාම ගිවිසුමක් අත්සන් කර රට තුළ සාමකාමී වටපිටාවක් නිර්මාණය කිරීමට පදනම සැකසුවත්, අනිත්

පැත්තෙන් එම සාමකාමී වටපිටාව නැවත යුද පිටියක් බවට පත් කරන ලදී. ජනාධිපති මහින්ද රාජපක්ෂ බලයට පත්වීමත් සමඟ කරගෙන යන ලද අවසන් මෙහෙයුම හරහා 2009 මැයි 18 වනදා රාත්‍රියේ එල්ල කරන ලද ප්‍රහාරයෙන් ලොව හෙල්ලූ වේළුපිල්ලේ ප්‍රභාකරන් මිය ගියේය. එම යුද්ධය අවසන් වූයේ ශ්‍රී ලංකාද්වීපය මහා ලේ ගංගාවක් බවට පත් කරමිනි. එම ලේ ගංගාවට මැදි ව ශ්‍රී ලංකා පොලිසිය ද ඇතුළු ත්‍රිවිධ හමුදා භටයන් 30,000කට අධික සංඛ්‍යාවකට ජීවිත අහිමි විය. කොටි සාමාජිකයන් ද 80,000කට ආසන්න ව ඝාතනය විය. ඉන්දීය හමුදා භටයන් 1,255ක් ද සාමාන්‍ය වැසියන් 30,000කට අධික පිරිසක් ද මෙම කුරිරු යුද්ධය වෙනුවෙන් ජීවිත පූජා කළහ.

මහ ජනතාව වෙත තොරතුරු ගෙන යාම සඳහා බහුවිධ මාධ්‍ය ජාලයක් පවතී. ඒ අතුරින් අන්තර්ජාලය, රූපවාහිනිය, ගුවන් විදුලිය, පුවත්පත ප්‍රමුඛස්ථානයක් ගනී. ශ්‍රී ලංකාව යනු දියුණු වෙමින් පවතින තුන්වන ලෝකයේ රටකි. එබැවින් විවිධ ආර්ථික ශක්‍යතාවන්ගෙන් පිරි ජනතාවක් ශ්‍රී ලංකාව තුළ ජීවත් වෙයි. මේ නිසා සෑම පුද්ගලයෙකු අතර ම තොරතුරු හුවමාරු වන්නට නම් ජනමාධ්‍ය විසින් ම එය හඳුනාගත යුතු වේ. බොහෝ විට නොයෙකුත් මාධ්‍ය හරහා සංදේශයන් ජනතාගත නොවීමට මාධ්‍යය ජනතාව අතරට සමීප වී නොතිබීම ප්‍රබල හේතුවත් ලෙස දැකගත හැකි ය. එසේ ම දැනුවත්කමක් නොමැතිකමද, ආර්ථිකමය අපහසුතාව, කාලයන්ගේ සීමාන්තර කත්ත්වය ද, මාධ්‍යය ජනතාගත නොවීමේ ප්‍රමුඛ වූ කාරණා ලෙස පෙනෙන්නට ඇත. මේ නිසා රටට ජාතියට වැදගත් මෙන් ම ජනතාව දැනුවත් විය යුතු තොරතුරු පිළිබඳ ව නිවැරදි හා සත්‍ය මතවාදයන් සමාජ ගත විය යුත්තකි. එය ජනමාධ්‍යයේ ප්‍රධානතම සහ වැදගත් කාර්ය භාර්යයකි.

ජනමාධ්‍යය යනු තොරතුරු මත රදා පවතින්නා වූ වපසරියක ගොඩනැඟෙන්නා වූ ව්‍යුහාත්මක පද්ධතියකි. එහි දී මාධය තුළින් ඉදිරිපත් කෙරෙන තොරතුරු රැස් කිරීමේ දී ඒවා බෙදා හැරීමේ දී ඉතා විශ්වසනීය අයුරින් හා වගකීමෙන් යුක්ත ව කටයුතු කිරීමට ජනමාධ්‍ය

බැඳී සිටී. මෙහිදී තොරතුරු වාර්තාකරණය පිළිබඳ තුලනාත්මක විග්‍රහයන් සිදු කිරීමේදී යුදමය තොරතුරු පිළිබඳ ව දැනගැනීමට ඒ පිළබඳව විමසිලිමත් වීමටත් නිරන්තර කුතුහලයකින් මහජනතාව පෙළෙන අතර ම ඔවුන් කරා තොරතුරු ගෙන යාමේදී ජනමාධ්‍යය අතිවිශාල කාර්ය භාර්යයක් සිදු කරනු ලැබේ.

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් 17 වන සැසි වාරය 2011 මැයි මස 30 වනදා ආරම්භ වීමත් සමඟම බ්‍රිතාන්‍ය, ප්‍රංශ හා ස්විස් කොටි ක්‍රියාකාරිහු ශ්‍රී ලංකාවට යුද අපරාධ සනාථ කිරීමේ මෙහෙයුමක් දියත් කළහ. එක්සත් ජාතීන්ගේ මහ ලේකම් බෑන් කි මූන් විසින් ශ්‍රී ලංකාවේ යුද අපරාධ සිදු වී ඇත්දැයි සොයා බැලීම සඳහා ත්‍රි පුද්ගල කමිටුවක් පත් කර ඇත. "මෙම කමිටුවේ සභාපති ධුරය දරන්නේ ඉන්දුනීසියාවේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු මෙන් ම නීතිපති ධුරය හෙබවූ මර්සුකි දරුස්මාන්ය. කමිටුවේ දෙවන සාමාජිකාව වන්නේ දකුණු අප්‍රිකානු ජාතික යස්ඕන් සුකාය. කමිටුවේ තෙවන සාමාජිකාව වන්නේ ඇමරිකානු ජාතික නීතිය පිළිබඳ මහාචාර්යවරයෙකු වන ස්ටීවන් රැට්නර්ය" (ලංකාදීප, 2011.04.28, 11 පිටුව)

ඒ අනුව දරුස්මාන් වාර්තාව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහ ලේකම් බෑන් කි මූන් විසින් 2011 අප්‍රේල් 26 වන දින මාධ්‍යය වෙතට ඉදිරිපත් කරන ලදි. දරුස්මාන් වාර්තාව හරහා ශ්‍රී ලංකාවට විරුද්ධ ව ඉදිරිපත් කර ඇති මෙම චෝදනා තවමත් ව්‍යාජ්ත කරගෙන යමින් සිටී. එහි දී දෙමළ ඩයස්පෝරාවට සියලු තොරතුරු සැපයෙන්නේ මේ හරහාය. ඒ අනුව ශ්‍රී ලංකාවේ යුද අපරාධ සිදු වූ බවට එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ඉදිරිපත් කෙරෙන ජාත්‍යන්තර මතවාද මාධ්‍යය තුළින් වාර්තා කරන්නේ කෙසේද? යන්න අධ්‍යයනය කිරීම මෙහි දී සිදු කරනු ලැබේ. එහි දී ලාංකීය මුද්‍රිත මාධ්‍යය දරුස්මාන් වාර්තාවට විරුද්ධ ව කටයුතු කරන ආකාරය පුළුල් ලෙස අධ්‍යයනය කරනු ලැබේ.

ශ්‍රී ලංකාවට ජාත්‍යන්තරය විසින් යුද අපරාධ සිදු කළ බවට චෝදනා එල්ලවන කාල පරිච්ඡේදයක දී බහුවිධ මාධ්‍යය ඉතාමත් ම ප්‍රබල ව තම කාර්ය භාර්යය ඉටුකළ යුතුය. ඒ හරහා විද්‍යුත් මාධ්‍යය මෙන් ම මුද්‍රිත මාධ්‍ය ද තම ආයතනයේ ප්‍රතිරූපය ඉන් ගොඩනඟා ගැනීමට කටයුතු කරන ආකාරය පැහැදිලි ව දැකගත හැකිය. විශේෂයෙන් ම මුද්‍රිත මාධ්‍යය ගත් කල අතිශය ප්‍රබල වගකීමක් ඔවුන් විසින් ඉටුකරනු ලැබේ. මෙහි දී ආණ්ඩුවට පක්ෂපාතී ව මෙන්ම අපක්ෂපාතී අයුරින් ද තොරතුරු ඉදිරිපත් කරමින් තම මාධ්‍ය ප්‍රතිරූපය පාඨකයා අතරට ගෙනයනු ලැබේ. මෙහිදී මාධ්‍යය වගකීම කෙසේ හෝ ඉටු කරමින් මාධ්‍යය හරහා ජනතාව දැනුවත් කිරීමට උත්සාහ ගත් බව නම් සැබෑය. එම උත්සාහය පිළිබඳ ගැඹුරු විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් මෙම ග්‍රන්ථය ඔස්සේ සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකාව තුළ වසර 30කට ආසන්න කාලයක් පුරා පැවති යුද්ධය 2009 මැයි මස නිමාවට පත් විය. එහෙත් යුද්ධයේ අවසාන කාල පරිච්ඡේදයේ දී යුද අපරාධ සිදු වී ඇති බවට එක්සත් ජාතීන්ගේ සංගමයේ මහ ලේකම් ගේ උපදේශන කමිටුව ප්‍රකාශ කරයි. ඒ අනුව කමිටු වාර්තාව 2011 අප්‍රේල් 26 වන දින ඉදිරිපත් කොට ඇත. එහෙත් ලංකා ආණ්ඩුව ප්‍රකාශ කරනු ලබන්නේ එය සිවිල් අනතුරු රහිත කිරීමේ ප්‍රතිපත්තිය මත ගෙන ගිය මානුෂීය මුදාගැනීමේ මෙහෙයුමක් බවයි.

මෙකී "දරුස්මාන් වාර්තාව" ජාතික වශයෙන් පමණක් නොව ජාත්‍යන්තර වශයෙන් පවා විවාදාත්මක ව සාකච්ඡාවට බඳුන් වූ මාතෘකාවකි. සැබවින් ම ලංකාවේ යුද අපරාධ සිදු වී ඇත්ද? දරුස්මාන් වාර්තාවේ සඳහන් වන දෑ සැබෑ ලෙස පිළිගත හැකිද? එහි දී එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ක්‍රියා කලාපයන් මොනවාද?යන්න විමසා බැලීම ඉතා වටී.

මූලික වශයෙන් සලකා බලන විට මෙම චෝදනාව, ලංකාවේ ජාතික ආරක්ෂාවට විශාල තර්ජනයක් වන්නේය. මන්ද සැබෑ ලෙසට

ලංකාවේ යුද අපරාධ සිදු වූ බවට ඔප්පු වුවහොත්, එය බරපතල ගැටලුවකට මාවත් විවර කරන්නක් බැවිනි. එබැවින් ලංකාවේ යුද අපරාධ සිදු වී ඇති බවට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ මහලේකම්ගේ උපදේශන කමිටුව විසින් ජාත්‍යන්තර මතවාද ස්ථාපිත කිරීම උදෙසා ලාංකීය පුවත්පත් මාධ්‍යය වාර්තාකරණය පිළිබඳ ව අධ්‍යයනය කිරීම ඉතාමත් කාලෝචිත වන්නේය.

නූතන ලෝකය බෙහෙවින් ම සංකීර්ණත්වයට පත් වී ඇති බව පෙනී යන්නේ පළමුවන හා දෙවන ලෝක යුද්ධයන්ට අනතුරු ව සිදු වූ වෙනස්කම් කරණකොට ගෙනය. "ලෝක මහා සංග්‍රාමයන් විසින් අත්කර දුන් විනාශයන් ඒ හා අත්වැල් බැඳගත් විද්‍යා තාක්ෂණ සන්නිවේදන පරිවහන හා කාර්මීකරණාදියේ දියුණුවන් විසින් අප ජීවත්වන ලෝකය වඩ වඩාත් කුඩා කර ඇත" (කරුණාදාස, 2004, 01 පිටුව).

මෙය හේතු කොට ගෙන සමස්ත ලෝකය ම විශ්ව ගම්මානයක් බවට පත් කර ඇත. මෙම විශ්ව ගම්මාන සංකල්පය තුළ ලෝකයේ කවර අවස්ථාවක දී හෝ කවර ස්ථානයක දී සිදුවන ඕනෑ ම සිදුවීමක් සෙසු ග්‍රාහකයාට දැන ගැනීමට ගත වන්නේ නිමේෂයකි. මේ ආකාරයට ලෝකය පුරා සිදුවන ඕනෑ ම ක්‍රියාකාරකමක් විසින් බලපෑම් කරනු ලබන්නේ මානව ප්‍රජාව වෙතටයි. "මානව සංහතිය පමණක් නොව ස්වභාවධර්මය විසින් නිර්මිත පාරිසරික පද්ධතියක් ජාත්‍යන්තර ලෝකයේ සිදුවන බලපෑම්වලට යටත්ය"(කරුණාදාස, 2004, 01 පිටුව).

ඒ අනුව නූතනයේ මනුෂ්‍ය ප්‍රජාව මෙන් ම ස්වභාවධර්මය ද පැවැත්ම පිළිබඳ අභියෝගයට නිරන්තරයෙන් මුහුණ දෙයි.

වර්තමාන ලෝකයේ පවතින්නා වූ සංකීර්ණත්වය තේරුම් ගත හැක්කේ මෙම පැවැත්ම පිළිබඳ ව පවතින්නා වූ ගැටලුව ඇසුරින්ය. මෙම පැවැත්ම පිළිබඳව පවතින්නා වූ ගැටලුව නූතන ලෝකයට පමණක් ආවේණික වූවක් නොව, එය මානව ඉතිහාසයේ ආරම්භය දක්වා දිවයන්නකි. ස්වභාව ධර්මයේ පීඩාවන්ට ගොදුරු වෙමින් ඒවා

ජය ගන්නට උත්සාහ කරන දා සිට මානව වර්ගයා, පැවැත්ම පිළිබඳ අරගලයක යෙදේ. එය අතීතයට වඩා අනාගතයේ දී සිදුවන ආකාරයේ වෙනසක් දැකිය නොහැකිය. වෙනසක් පවතින්නේ, පැවැත්ම සඳහා කරන් අරගලයේ ස්වභාවය, ප්‍රමාණය හා පාත්‍රයන්ගේ භූමිකා පිළිබඳ වෙනස පමණි. එහි කේන්ද්‍රීය සාධකයක් වී ඇත්තේ සාම්ප්‍රදායික ව යුද්ධයට තිබූ ප්‍රමුඛතාව වෙනුවට සාමකාමී සහජීවනයක් නැතහොත් සහයෝගිතාවය නූතන ලෝකයේ ප්‍රමුඛත්වයට පත්වීමයි. එහිලා බලපාන ප්‍රධාන හේතු කාරකය වන්නේ නූතන ජාත්‍යන්තර ලෝකය අන් කවරදාටත් වඩා අන්‍යොන්‍ය සබඳතාවක් මත රැඳී ඇති හෙයිනි.

රටක ජාතික සීමාවෙන් ඔබ්බෙහි පිහිටන්නා වූ විවිධ ක්‍රියාකාරකම් එක් රටක් විසින් හෝ රටවල් කිහිපයක් විසින් පාලනය කිරීම ඉතා අසීරු කරුණක් වේ. එහි දී යුද්ධයට හිමිවන්නේ සුවිශේෂී ස්ථානයකි. යුද්ධය ඇතිවීම වැළැක්වීම ඉතාමත් අසීරු කරුණක් වන්නා සේ ම සාමය පවත්වා ගෙන යෑම ද ඉතාමත් අසීරු වේ. ඒ මන්ද කිවහොත් යුද්ධයට හා සාමයට අදාළ වන්නාවූ ජාත්‍යන්තර බලවේග ලෝක පර්යාය (world oder) තුළ නිරන්තරයෙන් දක්නට ලැබීමයි. ජාත්‍යන්තර ලෝකයේ හසුවන්නා වූ බලවේගයන් හඳුනාගැනීම හා තේරුම් ගැනීම වර්තමාන ලෝක ප්‍රජාවගේ මූලික අරමුණක් වී ඇත.

රාජ්‍යයන්ගේ සුවිශේෂී කරුණු සම්බන්ධයෙන් ජාත්‍යන්තර සහයෝගයක් ඇතිකර ගැනීම සඳහා ඇරඹුණු ප්‍රථම ජාත්‍යන්තර ආයතනය වන්නේ **ජාත්‍යන්තර සන්නිවේදන සංගමයයි**. පළමුවන ලෝක සංග්‍රාමයෙන් පසු ව ලොව ජාතීන් ගණනාවක් එක් ව **ජාතීන්ගේ සංගමය** නැමති ජගත් ආයතනයක් 1919 දී ප්‍රථමයෙන් ගොඩනඟා ගත්තේය. නමුත් ඉන් අපේක්ෂා කළ ආකාරයට, ලෝක සාමය පවත්වාගෙන යාමට සමත් වූයේ 1919-1938 දක්වා පමණි. නමුත් 1945 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවා ගැනීමත් සමඟ ම ජාත්‍යන්තරය සමඟ ගනුදෙනු කිරීම ඉතාමත් සංකීර්ණ කටයුත්තක් බවට පත්විය. එයට මූලික හේතුව ගෝලීය සමාජයක හුදෙකලාව

ජීවත්වීමට තිබෙන අපහසුකම රාජ්‍යයක් වශයෙන් දරාගත නොහැකි වීමයි. එහිදී රටවල් 192ක සම්මුතියකින් සැදුම්ලත් එක්සත් ජාතීන්ගේ සංවිධානය දරන මතය රටකට ඉතාමත් තීරණාත්මක සාධකයක් වේ. එවැනි සංවිධානයක් දරන මතය සමස්ත ජාත්‍යන්තරයේ ම මතය වීමට පුළුවන. එවැනි අවස්ථාවක තනි රාජ්‍යයක් වශයෙන් එම මතයට එරෙහි වීම ඉතාමත් පුළුල්, සංකීර්ණ කාරණාවක් වේ. වර්තමානයේ ලංකාව මුහුණ පා ඇත්තේ එවැනි ඉරණමකටය. එනම් ලංකාවේ යුද අපරාධ සිදු වූ බවට එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත මතවාදයක් ගෙන ගොස් ඇත. ඒ පිළිබඳ ව විමසා බැලීම සඳහා එක්සත් ජාතීන්ගේ සංගමයේ මහලේකම්වරයා කමිටුවක් පත් කොට ඇත. එම කමිටුව අදාළ කාරණාව සම්බන්ධයෙන් විමසා බලා වාර්තාවක් ඉදිරිපත් කොට ඇත. ඒ අනුව ලංකාවේ දී යුද අපරාධ සිදු වූ බවට එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ගොඩනගන ජාත්‍යන්තර මතවාද නමුත් යුද අපරාධ පිළිබඳව දැන සිටීම වැදගත් කාරණාවක් වේ.

02

එක්සත් ජාතීන්ගේ සංවිධානය හා යුධ අපරාධ හැඳින්වීම.

ඉතිහාසය පුරා යුද්ධය නිසා සදාචාරය පිළිබඳ ප්‍රශ්න කිහිපයක් පැන නැඟිණි. එයින් යුද අපරාධවලට හිමි වන්නේ සුවිශේෂ ස්ථානයකි. ආදි කාලීන රාජ්‍යයන් හා වර්තමාන රාජ්‍යයන් කිහිපයක් ද යුද්ධය උත්තම ක්‍රියාවක් ලෙස දුටුව ද අතීතයේ සිට වර්තමානයට පැමිණෙන විට යුද අපරාධ ක්‍රමයෙන් වැඩි වී ඇත. අන්තර්ජාතික මානව හිතවාදී නීතිය යුද්ධය පිළිබඳ රෙගුලාසින් හඳුනාගෙන ඇත. ජිනීවා සම්මේලන තුළින් ද අවි ආයුධ භාවිතයත්, යුද සිරකරුවන්ට දක්වන සැලකිල්ල පිළිබඳවත් රෙගුලාසීන් ගොඩනැඟී තිබේ. මෙම නීතීන් කඩකරනා අවස්ථා යුද අපරාධ තිබූ න්‍යුරෙම්බර්ග් ට්‍රයල්ස්වලින් (Nuremberg Trials) අන්තර්ජාතික සමාජය මෙවැනි අවස්ථා සඳහා අධිකරණ නීතිය ගොඩනඟා ඇත.

02.1 එක්සත් ජාතීන්ගේ සංවිධානය.

02.1.1 එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහිවීම හා එහි ව්‍යුහය.

එක්සත් ජාතීන්ගේ සංවිධානය වර්තමානය වන විට ජාතීන් 192කින්, පෘථිවිය මත සෑම රාජ්‍යයකින් ම පාහේ, සැදුම්ලත් ජාත්‍යන්තර සංවිධානයකි. මේ ජාතීහු, සංවිධානයේ ප්‍රඥාප්තියේ අන්තර්ගත මූලධර්ම හා පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා සහයෝගයෙන් වැඩ කිරීමට නීතියෙන්ම කැප වී සිටිති. යුද්ධය පිටු දැකීම, මානව අයිතිවාසිකම් ප්‍රවර්ධනය, සාධාරණත්වය හා අන්තර්ජාතික නීතිය කෙරෙහි ගෞරවය පවත්වා ගැනීම හා සමාජ ප්‍රගතිය සහ ජාතීන් අතර සුහද මිත්‍ර සම්බන්ධතා වර්ධනය සඳහා කැපවීමත් මේ අරමුණු කරා ළඟාවීම පිණිස ස්වකීය ක්‍රියාවන් එකට ගැළපීමේ මධ්‍යස්ථානයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවිධානය කටයුතු කරනු ලැබේ.

එක්සත් ජාතීන්ගේ සංවිධානය සඳහා අත්තිවාරම සැකසෙන්නේ දෙවන ලෝක යුද්ධය පවතින අවධියේය. "දැනට අතු පතර දහස විහිදෙමින් ශීඝ්‍ර ව වැඩෙන එක්සත් ජාතීන්ගේ සංවිධානය නැමැති මහා වෘක්ෂයේ බීජය රෝපණය කළෝ එකල ඇමරිකානු එක්සත් ජනපදයේ ජනාධිපති ධුර දරූ ෆ්‍රෑන්ක්ලීන් ඩී. රූස්වෙල්ට් හා බ්‍රිතාන්‍ය අග්‍රාමාත්‍යවරයා ව සිටි වින්සටන් චර්චිල්ය. යුද්ධයේ විනාශකාරිත්වයෙන් තැති ගැනුණු ඔවුන් විසින් අත්ලාන්තික් සාගරය මැද මහ යුද නැවක දී හමුව කරන ලද සාකච්ඡාවකින් පසු ව බලය නොමෙහෙයවා ජාතීන් අතර සාමය රැකිය යුතු පිළිවෙළ පිළිබඳ ව 1941 අගෝස්තු 14 වැනි දින කරන ලද එක්සත් නිවේදනය, ඒ බීජයයි. අත්ලාන්තික් ශාසන පත්‍රය (charter) යනුවෙන් හැඳින්වෙන්නේ ඒ ප්‍රසිද්ධ ප්‍රකාශනයයි" (ජයතිලක, 1975, 01 පිටුව).

1942 ජනවාරි 01 වන දින ජාතීන් 26ක් විසින් කරන ලද නිවේදනය එක්සත් ජාතීන්ගේ සංවිධානය බිහිකිරීමේ තවත් පියවරක් ඉදිරියට යෑමක් ලෙස සැලකිය හැකිය. මෙම නිවේදනය ප්‍රකාශයට පත්වන්නේ දෙවන ලෝක යුද්ධය පවතින යුගයේ දී මය. එකල

බ්‍රිතාන්‍යය ප්‍රමුඛ මිත්‍ර පක්ෂයටත් ජර්මනිය ප්‍රමුඛ විරුද්ධ පක්ෂයටත් වුවමනා කරන ලද්දේ, කෙසේ හෝ යුද්ධය ජය ගැනීමයි. ඒ අනුව ඇමරිකා එක්සත් ජනපද රාජ්‍යයේ වොෂින්ටන් නගරයට එක් වූ මිතුරු පාර්ශ්වයේ රාජ්‍යයෝ අත්ලාන්තික් ප්‍රකාශනයේ ප්‍රතිපත්තිවලට අනුකූලතාව දැක්වීමටත්, දෙවන ලෝක යුද්ධය ජයගැනීම පිණිස සහයෝගයෙන් කටයුතු කිරීමටත්, ගිවිසුම් දෙමින් ප්‍රකාශනයක් නිකුත් කළහ. එම ප්‍රකාශනයේ ප්‍රධාන පරමාර්ථය වූයේ, යුද්ධය ජය ගැනීම වුවද, යුද්ධයෙන් පසු ව සාමය රැක ගැනීමට ඇතිකරගත වූ එක්සත්කමට එය මුල් නොවූ බව කිව හැකිය. ''ඇමරිකා එක්සත් ජනපද රාජ්‍යය, මහා බ්‍රිතාන්‍යය, සෝවියට් රුසියාව යන රාජ්‍යයන්හි විදේශ අමාත්‍යවරුන් හා චීනය වෙනුවෙන් සෝවියට් රාජ්‍යයේ පෙනී සිටි චීන තානාපතිවරයාත් මොස්කව් නුවර දී හමුව ලොකු කුඩා හැම නිදහස් රාජ්‍යයකටම සම්බන්ධ වී එකිනෙක රාජ්‍යයන්ගේ නිදහස හා සමානත්වය රැක ගනිමින් ලෝක සාමය හා ආරක්ෂාව සඳහා ක්‍රියාකළ හැකි අන්තර්ජාතික සංවිධානයක් බිහිකිරීමේ අවශ්‍යතාව පිළිගනිමින්, 1943 ඔක්තොම්බර් 30 ප්‍රකාශනයක් නිකුත් කළහ'' (ජයතිලක, 1975, 01 පිටුව).

ඒ මොස්කව් ප්‍රකාශනයෙන්, පිහිටු වන්නට අදහස් කළ අන්තර්ජාතික සංවිධානය සඳහා කටයුතු පිළියෙල කිරීමට චීන, රුසියා, ඇමරිකා එක්සත් ජනපදය හා බ්‍රිතාන්‍යයට අයත් නියෝජිතයෝ වොෂින්ටන් නුවර "ඩර්බාර්ටන් ඕක්ස්" නම් ස්ථානයට රැස් වූහ. 1944 අගොස්තු 21 වන දින සිට ඔක්තොම්බර් 01 වන දින දක්වා රැස්වුණු නියෝජිතයෝ කණ්ඩායම් දෙකකට බෙදී එක්සත් ජාතීන්ගේ සංවිධානය පිහිටුවීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සාකච්ඡා කර ඒ සාකච්ඡාවන්ගේ ප්‍රතිඵල ඔක්තොම්බර් 06 වන දින ප්‍රසිද්ධ කළහ. අන්තර් ජාතික සංවිධානය පිහිටුවීම පිළිබඳ මූලික යෝජනාවලිය ඇතුළත් ඒ නිවේදනය ''ඩර්බාර්ටන් ඕක්ස්'' යනුවෙන් හැදින්වෙයි.

ඉන් පසුව සිදු වූයේ එකල මහ තිදෙනාගේ හමුවකි. එකල මහ තිදෙනා වූ ජනාධිපති රූස්වෙල්ට්, අග්‍රාමාත්‍ය චර්චිල් හා මාර්ෂල් ස්ටාලින් 1945 පෙබරවාරි 04 සිට 11 අතර දිනවල ක්‍රිමියාවේ යොල්ටා

නම් ස්ථානයේ දී හමුව එක්සත් ජාතීන්ගේ ශාසන පත්‍රය පිළියෙල කිරීමට ස්ථානයකුත් දිනයකුත් තීරණය කර ගත්හ.

යොල්ටා ගිවිසුමේ ප්‍රතිඵලය වූයේ ජාතීන් 50කට අයත් නියෝජිතයන් රාශියක් අන්තර්ජාතික සංවිධානය පිහිටුවීම සඳහා 1945 අප්‍රේල් 25 වන දින සිට 26 වන දින දක්වා ඇමරිකාවේ සන් ප්‍රැන්සිස්කෝ නුවර රැස්වීමය. 1945 ජූනි 26 වන දින ලෝක ඉතිහාසයේ රන් අකුරෙන් ලියැවිය යුතු දිනයකි. සන් ප්‍රැන්සිස්කෝ සම්මේලනයේ දී විවාදයට ලක් කොට ස්ථිර කරගන්නා ලද අන්තර් ජාතික ශාසන පත්‍රයට (charter) ජාතීන් 50ට අයත් නියෝජිතයන් විසින් අත්සන් තබන ලද්දේ එදිනය. එහෙත් එක්සත් ජාතීන්ගේ සංවිධානය නීත්‍යානුකූල ලෙස ජනිත වූයේ එදින නොවේ. චීනය, සෝවියට් රුසියාව, ඇමරිකා එක්සත් ජනපදය හා මහා බ්‍රිතාන්‍ය ඇතුළු ශාසන පත්‍රයට අත්සන් තැබූ නියෝජිතයින් අයත් ආණ්ඩුවලින් වැඩි කොටසක් ශාසන පත්‍රය අනුමත කළ පසු 1945 ඔක්තෝම්බර් 24 වන දින එක්සත් ජාතීන්ගේ සංවිධානය නීත්‍යානුකූල ලෙස පිහිටුවන ලදී. 1947 ඔක්තෝම්බර් 31 වන දා එක්සත් ජාතීන්ගේ මහ සභාව, ඔක්තෝම්බර් 24 වන දිනය එක්සත් ජාතීන්ගේ දිනය ලෙස පිළිගැනීමට තීරණය කළේය. අවුරුද්දක් පාසා ලෝකයේ හැම රටක ම ඔක්තෝම්බර් 24 වන දින එක්සත් ජාතීන්ගේ ජන්ම දිනය උත්සවාකාරයෙන් පවත්වන අතර දහස් සංඛ්‍යාත ජනකායක් අතීතය සිහිකර උණු කඳුළු පෙරමින් අනාගතය පිළිබඳව මහත් බලාපොරොත්තුවකින් කල් ගෙවති. ''එක්සත් ජාතීන්ගේ කාර්යය සංවිධායක කොමිසන් සභාව (Preparatory Commission) 1945 නොවැම්බර් 24 වන දින සිට දෙසැම්බර් 23 දින දක්වා ලන්ඩන් නුවර රැස් කරන ලද කටයුතුවල ප්‍රතිඵලයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ මහ සභාව 1946 ජනවාරි 10 වන දින ලන්ඩන් නුවර පළමු වරට රැස් වී ඉතිහාස ගත විය. බෙල්ජියම් ජාතික පෝල් හෙන්රි ස්පාක් මහතාට එක්සත් ජාතීන්ගේ මහ සභාවේ පළමු වන සභාපති වීමේ ගෞරවය හිමි විය. පෙබරවාරි 14 වන දින දක්වා පැවැති ඒ මංගල සභාවේ දී කරගත් තීරණයක් අනුව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආරක්ෂක මණ්ඩලයේ පළමු වන රැස්වීම ද ලන්ඩන් නුවර ජනවාරි 17 වන දා සිදු විය. පෙබරවාරි 01 වන දින නෝර්වේ ට්‍රයිගිලී,

එක්සත් ජාතීන්ගේ මහ සංවිධානයේ මහ ලේකම් වශයෙන් පත් විය. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තාවකාලික මධ්‍යස්ථානය වශයෙන් ඇමරිකාවේ නිව්යෝර්ක් නුවර තෝරා ගත් ඒ ඓතිහාසික මහ සභාව පෙබරවාරි 14 වන දින විසිර ගියේය'' (ජයතිලක, 1975, 05 පිටුව).

එක්සත් ජාතීන්ගේ මූලස්ථානය එක්සත් ජනපදයේ ඉදි කළ යුතු බව මුල්වරට 1946 දී ලන්ඩනයෙහි රැස් වූ මහා මණ්ඩලය තීරණය කළ නමුදු සුදුසු භූමි භාගයක් සෙවීමට පත් කෙරුණු කමිටුවේ පළමු තේරීම වූයේ, නව්යෝර්ක් නගරය නොවේ. පිලඩෙල්පියා, බොස්ටන්, සැන් ප්‍රැන්සිස්කෝ වැනි නගර, කමිටුවේ සැලකිල්ලට ලක් විය. නිව්යෝර්ක් නගරය තෝරාගත් පසු කමිටුවේ අවධානයට යොමු වූයේ නගරයේ උතුරු දිග ස්ථාන සමහරකි. වත්මන් භූමි භාගය තෝරා ගැනීමට ඔවුන් පෙලඹ වූ සාධකය වූයේ පළමු වන පටුමඟේ භූමි භාගය මිලයට ගැනීම සඳහා ජෝන් ඩී. රොක ෆෙලර් අවසන් මොහොතේ පිරි නැමූ ඩොලර් 85 ලක්ෂයක මුදල් ත්‍යාගයයි.

එක්සත් ජාතීන්ගේ මූලස්ථානය සඳහා තෝරාගත් භූමිභාගය මස් මඩු, ලුණු කර්මාන්ත සහ දුම්රිය මාර්ග ගරාජයක් පිහිටි එකක් විය. එක් පසෙකින් පළමු වන පටුමඟ ඔස්සේ ට්‍රක් රථ ඉහළ පහළ ගමන් කළ අතර ෆ්‍රෑන්ක්ලින් ඩී රූස්වෙල්ට් නම් එෆ්. ඩී. ආර් මාවත යනුවෙන් පසු කලෙක නම් කෙරුණු නැගෙනහිර ගඟ බඩ මාවත ඔස්සේ මෝටර් රථ ධාවනය වූයේය. අහසට නැගුණු එක්සත් ජාතීන්ගේ ලේකම් කාර්යාල ගොඩනැගිල්ලත් සමඟ භූමිභාගයේ දර්ශනය මුළුමනින් ම වෙනස් වී ඇත.''ආරම්භයේ දී සැලසුම්කරුවනට අවශ්‍ය වූයේ ඩොලර් කෝටි පනස් ලක්ෂයක වියදමින් මහල් 45ක මන්දිරයක් තැනීමට වුව ද මහ ලේකම් ට්‍රිග්වේ ලීගේ නියමය අනුව වියදමට ඩොලර් දෙකෝටියකින් ද මහල් සංඛ්‍යාව 39 දක්වා ද අඩු කරන ලැබිය. එක්සත් ජනපද ආණ්ඩුව ඉදි කිරීමේ වියදම සඳහා ඩොලර් හයකෝටි පනස් ලක්ෂයක පොලී රහිත ණයක් ප්‍රදානය කොට ඇත''(එක්සත් ජාතීන්ගේ සංවිධානය, 2009, 06 පිටුව).

එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය පිළිගන්නා වූ ද ඉන් පැවරෙන වගකීම අනුව ක්‍රියා කිරීමට කැමති හා සමත් බවට සංවිධානය නිගමනය කරන්නා වූ ද, සාමකාමී සියලු ජාතීන්ට එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකත්වය විවෘත ව පවතී. ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශය මත මහා මණ්ඩලය විසින් සාමාජිකත්වය ප්‍රදානය කෙරෙයි. ප්‍රඥප්තියේ එන මූලධර්ම උල්ලංඝනය කිරීම නිසා, යම් රටක සාමාජිකත්වය අත්හිටුවීම හෝ එරට නෙරපා දැමීම හෝ සඳහා වන බලතල ප්‍රඥප්තියේ දැක්වෙන නමුදු මෙතෙක් එවැනි පියවරක් ගෙන නැත.

එක්සත් ජාතීන්ගේ ක්‍රියාකාරකම් ලොව පුරාම පාහේ පැතිර පවතින අතර ඒවා සිදු කෙරෙනුයේ ආයතන හයක් මගිනි. එනම්,

I. මහා මණ්ඩලය.
II. ආරක්ෂක මණ්ඩලය.
III. ආර්ථික හා සාමාජීය මණ්ඩලය.
IV. භාරකාර මණ්ඩලය.
V. අන්තර් ජාතික අධිකරණය.
VI. ලේකම් කාර්යාලය.

2.1.2 මහා මණ්ඩලය.

"නෙදර්ලන්තයේ හේග් නුවර පිහිටි අන්තර්ජාතික අධිකරණය හැර සෙසු ආයතන සියල්ල නිව්යෝර්ක් නුවර එක්සත් ජාතීන්ගේ මූලස්ථානය නිවහන කොට ඇත. විශේෂිත ආයතන නමින් හැඳින්වෙන තවත් සංවිධාන 15ක් එක්සත් ජාතීන් හා සම්බන්ධ ව පවතී. ඒවා සෞඛ්‍යය, කෘෂිකර්මය, විදුලි සංදේශ සේවා සහ කාලගුණය වැනි එකිනෙකින් බොහෝ සෙයින් වෙනස් වූ විවිධ ක්ෂේත්‍රවල

ක්‍රියාත්මක ව සිටී. මේ හැර සුවිශේෂ ක්ෂේත්‍රවල වගකීම් භාර වැඩසටහන්, අරමුදල් සහ විශේෂ මණ්ඩල 24ක් තිබේ. එක්සත් ජාතීන් සහ මෙකී මණ්ඩල, විශේෂිත ආයතන සහ වැඩසටහන් එක් වූ විට එක්සත් ජාතීන්ගේ පද්ධතිය නැතහොත් එක්සත් ජාතින්ගේ පවුල නිර්මාණය වෙයි'' (එක්සත් ජාතින්ගේ සංවිධානය, 2009, 07 පිටුව).

මහා මණ්ඩලය ප්‍රධාන සාකච්ඡා මණ්ඩපයයි. සියලු සාමාජික රටවල නියෝජිතයන් එක්ව එය සැදී ඇත. එක් සාමාජිකයෙකුට එක් ඡන්දයකි. සාමය හා ආරක්ෂාව, නව සාමාජිකයන් ඇතුළත් කර ගැනීම සහ අයවැය කරුණු පිළිබඳ වැදගත් තීරණ තුනෙන් දෙකක් වැඩි ඡන්දයෙන් සම්මත කෙරේ. වෙනත් ප්‍රශ්නවල දී සාමාන්‍යයෙන් වැඩි ඡන්දයෙන් තීරණ ගනු ලැබේ. ප්‍රඥප්තියට අනුව මහා මණ්ඩලයට පැවරී ඇති කාර්යයන් හා බලතල වන්නේ,

- ''නිරායුධකරණය සහ අවිසීමාකරණය පිළිබඳ ප්‍රතිපත්ති ඇතුළු ව අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව අරමුණු කොටගත් සහයෝගිතාව පිළිබඳ ප්‍රතිපත්ති විමර්ශනය කොට නිර්දේශ කිරීම.

- අන්තර්ජාතික සාමය හා ආරක්ෂාවට අදාළ ඕනෑම ප්‍රශ්නයක් සාකච්ඡා කිරීම සහ යම් ආරවුලක් හෝ තත්ත්වයක් ආරක්ෂක මණ්ඩලයේ සාච්ඡාවට ලක්වන අවස්ථාවල දී හැර, ඒ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම.

- ප්‍රඥාප්තියේ විෂය සීමාවට ගැනෙන හෝ එක්සත් ජාතීන්ගේ කුමන ආයතනයක හෝ බලතලවලට සහ කාර්යයන්ට බලපාන්නා වූ ඕනෑම ප්‍රශ්නයක් ගැන ඉහත කොන්දේසි යටතේ සාකච්ඡා කිරීම සහ නිර්දේශ කිරීම.

- අන්තර්ජාතික දේශපාලන සහයෝගිතාව, අන්තර්ජාතික නීතිය සංවර්ධනය සහ සංග්‍රහකරණය, මානව අයිතිවාසිකම් හා සියලු දෙනා සඳහා, මූලික නිදහස සාක්ෂාත් කර ගැනීම සහ ආර්ථික,

සමාජීක, සංස්කෘතික, අධ්‍යාපනික හා සෞඛ්‍යය ක්ෂේත්‍රවල අන්තර්ජාතික සහභාගී ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය උදෙසා අධ්‍යයන ආරම්භ කිරීම හා නිර්දේශ කිරීම.

- ජාතීන් අතර මිත්‍රශීලී සම්බන්ධතා අඩාල කිරීමට හේතුවිය හැකි ඕනෑම තත්ත්වයක්, එහි සම්භවය නොසලකා සාමකාමී ලෙස නිරාකරණය උදෙසා නිර්දේශ ඉදිරිපත් කිරීම.

- ආරක්ෂක මණ්ඩලයෙන් සහ එක්සත් ජාතීන්ගේ සෙසු ආයතන වෙතින් වාර්තා ලබා ගැනීම සහ සලකා බැලීම.

- එක්සත් ජාතීන්ගේ අයවැය සලකා බලා අනුමත කිරීම සහ දායක මුදල් සාමාජිකයන් අතර බෙදා වෙන් කිරීම.

- ආරක්ෂක මණ්ඩලයේ ස්ථාවර නොවන සාමාජිකයන් සහ ආර්ථික සහ සාමාජීය මණ්ඩලයේ සාමාජිකයින් තෝරාගැනීම හා භාරකාර මණ්ඩලයට තෝරාගත් සමාජිකයන් පත් කිරීම, ආරක්ෂක මණ්ඩලය සමඟ එක්ව අන්තර් ජාතික අධිකරණයට විනිශ්චයකරුවන් තෝරා පත් කිරීම සහ ආරක්ෂක මණ්ඩලයේ නිර්දේශය මත මහලේකම්වරයා පත් කිරීම'' (එක්සත් ජාතීන්ගේ සංවිධානය, 1995, 8,9 පිටුව).

මෙම කාර්යයන්ට හා බලතලවලට අමතර ව ආක්‍රමණකාරී ක්‍රියාවක් නිසා සාමය බිඳ වැටීමක් හෝ සාමයට තර්ජනයක් උද්ගත වූ අවස්ථාවක ස්ථාවර සාමාජිකයන් අතර ඒකමතික බවක් නොවීම නිසා, නිසි පියවරක් ගැනීමට ආරක්ෂක මණ්ඩලයට නොහැකි වුවහොත්, මහා මණ්ඩලය 1950 නොවැම්බර් සම්මත කළ''සාමය උදෙසා එක්සත් වීම'' යන යෝජනාව යටතේ අවශ්‍ය පියවර ගැනීමට මහා මණ්ඩලයට පිළිවන.

2.1.3 ආරක්ෂක මණ්ඩලය.

අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීමේ මූලික වගකීම ප්‍රඥාප්තියෙන් ම ආරක්ෂක මණ්ඩලය වෙත පැවරී තිබේ. "ආරක්ෂක මණ්ඩලය සැලසුම් කරන ලද්දේ, ලෝක සාමයේ ප්‍රමුඛ මුර දේවතාවා වනු අටියෙනි. ලෝක අවධානයට ලක්වන ඕනෑ ම කරුණක් සාකච්ඡා කිරීමට මහා මණ්ඩලයට හැකි වන අතර ආරක්ෂක මණ්ඩලය ක්‍රියා කරන්නේ සාමයට හා ආරක්ෂාවට අදාළ ගැටලු සම්බන්ධයෙන් පමණි. ආරක්ෂක මණ්ඩලයේ තීරණ පිළිගැනීමටත්, ක්‍රියාත්මක කිරීමටත්, එක්සත් ජාතීන්ගේ සියලු සාමාජිකයෝ එකඟ වී සිටිති" (එක්සත් ජාතීන්ගේ සංවිධානය . 2009, 15 පිටුව).

ආරක්ෂක මණ්ඩලය චීනය, ප්‍රංශය, රුසියානු පෙඩරේෂණය, බ්‍රිතාන්‍යය, එක්සත් ජනපදය යන ස්ථාවර සාමාජිකයන් පස් දෙනා සහ වසර දෙකක කාලයක් සඳහා, මහා මණ්ඩලය විසින් තෝරා ගනු ලබන දස දෙනෙකු ඇතුළු සාමාජිකයන් පහලොස් දෙනෙකුගෙන් සමන්විත වෙයි. එක්සත් ජාතීන්ගේ සෙසු ආයතනවලට බලය ඇත්තේ ආණ්ඩු වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමට වුව ද, සිය තීරණ ක්‍රියාත්මක කරන ලෙස බලකිරීමේ අයිතිය ආරක්ෂක මණ්ඩලය සතුව තිබේ. ආරක්ෂක මණ්ඩලයේ කාර්යයන් සහ බලතල වන්නේ,

- ''එක්සත් ජාතීන්ගේ ප්‍රතිපත්ති හා පරමාර්ථවලට අනුකූල ව, අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම.
- අන්තර් ජාතික ඝට්ටනයට තුඩුදිය හැකි ඕනෑ ම ආරවුලක් හෝ තත්ත්වයක් පරීක්ෂා කිරීම.
- ආරවුල් සමථයට පත් කිරීමේ ක්‍රම, විසඳුම් හෝ කොන්දේසි නිර්දේශ කිරීම.

- අවි පාලන ක්‍රමයක් ස්ථාපනය සඳහා සැලසුම් සම්පාදනය

- සාමයට තර්ජනයක් වූ විට හෝ ආක්‍රමණකාරී ක්‍රියාවක් සිදු වූ විට ඒ ගැන විමර්ශනය කොට ගත යුතු පියවර නිර්දේශ කිරීම.

- ආක්‍රමණයක් වැළැක්වීමට හෝ නතර කිරීම පිණිස අවි බලය යොදා ගැනීමෙන් තොර ව ආර්ථික සම්බාධක සහ වෙනත් ක්‍රියා මාර්ග අනුගමනය කරන ලෙස සාමාජිකයන්ගෙන් ඉල්ලා සිටීම.

- ආක්‍රමණිකයකුට එරෙහි ව යුද්ධය පියවර ගැනීම.

- නව සාමාජිකයන් බඳවා ගැනීම නිර්දේශ කිරීම සහ අන්තර්ජාතික අධිකරණයෙහි ව්‍යවස්ථාවට පාර්ශ්වකරුවන් වීම සඳහා රාජ්‍යයන්ට කොන්දේසි නියම කිරීම.

- මූලෝපායික ප්‍රදේශවල එක්සත් ජාතීන්ගේ භාරකාර කාර්යයන් ක්‍රියාත්මක කිරීම.

- මහ ලේකම්වරයා පත් කිරීම සඳහා මහා මණ්ඩලයට නිර්දේශ කිරීම සහ මහා මණ්ඩලය සමඟ එක් ව අන්තර්ජාතික අධිකරණයේ විනිශ්චයකාරවරුන් තෝරා ගැනීම'' (එක්සත් ජාතීන්ගේ සංවිධානය , 1995, 11,12 පිටුව).

ආරවුලක් සටනට තුඩුදෙන විට ආරක්ෂක මණ්ඩලයේ ප්‍රථම කාර්යය වන්නේ, එය හැකි ඉක්මනින් සමථයකට පත් කිරීමයි. එක්සත් ජාතීන් බිහි වූ දා සිට බොහෝ අවස්ථාවල ලෝකයේ විවිධ ප්‍රදේශවල ඇති වූ එදිරිවාදිකම් පුළුල් ව පැතිරයාම වළක්වා ගැනීමට ඉවහල් වන අයුරින් ආරක්ෂක මණ්ඩලය සටන් විරාම විධාන නිකුත් කර ඇත. එය ආරවුල් පවතින ප්‍රදේශවල නොසන්සුන්තාව සමනය කිරීමට ප්‍රතිවිරුද්ධ හමුදා වෙන් ව තබා ගැනීමට සහ සාමාකාමී විසඳුමකට එළඹීමට ඉවහල් වන සන්සුන් තත්ත්වයක් නිර්මාණය කිරීමට උදව්වනු

පිණිස එවැනි ප්‍රදේශ වෙත සාම සාධක හමුදා යවයි. විසඳුම් ක්‍රියාත්මක කිරීමේ මාර්ග ආර්ථික සම්බාධක හෝ සාමූහික යුදමය පියවර තීරණය කිරීමට ද මණ්ඩලයට පිළිවන.

2.1.4 ආර්ථික හා සමාජීය මණ්ඩලය.

ආර්ථික හා සාමාජීය මණ්ඩලය කෙටියෙන් ඉකොසොක් (ECOSOC) යන නාමයෙන් හඳුන්වනු ලැබේ. එය ''ඩෙළෙඳාම, ප්‍රවාහනය, කාර්මීකරණය සහ ආර්ථික සංවර්ධනය වැනි ආර්ථික ගැටලු සහ ජනගහනය, ළමයින්, නිවාස සම්පාදනය, ස්ත්‍රී අයිතිවාසිකම්, වාර්ගික වෙනස්කම්, විෂ මත්ද්‍රව්‍ය, අපරාධ, සමාජ සුභ සාධනය, තරුණයන්, මානව පරිසරය සහ ආහාර වැනි සමාජ ගැටලු පිළිබඳ එක්සත් ජාතීන්ගේ කේන්ද්‍රීය සංවාද මණ්ඩපයයි. එසේ ම අධ්‍යාපනය හා සෞඛ්‍ය තත්ත්වයන් වැඩි දියුණු කිරීම සඳහාත් සෑම තැන්හි ම වෙසෙන ජනයාගේ මානව අයිතිවාසිකම් සහ නත් වැදෑරුම් නිදහස සුරකිම හා ඒවාට ගරු කිරීම ප්‍රවර්ධනය කරනු සඳහාත් රටවලට උපකාරී වෙයි'' (එක්සත් ජාතීන්ගේ සංවිධානය, 2009, 17 පිටුව),

ආර්ථික හා සමාජීය මණ්ඩලයට හිමිවන කාර්යයන් හා බලතල වන්නේ,

- ''ලෝක පරිමාණ හෝ අන්‍යොන්‍ය වැදගත්කමක් සහිත අන්තර්ජාතික ආර්ථික හා සමාජයීය විෂයයන් සාකච්ඡාවට ලක් කෙරෙන වේදිකාවක් ලෙස ක්‍රියා කිරීම සහ අදාළ විෂයන් පිළිබඳ ප්‍රතිපත්ති නිර්දේශ සම්පාදනය,

- අන්තර්ජාතික ආර්ථික, සමාජීය, සංස්කෘතික, අධ්‍යාපනික, සෞඛ්‍ය හා සම්බන්ධිත විෂයයන් පිළිබඳ අධ්‍යයන සහ වාර්තා සැලසුම් කිරීම හෝ පිළියෙල කිරීම නිර්දේශ ඉදිරිපත් කිරීම.

- මානව අයිතිවාසිකම් හා නන් වැදෑරුම් මූලික නිදහස පිළිපැදීම සහතික කිරීම හා ඒ පිළිබඳ ගෞරවය වර්ධනය කිරීම.

- සිය අධිකාරියට අයත් විෂයයන් අරභයා අන්තර්ජාතික සමුළු කැඳවීම සහ මහ මණ්ඩලයට ඉදිරිපත් කිරීමට සම්මුති කෙටුම්පත් සැකසීම.

- එක්සත් ජාතීන්ගේ විශේෂිත ආයතන සමඟ ගිවිසුම් පිළියෙල කිරීම.

- මහ මණ්ඩලය සහ එක්සත් ජාතීන්ගේ සාමාජික රාජ්‍යයන් සමඟ අදහස් හුවමාරුව හා සාකච්ඡා මාර්ගයෙන් විශේෂිත ආයතනයන්ගේ කාර්යයන් සම්බන්ධීකරණය හා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම.

- සාමාජික රාජ්‍යයන් සහ විශේෂිත ආයතන සඳහා මහා මණ්ඩලය විසින් අනුමත සේවාවන් සැපයීම.

- මණ්ඩලයට අදාළ කාර්යයන් සම්බන්ධයෙන් රාජ්‍ය නොවන සංවිධානවල උපදෙස් විමසීම''
(එක්සත් ජාතීන්ගේසංවිධානය, 1995, පිටුව 14).

එක්සත් ජාතීන් බිහි වූ අවධියේ ලෝකයේ ඇතැම් ප්‍රදේශවල ජනතාවට තමන්ගේ ම ආණ්ඩු පිහිටුවා ගැනීමට නොහැකි ව තිබිණ. ඉන් සමහරක් ප්‍රථම ලෝක යුද්ධය අවසානයේ ස්ථාපනය කරන ලද බල අධිකාර යටතේ ක්‍රියාත්මක විය. සෙසු ඒවා දෙවැනි ලෝක සංග්‍රාමයේ ප්‍රතිඵලයක් ලෙස සතුරු රාජ්‍යයන්ගෙන් වෙන් කරනු ලැබීය. එක්සත් ජාතීන් ස්ථාපනය කළ පසු මේ ප්‍රදේශ එක්සත් ජාතීන්ගේ විශේෂ ආරක්ෂාව යටතට පත් කෙරුණු අතර ඒවා භාර භූමි ප්‍රදේශ ලෙස හඳුන්වන ලදී. මෙම භූමි ප්‍රදේශවල වෙසෙන ජනතාවගේ

සමාජ ප්‍රගමනය අධීක්ෂණය පිණිස එක්සත් ජාතීන්ගේ ආයතනයක් ලෙස භාරකාරත්ව මණ්ඩලය ස්ථාපනය කෙරිණි. භාරකාරත්ව මණ්ඩලය චීනය, ප්‍රංශය, රුසියානු ෆෙඩරේෂණය, එක්සත් රාජධානිය, එක්සත් ජනපදය යන ආරක්ෂක මණ්ඩල නිත්‍ය සාමාජිකයන්ගෙන් සමන්විත වෙයි.

2.1.5 අන්තර්ජාතික අධිකරණය.

අන්තර්ජාතික අධිකරණය නෛතික තීන්දු දීමේ කාර්යය භාර එක්සත් ජාතීන්ගේ ප්‍රධාන ආයතනය වන්නේ ය. අධිකරණය හමුවේ නඩු පැවරිය හැක්කේ පුද්ගලයන්ට නොව රටවලට පමණි. නඩුවක් විභාග කිරීමට කිසියම් රටක් එකඟ වූ විට අධිකරණයේ තීරණයට කීකරු වන බවට එරට ප්‍රතිඥා දිය යුතුය. ඒ හැර අධිකරණයේ උපදේශාත්මක මතය ඉල්ලා සිටීමට එක්සත් ජාතීන්ගේ සෙසු ආයතනවලට පිළිවන.

2.1.6 ලේකම් කාර්යාලය.

මහ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් ලේකම් කාර්යාලය නිව්යෝර්ක් නුවර එක්සත් ජාතීන්ගේ මූලස්ථානයෙහි සහ ලොව පුරා සේවයේ නිරත අන්තර්ජාතික කාර්යය මණ්ඩලයකින් සෑදී ඇත්තේ ය. එය සංවිධානයේ එදිනෙදා කාර්යයන් ඉටු කරයි. එහි කාර්යයන් එක්සත් ජාතීන් අතගසා ඇත්තා වූ ප්‍රශ්න සේ ම විවිධය. ඒවා සාම සාධක මෙහෙයුම් පරිපාලනයේ සිට අන්තර්ජාතික ආරවුල් තේරුම් කිරීම නැතහොත් සමාජීය හෝ ආර්ථික ප්‍රවණතා හා ගැටලු අධ්‍යයනය දක්වා පරාසයක විහිදෙයි. එක්සත් ජාතීන්ගේ සෙසු ආයතන වලට සේවය කිරීමත්, එකී ආයතන විසින් නිර්දේශිත වැඩසටහන් සහ ප්‍රතිපත්ති පරිපාලනයත්, ලේකම් කාර්යාලයේ වගකීමකි.

03

යුද්ධය හා යුද නීතිය.

3.1. යුද්ධය යනු කුමක්ද?

ඉතා සරල ව දැක්වුවහොත් යුද්ධය යනු සන්නද්ධ අරගලයකි. යුද්ධය යන වචනය සම්බන්ධයෙන් ජාත්‍යන්තර නීතියේ පැහැදිලි අර්ථ කථනයක් දක්නට නොමැත. ''1917 දී සහ 1945 දී අවසාන වූ පළමු හා දෙවන ලෝක මහා සංග්‍රාමයන් යුද්ධ වශයෙන් පිළිගැනේ. 1990 ඉරාකය විසින් කුවේටය ආක්‍රමණය කිරීමත්, අනතුරුව 1991 ජනවාරි 15 දා ඇමරිකා එක්සත් ජනපදය විසින් යුද ප්‍රකාශ කිරීම මත යුද්ධයක් පැවති බව අපි දනිමු. වියට්නාමයේ මුල් අවධියේ පැවතියේ යුද්ධ නොවන සන්නද්ධ සටනකි. නමුත් 1965න් පසු ව යුද්ධමය තත්ත්වයක් පැවති බව, සටන් අවසාන කිරීම සඳහා 1973 ජනවාරි 27 දා අත්සන් කළ පැරිස් ගිවිසුමේ සඳහන් වේ''. (ඩයස්, 1997, 409 පිටුව)

නූතන ලෝකයේ සන්නද්ධ අරගල පුළුල් වශයෙන් සිදුවෙමින් පවතී. මෙවැනි සන්නද්ධ අරගල ප්‍රධාන කොටස් 2කි. එනම්,

I. ''ජාත්‍යන්තර සන්නද්ධ අරගල.
II. ජාත්‍යන්තර නොවන සන්නද්ධ අරගල.

මෙම වර්ගීකරණය ම තවත් අයුරකින් හැඳින්විය හැකිය. එනම්,

I. යුද්ධයක් සහිත සන්නද්ධ අරගල.

II. යුද්ධයකින් තොර සන්නද්ධ අරගල''(කරුණාදාස, 2007, 27 පිටුව).

යුද්ධය යන්න හැඳින්වීම සඳහා ඉංග්‍රීසි භාෂාවෙන් භාවිතා කරනු ලබන්නේ War යන්නයි. ප්‍රායෝගිකව, ඩ්‍රොන්ටින් නඩුවේදී හෝල් විනිසුරු විසින් ප්‍රකාශ කරන ලද යුද්ධය පිළිබඳ විස්තරය ඵලදායී ලෙස පසු කාලීන ව නඩු තීන්දුවල යොදාගෙන ඇත. එනම්, "රාජ්‍යයන් අතර පවතින විරෝධතා හේතු කොට ගෙන රාජ්‍ය පාර්ශ්වයින් බලය යෙදීමට තරම් තත්ත්වයකට පත් වූ විට හෝ එක් පාර්ශවයක් විසින් කරන ලද හිංසනික ක්‍රියාවලට ප්‍රතිචාර වශයෙන් අනෙක් රාජ්‍යය සාමය කඩකරන ක්‍රියාවන්හි යෙදෙන විට දී, යුදමය තත්ත්වයක් උදාවනු ඇත. එවන් විට දී රණපත් රාජ්‍යයන් විසින් විධිමත් හා ක්‍රමානුකූල ව සැකසුණ හමුදාවන් විසින් එකිනෙකාට එරෙහි වූ සටනක යෙදී එක් පාර්ශ්වයක් විසින් ඉදිරිපත් කරන කොන්දේසිවලට අනෙක් පාර්ශ්වය නතු වනතුරු බලය යෙදීම යුද්ධය වශයෙන් සැලකේ" (ඩයස්, 1997, 409 පිටුව).

මේ අනුව සන්නද්ධ සටන් ජාත්‍යන්තර මට්ටමට පිවිසුණ අවස්ථාවක යුද්ධමය තත්ත්වයක් වශයෙන් ද, දේශයක් තුළට පමණක් සීමා වූ විට සිවිල් අරගලයක් වශයෙන් ද දැක්වීමට පුළුවන. මෙම අර්ථකථනයට අනුව ශ්‍රී ලංකාවේ පැවති උතුරු නැගෙනහිර අර්බුදය ජාත්‍යන්තර නීතියට ගැනෙන යුද්ධයක් ද යන්න ගැටලු සහගත වේ.

ජේ.ජේ. ස්ටාර්ක් නැමැති නීතිවේදියා "ජාත්‍යන්තර නීතියට හැඳින්වීමක්" නම් වූ කෘතියේ දක්වන ආකාරයට යුද්ධය යනු,"රාජ්‍යයන් දෙකක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් අතර තම හමුදාවන් මාර්ගයෙන් ඇති කර ගන්නා වූ තරගකාරීත්වයකි" (කරුණාදාස, 2007, 29 පිටුව).

ඒ අනුව යුද්ධයෙහි අවසන් පරමාර්ථය වන්නේ, සතුරා විනාශ කිරීම හෝ සාමය සඳහා වන කොන්දේසි සතුරා පිට පැවරීමයි. සී.එච්.

හෝල් යුද්ධය පිළිබඳව ඉදිරිපත් කර ඇති අර්ථකථනය විමසා බැලීම ද මෙහිදී වටී. එනම්, ''කිසියම් රාජ්‍යයන් දෙකක් අතර පවත්නා මතභේද උත්සන්න වීමෙන් දෙපාර්ශ්වයේ ම බලය යෙදීමේ අවස්ථාවකට පත් වුවහොත්, ඉන් එක් පාර්ශ්වයක් විසින් එය සාමය කඩකළ අවස්ථාවක් සේ සලකා ක්‍රියාකරන්නේ නම්, එවැනි විටකදී හටගන්නා වූ යුද්ධමය සම්බන්ධතාවේදී එක් පාර්ශ්වයක් විසින් අනෙක් පාර්ශ්වය වෙත පනවනු ලබන කොන්දේසි පිළිගන්නා තුරු එකෙකු අනිකාට එරෙහි ව විධිමත් ආකාරයෙන් යොදවනු ලබන ප්‍රචණ්ඩත්වය නැතහොත් හිංසනය හා පීඩාව යුද්ධය නම් වේ'' (කරුණාදාස, 2007, 29 පිටුව). ''මහාචාර්යය එල් ඕපන්හයිම් දක්වන ආකාරයට යුද්ධය යොදාගනු ලැබීමේ ප්‍රධාන පරමාර්ථය වන්නේ සතුරු අභිගමනය (පරාජය) කරමින් තම කොන්දේසිවලට සතුරා යටත් කරගැනීමයි'' (කරුණාදාස, 2007, 30 පිටුව).

මේ අනුව මහාචාර්ය එල්. ඕපන්හයිම් සහ ඩී.එච්. හෝල් විසින් ඉදිරිපත් කර ඇති අර්ථකථන දෙක තුළ යම්බඳු සමානකමක් දැකිය හැකි බව පෙනී යයි. නමුත් මහාචාර්ය එල්. ඕපන්හයිම් විසින් දක්වන ලද අර්ථකථනයෙහි දක්නට ලැබෙන මූලික ලක්ෂණ දෙකකි. එනම්,

01. යුද්ධය කිසියම් රාජ්‍යයක නීත්‍යානුකූල අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමට මෙන්ම බලය තරකර ගැනීමට යොදාගත හැකි මාධ්‍යයකි. නැතහොත් උපකරණයකි.

02. යුද්ධය කිසියම් රටක් කෙරෙහි පවත්නා නීත්‍යානුකූල අයිතියක් වෙනස් කිරීමට ද භාවිත කළ හැකි මාධ්‍යයකි. නැතහොත් උපකරණයකි.

3.2. යුද නීතිය.

අන්තර්ජාතික නීතියෙහි එන අන්තර්ජාතික යුද්ධ පිළිබඳව සලකා බැලූ විට නීත්‍යානුකූල යුද්ධ සහ නීති විරෝධී යුද්ධ වශයෙන් යුද්ධ දෙවර්ගයකට බෙදා දැක්වීමට පුළුවන. ''එක්සත් ජාතීන්ගේ ශාසන පත්‍රයට අනුව ආක්‍රමණික (Aggressive) යුද්ධ නීති විරෝධී යුද්ධ වශයෙන් සැලකිය හැකි අතර, යම් රටක ආරක්ෂාව සඳහා එනම් රටෙහි ආරක්ෂාව අයිතිය උදෙසා යුද්ධ කිරීම නීත්‍යානුකූල ලෙස සැලකිය හැකිය'' (ද කොස්තා, 1986, 60 පිටුව).

එක්සත් ජාතීන්ගේ ශාසන පත්‍රයෙහි 2(4) ව්‍යවස්ථාව අනුව එහි සියලු ම සාමාජික රටවල් අන්තර්ජාතික සම්බන්ධතාවක් හිමි ඕනෑ ම රාජ්‍යයක දේශභූමිය අඛණ්ඩතාවට හෝ දේශපාලන ස්වාධීනත්වයට එරෙහි ව බලය පාවිච්චි කිරීම හෝ එසේ බලය පාවිච්චි කරන බවට තර්ජනය කිරීම නොකළ යුතුය. යුද්ධ පිළිබඳ පවතින යුද නීතියේ වර්තමාන තත්ත්වයෙහි පදනම වන්නේ මෙයයි. එම නිසා වර්තමානයේ එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයන් නොවන රටවල් ස්වල්පය පවා එය චාරිත්‍රමය නීතියෙහි රීතියක් ලෙස සලකනු ලැබේ.

යුද නීතිය වර්තමානයේ දී ව්‍යවහාර කරනු ලබන්නේ මානව හිතවාදී නීතිය වශයෙන්ය. එසේ ව්‍යවහාරට බඳුන් වන්නේ 20වන සියවසේ වූවත් එහි ප්‍රභවය හා විකාශය ඓතිහාසික යුගයේ පටන් සිදුවූවකි. මෙහි දී යුද නීතියේ සංවර්ධනය ප්‍රධාන අවධීන් දෙකක් ඇසුරෙන් හඳුනාගත හැකිය.

(i) සාම්ප්‍රදායික නීතිය වර්ධනය වූ අවධිය.
(ii) නූතන යුද නීතිය (හෙවත් ජාත්‍යන්තර මානව හිතවාදී නීතිය) වර්ධනය වූ අවධිය.

මෙම නීති බණ්ඩ දෙකෙහි පවතින්නා වූ වෙනස වන්නේ, එහි පළමු වැන්න සාම්ප්‍රදායික ව පැවත ආ යුද නීතිය සංගෘහිත කිරීමෙන්

බිහි වූ නීතියක් වීමත්, දෙවැන්න සම්මුතීන් හා ගිවිසුම් පදනම් කරගනිමින් බිහි වූ ජාත්‍යන්තර නීතියක් වීමත්ය.

3.2.1 සාම්ප්‍රදායික යුද නීතිය.

ජාත්‍යන්තර මානව හිතවාදී නීතිය වශයෙන් වර්තමානයේ පිළිගනු ලබන යුද නීතිය නූතන යුගයේ නිර්මාණයක් නොවේ. එය ඈත අතීතයේ සිට ක්‍රමයෙන් විකාසනය වෙමින් පැමිණ 1848 ශාන්ත පීටර්ස්බර්ග් ප්‍රකාශනයෙන් අනතුරුව ජාතීන් අතර ඇති කරගත් එකඟතාවන් හා සම්මුතීන් තුළින් හේග් හා ජිනීවා නගර මුල් කරගෙන පැවැත්වූ සම්මේලනයන්හි දී සංගෘහිත කරනු ලැබූ නීති පද්ධතියකි. මෙම නීති පද්ධතියෙන් යුද නීතිය වෙන් කරගනිමින් එහි ඓතිහාසික ප්‍රභවය හා විකාසනය කෙරෙහි සාම්ප්‍රදායික යුද නීතිය කෙරෙහි අවධානය යොමු කරනු ලැබේ. "ජාත්‍යන්තර සාම්ප්‍රදායික යුද නීතිය වශයෙන් හේග්හි සංගෘහිත කරනු ලැබූ නීතියෙහි ඓතිහාසික විකාශනය ප්‍රධාන අවස්ථාවන් තුනක් යටතේ සලකා බැලිය හැකිය. එනම්,

(i) පුරාතන අවධිය.

(ii) මධ්‍යතන අවධිය.

(iii) නූතන අවධිය" (කරුණාදාස, 2007, 32 පිටුව).

3.2.1.1 පුරාතන අවධිය.

මනුෂ්‍ය ශිෂ්ටාචාරය ආරම්භ වූ අවධියේ පටන් මනුෂ්‍ය ප්‍රජාව අතර සබඳතා පවත්වා ඇති මාධ්‍යයක් වශයෙන් යුද්ධය පෙන්වා දීමට පුළුවන. ඒ නිසා ම යුද්ධය මානව පරිණාමයේ ආරම්භය දක්වා ම දිව යන්නක් ලෙස සැලකිය හැකිය. "පුරාතන අවධියේ පැවති යුද්ධය පිළිබඳ ව ඓතිහාසික පර්යේෂණයන්ගෙන් හෝ හෙළි වී ඇති ප්‍රධාන අදහස් දෙකකි.

(i) අතීතයේ පැවති යුද්ධයන්හි දී කැලෑ නීතිය රජ විය. නැතහොත් යුද්ධයේ දී කිසිත් නීතියක් එදා භාවිත නොවීය.

(ii) ප්‍රාථමික යුගයේ දී පවා යුද්ධ කිරීමේ දී පිළිපැදි ඇතැම් රීතීන් විය" (කරුණාදාස, 2007, 32 පිටුව).

යුද්ධය පිළිබඳ ව පුරා විද්‍යා පර්යේෂකයන් හෙළිදරව් කර ඇති කරුණුවලට අනුව සුමේරියානු, බැබිලෝනියානු, ග්‍රීක-රෝම ශිෂ්ටාචාරයන් පැවති අවධියේදීත් ක්‍රියාත්මක වූ යුද නීතීන් පැවතිණි. "සුමේරියානු ජාතිකයන් විසින් යුද්ධය ප්‍රකාශ කිරීම, ඒ සම්බන්ධයෙන් පණිවුඩකරුවන් යැවීම හා ඇතැම්විට සතුරා සමඟ ගිවිසුම් ඇති කර ගැනීම, වැනි යුද නීති භාවිත කළ බවට පුරා විද්‍යා සාක්ෂ්‍ය ඉදිරිපත් කර ඇත. බැබිලෝනියානු රජකු වූ හම්මුරාබි (Hammurabi) තමන්ගේ ම යුද නීති පැන වූ බවත්, කප්පම් ගෙවීමෙන් ප්‍රාණ ඇපකරුවන් බේරා ගැනීමේ නීතියක් හඳුන්වා දුන් බවත් සඳහන් වී ඇත. එමෙන් ම පැරණි ඊජිප්තු ජාතිකයන් විසින් තමාගේ සතුරාට පවා ආහාර දිය යුතු යැයි, විධානය කර ඇත. ඊජිප්තියානු සංස්කෘතිය විසින් පිළිගත් 'සත්‍ය දයාවේ සප්ත ක්‍රියාවන්' (Seven works of True Mercy) අනුව,

- නිරාහාර අයට ආහාර,

- පිපාසිත අයට ජලය,
- නිරුවස්ත්‍ර වූවන්ට වස්ත්‍ර,
- සරණාගතයන්ට සෙවණ,
- සිරකරුවන්ට නිදහස,
- රෝගී වූවන්ට සාත්තු කිරීම හා
- මියගියවුන් වළ දැමීම කළ යුතු වේ."

(කරුණාදාස, 2007, 32-33 පිටුව).

ක්‍රි:පූ: 1200 පමණ හිට්වයිට් ශිෂ්ටාචාරය පැවති අවධියේත්, යුද්ධය කිරීමේ දී මානුෂිය ආකාරයෙන් එය සිදු කළ බවත්, සාධාරණත්වය හා මධ්‍යස්ථභාවය එහි රීතිය වූ බවත් පෙන්වා දෙන ඉතිහාසඥයන් හිට්වයිට් හා ඊජිප්තු ජාතිකයන් අතර ඇති වූ යුද්ධයක්, ක්‍රි:පූ: 1269 දී ඇති කරගත් සාම ගිවිසුමකින් අවසන් වූ බවත් සඳහන් වේ. එමෙන් ම,''මහා භාරතයේ සඳහන් වන "මනු" නම් වෘත්තාන්තයට අනුව යුද්ධයේ දී හේවායකු විසින් නොකළ යුතු දෑ යැයි සඳහන් කළ දෑ අතර, හේවායකු විසින් තමාට යටත් වන්නා වූ හෝ අබ්බගාත වූ සතුරෙකු ඝාතනය නොකළ යුතුය, තුවාලකරුවන් සනීප කළ පසු තමාගේ රටට යැවිය යුතුය, ඇතැම් ආයුධ භාවිතය තහනම්ය. (ඇවුළුම් කටු/ විෂ පෙවූ ආයුධ, ගිනි ඇවුලූ හීය) ආදී වශයෙන් නම් කොට ඇත" (කරුණාදාස, 2007, 33 පිටුව).

එමෙන් ම ධර්මාශෝක රජුගේ එක් විධානයක් වූයේ "යුද්ධයේ දී තුවාල වූවන්ටත්, ඔවුන්ට සාත්තු සප්පායම් කරන ආගමික කන්‍යා සහෝදරියන්ටත් ගරු කළ යුතු බවයි." ග්‍රීක ශිෂ්ටාචාරය පැවති යුගයේ දීත් ඉලියඩ් සහ හෝමර් දක්වන අන්දමට යුද්ධයේ දී සාධාරණාත්මක නීති ඇතැම්විට ක්‍රියාත්මක වී ඇත. සාම ගිවිසුම් ඇති කිරීම මෙන් ම මියගිය සතුරාට වුව ද ගෞරව දැක්වීම ග්‍රීක යුගයේ දී යුද නීතියක් විය.

යුද්ධයට අදාළ ව වැදගත් අනාගත වාක්‍යයක් ප්‍රකාශ කළේ ක්‍රි:පූ: යුගයේ සිටි මහා ඇලෙක්සැන්ඩර් රජුය. ''යුද්ධයක දී සටනට තුඩුදුන් වස්තූන් විනාශ කරමින් තවදුරටත් යුද්ධය පවත්වා ගැනීම උමතු පුද්ගලයන්ගේ ක්‍රියාවකි'' යනුවෙන් ඔහු කළ ප්‍රකාශය අවසානයේ දී යුද නීතියේ පදනම බවට පත්විය.'' (කරුණාදාස, 2007, 34 පිටුව).

ස්ටොයික්වාදය (stoicism) නමින් හැඳින්වෙන නව දර්ශනයෙන් සිදුවූයේ, මානුෂිකත්වය පිළිබඳ සංකල්පය යුද්ධයේ දී මූලික නීතියක් (Guide Line) වශයෙන් හඳුනා ගැනීමයි. රෝම ශිෂ්ටාචාරය පිළිබඳ සලකා බලන විට ඉතා වැදගත් කාරණාවක් වන්නේ, වසර 700කට අධික කාලයක් යුද්ධය මත ම රඳා පැවැති රාජ්‍යයක් ලෙස පෙනී යයි. නමුත් යුද්ධයේ දී නීතිය වෙනත් ස්වරූපයක් ගත්තේය. එනම් රෝම නීතිය බලපෑවේ රෝම වැසියන්ට පමණි. සතුරන් රෝම නීතියෙන් පිටස්තර අය ලෙස සලකන ලදී. රෝම යුගයේ දී යුද්ධයේ දී අල්ලා ගත් වහලුන්ට කිසිත් අයිතිවාසිකමක් නොවූ අතර අතිශය කෲර ආකාරයෙන් මරා දමනු ලැබීය. "ක්‍රි:පූ: 185 දී වහලුන් අපුලියා (Apullia) නම් ස්ථානයේදී නැඟී සිටි විට හත්දහසක් පමණ වූ සියලු ම වහල්ලු කුරුසියේ තබා ඇණ ගසනු ලැබූහ" (කරුණාදාස, 2007, 35 පිටුව).

3.2.1.2 මධ්‍යකන අවධිය

මධ්‍යතන අවධියේ මානව හිතවාදී නීතියේ වර්ධනයට බලපෑම් කරන ලද සාධක තුනක් පැහැදිලි ලෙස ඉතිහාසය අධ්‍යයනය කිරීමෙන් හඳුනා ගැනීමට පුලුවන, එනම්,

(i) යුදෙව්-ක්‍රිස්තියානිය.

(ii) ඉස්ලාම් වාදය.

(iii)වීර වික්‍රමාන්විත අවධිය.

මධ්‍යතන යුගයේ දී යුද්ධය පිළිබඳ ව නව නීති දර්ශනයක් බිහි කරන ලද්දේ යුදෙව් ක්‍රිස්තියානි ආගම විසින්ය. යුද්ධයෙහි නීත්‍යානුකූල බව තවදුරටත් ස්ථාපිත කරනු ලැබුවේ මධ්‍යතන යුගයේ එනම් ක්‍රි:ව: 5 සියවසේ දී ජීවත් වූ ශාන්ත අගෝස්තීන් හා ශාන්ත ඇක්වයිනාස් විසින්ය. ඔවුන් කළ වැදගත් කාර්යයක් වන්නේ, ස්ටොයික්වාදය විසින් බිහිකරනු ලැබූ සාධාරණ යුද්ධය (just War) නැමැති සංකල්පය යළි පණගන්වමින් ඊට නව අර්ථකථනයක් ලබාදීමයි. එහි දී ස්වාධිපත්‍යය හිමි පාලකයා වෙනුවෙන් සටන් කිරීම පාපකාරී ක්‍රියාවක් නොවේ. මධ්‍යම යුගයේ පැවති සාධාරණ යුද්ධය සම්බන්ධයෙන් දැක්විය හැකි නොඳ ම නිදසුන වන්නේ කුරුස යුද්ධයයි. "ඉස්ලාම් භක්තිකයන් යුද්ධය සම්බන්ධයෙන් දරූ ආකල්පය ක්‍රිස්තියානි ආකල්පයෙන් වෙනස් වූවකි. ඉස්ලාමිකයන් නිරත වූයේ 'ජිහාඩ්' නම් වූ යුද්ධයක විනා ක්‍රිස්තියානුවන් දැක්වූ ආකාරයේ සාධාරණ යුද්ධයක් නොවේ. ජිහාඩ් යුද්ධයේ පරමාර්ථය වූයේ වහලුන් හා ම්ලේච්ඡයන් වශයෙන් ක්‍රිස්තියානුවන් සැලකූ සෑම පුද්ගලයෙකුට ම මනුෂ්‍යයන් ආකාරයෙන් සැලකීමයි" (කරුණාදාස, 2007, 41 පිටුව).

ඒ ,අනුව ඉස්ලාම්වාදය විසින් යුද්ධයට අදාළව මානව හිතවාදයට නැඹුරු නීතීන් පිළිගන්නා ලදී. මධ්‍යතන යුගයේ බිහි වූ ඉස්ලාම්වාදය එක් අතකින් යුරෝපය කරා ව්‍යාප්ත වෙද්දී, තවත් අතකින් ක්‍රිස්තියානුවන් නැගෙනහිර කරා ව්‍යාප්ත වීමේදී, සිදු වූ වැදගත් ම සිදුවීම වූයේ, කුරුස යුද්ධය නමින් හැඳින් වූ ආගමික යුද්ධය ඇති වීමයි. කුරුස යුද්ධයෙන් ක්‍රිස්තියානුවන් විසින් 1099 දී ජෙරුසලම යටත් කළ කල්හි ඔවුහු එහි සිටි සියල්ල ම අමු අමුවේ ම ඝාතනය කළහ. මෙම සිද්ධිය ඇසින් දුටු රේමන්ඩ් ඩි. ඇගිල්ස් (Raymond d. Aglies) එම සිද්ධිය විස්තර කරන්නේ, "සොලමන් දේවාලයේ සරණාගතයින් වූ දස දහසක් දෙනාගේ රුධිරය පැරණි සොලමන් දේවාලය හරහා ගලාගිය අතර එම රුධිරයෙන් මිනිසුන් ද ඔවුන්ගේ ඡේදනය කරන ලද අත්, පා එහා මෙහා පාවෙමින් පැවතුණි" (කරුණාදාස, 2007, 42 පිටුව). යනුවෙනි.

ක්‍රිස්තියානුවන් එසේ කටයුතු කරනු ලැබූව ද, ඉස්ලාම්වරුන්ගේ ක්‍රියාකලාපය ඊට හාත්පසින් ම වෙනස් විය. "1187 දී සතුරු පාර්ශ්වයේ වෛද්‍යවරුන්ට පැමිණ තුවාකරුවන්ට සාත්තු කිරීමෙන් පසු ව තම කඳවුරුවලට ආපහු යෑමට අවස්ථාව ලබාදුන් සලාඩින් කෙතරම් මානව හිතවාදී වුවා ද යතහොත් මිනිසුන් 2700ක් අමු අමුවේ ඝාතනය කළ රිචර්ඩ් ඩි. ලයන් නමැති සතුරු සෙන්පතියා රෝගී වූ කල්හි තමාගේ පෞද්ගලික වෛද්‍යවරයා යවා ඔහුට සාත්තු කරනු ලැබීය" (කරුණාදාස, 2007, 42 පිටුව).

මධ්‍යතන යුගයේ දී සිදු වූ යුද අපරාධ අතුරින් වඩාත් ම භයානක යුද අපරාධය වූයේ, කුරුසකරුවන් හා වෙනිසියානුවන් විසින් 1204 වර්ෂයේ දී කොන්ස්තන්තිනෝපල් නගරය විනාශ කිරීමයි.

මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ, එම යුගය අන්තවාදී ආගමික අදහස්වලින් යුතු ව සිදු කෙරෙන ලේ වැගිරෙන සටන්වලින් පරිපූර්ණ යුගයක් වූ බවයි. මානව හිතවාදී නීතියේ සංවර්ධනයට හෝ යුද නීතියේ සංවර්ධනයට මේ යුගයේ දී එතරම් දායකත්වයක් සිදුවනු දක්නට නොලැබේ. එහිලා බලපාන වැදගත් ම හේතුව වන්නේ 'සාධාරණ යුද්ධය' නම් වූ පැරණි සංකල්පයට ක්‍රිස්තියානි පල්ලිය විසින් දුන් සාවද්‍ය අර්ථකථනයයි.

3.2.1.3 නූතන යුගය.

නූතන යුගය ආරම්භ වන්නේ 14වන සියවස අවසාන වීමත් සමඟය. යුද ඉතිහාසයේ තීරණාත්මක පරිවර්තනයක් මෙම අවධියේදී සිදු වනු දකිය හැකිය. මෙයට ප්‍රධාන හේතුව වන්නේ තාක්ෂණයේ දියුණුවත් සමඟ අවි ආයුධ නිෂ්පාදනය කිරීමයි. නමුත් මෙම යුගයේදී බිහි වූ ඇතැම් දාර්ශනිකයෝ යුද්ධයට අදාළ ජාතීන්ගේ නීතිය සංවර්ධනය කිරීමෙහි ලා වඩාත් ඵලදායී සේවාවක් කළහ. එහිදී තෝමස් ඇක්වයිනාස් ප්‍රධාන තැනක් ගනී. ඔහු සාධාරණ යුද්ධය පිළිබඳ දුෂ්ඨ සංකල්පයෙන් තරමක් දුරට මිදී එය එක් පාර්ශ්වයකට

පමණක් නොව දෙපාර්ශ්වයට ම සාධාරණ යුද්ධයක් විය යුතුය, යන්න පළමු වරට ප්‍රකාශ කර ඇත. එමෙන් ම කතෝලික ආගමට එරෙහි ප්‍රොතෙස්තන්ත්‍රවාදියෙකු වූ ග්‍රොෂස් හා ඔහුගේ ආන්තරාගාමීකයන් ජාත්‍යන්තර නීතියට අලුත් මූලධර්යක් හඳුන්වා දුන්නේය. එනම්,"නීතිය යනු, දෙවියන්ගේ කැමැත්ත මත රඳා පවතින්නක් නොව, මානුෂික හේතූන් මත රඳා පවතින්නකි" (කරුණාදාස, 2007, 45 පිටුව). යනුවෙන්ය.

යුද්ධය මානවකරණීය කිරීමට වඩාත් වේගයෙන් සිදුවීම් ආරම්භ වන්නේ යුරෝපයෙනි. 1785 වසරේ මහා පෙඩ්‍රික් රජු හා බෙන්ජමින් ෆ්‍රෑන්කක්ලින් අතර ඇති කරගත් මිත්‍රත්වය හා සාමය පිළිබඳ ගිවිසුම මෙහි දී වඩාත් කැපී පෙනේ. එහි අන්තර්ගත ඇතැම් ප්‍රතිපාදන පසු කාලයේ දී පිළිගත් යුද නීතියේ මූලධර්ම බවට පත් විය. එමෙන් ම මානව හිතවාදයට අනුව කටයුතු කළ එවැනි එක් රජෙකු වූයේ, 18වන සියවසේ මුල් අවධියේ විසූ XVවන ලුවී රජතුමාය. "ඔහු විසින් සිදු කළ ෆොන්ටෙනෝයි සංග්‍රාමයට (Battle of Fontenoy) පෙර, යුද්ධයේ දී තුවාල ලබන හා රෝග පීඩාවන්ට භාජනය වන්නන් සඳහා රෝගී යහන් 4000ක් ද, තුවාල කරුවන් සංග්‍රාම භූමියෙන් ඉවත් කර ගැනීම සඳහා බර අදින රථ 1200ක් ද සූදානම් කර තිබුණි" (කරුණාදාස, 2007, 48 පිටුව).

එමෙන් ම XVවන ලුවී රජතුමා විසින් ප්‍රංශ විප්ලවයෙන් පසු ව "මිනිසාගේ අයිතිවාසිකම්" යනුවෙන් ප්‍රකාශනයක් ද (Declaration of the Rights of man) නිකුත් කර ඇත.

1854 සිදු වූ ක්‍රිමියන් යුද්ධය හා 1859 සිදු වූ සොල්පරිනෝ සටන මානව හිතවාදී නීතිය සංවර්ධනයට බෙහෙවින් උපකාරී වී ඇති අවස්ථා දෙකක් වේ. එමෙන් ම මානව හිතවාදී නීතිය සංවර්ධනයෙහි නවත් පරිවර්තිත අවස්ථාවක් උදා කළේ, 1859 දී ඕස්ට්‍රියානු හා ප්‍රංශ-ඉතාලි හමුදාවන් අතර සිදු වූ සොල්ෆරිනෝ (Solferino) සටන ද පෙන්වා දීමට පුළුවන. එහි දී රතු කුරුස සංවිධානයේ පුරෝගාමියකු

වූ හෙන්රි ඩුනාන්ට් (Henry Dunant) විසින් 'සොල්පරිනෝ' පිළිබඳ මතකයක් '(A memory of solferino) නම් ග්‍රන්ථය ඉමහත් සේවයක් ඉටු කර ඇත. මෙම කෘතිය නිකුත් වීමෙන් පසු ව, "1863 ඔක්තෝම්බර් මාසයේ දී ජාතින් දහසය දෙනෙකුගේ සහභාගිත්වයෙන් පවත්වනු ලැබූ රැස්වීමේ දී උක්ත කමිටුව රතු කුරුසිය නිල වශයෙන් එම සංවිධානයට පදනම සකසන ලදී" (කරුණාදාස, 2007, 51 පිටුව).

ඒ අනුව 1864 ජිනීවා සම්මුතිය නමින් නීතිමය ලේඛනයක් සම්මත කරනු ලැබීය. එමගින් යුද බිමේ දී තුවාල ලත් හමුදා සෙබලුන්ගේ තත්ත්වය යහපත් කිරීම සඳහා ක්‍රියාකිරීමේ නෛතික බලය රතු කුරුසියට ලබාදුනි. ඒ අනුව සමස්ත මානව හිතවාදී නීතිය ආරම්භ වන්නේ මෙතැනිනි.

3.2.2 ජාත්‍යන්තර මානව හිතවාදී නීතිය.

මහාචාර්ය W.M. කරුණාදාසට අනුව මානව හිතවාදී නීතිය යනු, "යුද්ධයට, එහි පාර්ශ්වකරුවන්ට හා ඊට අතරමැදි වන්නා වූ සිවිල් වැසියන්ට අදාළ වූත් මානව වර්ගයාගේ ආරක්ෂාව සහ සුභ සිද්ධිය වෙනුවෙන් යෙදෙන්නා වූත් යුද නීතියේ හා මානව අයිතිවාසිකම් නීතියේ සුසංයෝගයෙන් බිහි වූ ජාත්‍යන්තර නීති පද්ධතියට අයත් එක් නීති ශාඛාවක් වන්නේ ය" (කරුණාදාස, 2007, 11 පිටුව).

ජාත්‍යන්තර වශයෙන් ක්‍රියාත්මක වන්නා වූ සෙසු නීතීන් මෙන් ම මානව හිතවාදී නීතිය ද ක්‍රියාත්මක වන්නේ ජාත්‍යන්තර වශයෙන් පවතින්නා වූ සම්මුතීන් යටතේ පවතින්නා වූ නීති රීතිවලට අනුකූලවය. එම රීතීන් මඟින් රාජ්‍යයන් චෙත බැඳීමේ යුතුකම් හා වගකීම් පවරනු ලබයි. එවැනි රීති බොහෝමයකට පදනම සකස් වන්නේ, කාලාන්තරයක් තිස්සේ භාවිත වූ සම්ප්‍රදායන් ඇසුරින්ය.

වචනාර්ථයෙන් ගත් කල "මානව හිතවාදී නීතිය" දෙවදෑරුම් ස්වභාවයකින් යුත් අදහස් දෙකක සංයෝගයකි. එනම්,

I. සදාචාරාත්මක බව.
II. නෛතික බව.

මානව හිතවාදී නීතියට අදාළ ව බිහි වී ඇති හේග් නීතිය හා ජිනීවා නීතිය යන නීති පද්ධතීන් දෙකෙහි ඇති ප්‍රාරම්භක වගන්ති ඇසුරෙන් මානව හිතවාදී නීතිය පිළිබඳ මූලික අදහසක් ලබා ගැනීමට පුළුවන. යුද්ධයට අදාළ ව බිහි වූ හේග් නීති සම්මුතියෙහි යෙදෙන "මාටෙන්ගේ වාක්‍යාංශය" (Martens clause) යනුවෙන් හැඳින්වෙන ප්‍රෙඩ්රිච් වොන් මාටෙන්ස් විසින් 1899 ගිවිසුමට ඇතුළත් කරන ලද මේ තාක් පැවත එන සියලු ම හේග් සම්මුතීන්හි 4වන වගන්තිය වශයෙන් යෙදෙන වාක්‍යාංශය මානව හිතවාදී නීතිය හැඳින්වීමට අත්වැලක් සපයයි. එනම්,"යුද්ධ නීතිය පිළිබඳ පූර්ණ නීති සංග්‍රහයක් බිහි වන තුරු මෙහි සඳහන් රෙගුලාසිවලට අන්තර්ගත නොකළ අවස්ථාවන් සම්බන්ධයෙන් ශිෂ්ට සම්මත ජාතීන් විසින් කාලාන්තරයක් තිස්සේ මානව අවශ්‍යතාවන්ට හා හෘද සාක්ෂියට අනුව භාවිත කරනු ලැබූ ව්‍යවහාරයන් ඇසුරින් බිහි වූ, ජාත්‍යන්තර නීති මූලධර්මයන්ගේ (Principles of International Law) ආරක්ෂාව හා පිහිට පැතීමට ජනතාව හා රණකාමීන් සතු අයිතිවාසිකම් (right) මෙම ගිවිසුම ප්‍රධාන පාර්ශ්වකරුවන් විසින් පිළිගනු ලබයි" (කරුණාදාස, 2007, 54 පිටුව).

මෙම වාක්‍යයෙන් අදහස් වන්නේ කිසියම් සම්මුතියක් හෝ ගිවිසුමක සඳහන් නුවූව ද සම්ප්‍රදායික ව පිළිගත් මානව හිතවාදී නීතියේ රැකවරණය ලැබීමට සිවිල් වැසියන්ට මෙන් ම රණකාමීන්ට ද අයිතියක් ඇති බවයි. මේ හා සමාන වැදගත් මූලධර්මයක් මානව හිතවාදී නීතියට අදාළ ව බිහි වූ ජිනීවා නීති සම්මුතියෙහි ද සඳහන් වේ. 1949 දී බිහි වූ ජිනීවා සම්මුති හතරෙහි ම එන එක් පොදු වගන්තියක් වේ. එය 3වන වගන්තියේ සඳහන් වේ. එනම්, "ගැටුමට සම්බන්ධ වන්නා වූ එක් එක් පාර්ශ්වකරුවන් අවම වශයෙන් එහි

දැක්වෙන ප්‍රතිපාදනයන්ට හා එම ගිවිසුමේ දැක්වෙන පොදු මූලධර්මයන්ට (general principles) අනුව ක්‍රියා කළ යුතු වන්නේය" (කරුණාදාස, 2007, 54 පිටුව).

මෙම වාක්‍යාංශ දෙකෙන් පැහැදිලි වන කාරණාවක් වන්නේ සෙසු සියලු ම නීති ක්ෂේත්‍රයන්හි දී එනම් මානව හිතවාදී නීතියේ දීත් එම නීතියට පදනම් වන්නා වූ මූලධර්ම ඉතා වැදගත් බවය. එම මූලධර්ම වැගත් වීමට බලපාන මූලික හේතු කිහිපයකි. එනම්,

I. එම මූලධර්ම මඟින් මානව හිතවාදයට අදාළ සෙසු රීතින් ක්‍රියාත්මක කිරීමට පෙලඹවීමක් ඇති කළ හැකිය.

II. එම මූලධර්ම මඟින් කල්පනා අනුමාන කළ නොහැකි අන්දමේ අදෘශ්‍යමාන අවස්ථාවන් සම්බන්ධයෙන් විසඳුම් සෙවිය හැකිය.

III. එම මූලධර්ම මඟින් මානව හිතවාදී නීතියෙහි ඉස්මතු වන ඇතැම් ඌනතා සපුරාලිය හැකිය.

IV. එකී මූලධර්ම මඟින් මානව හිතවාදී නීතියේ අනාගත සංවර්ධනයන්හි දී ගතයුතු ක්‍රියාමාර්ගයන් සම්බන්ධයෙන් යම් සහයෝගිතාවක් ලබා දිය හැකිය.

නූතන මානව හිතවාදී නීතිය ප්‍රමාණාත්මක හා ගුණාත්මක වශයෙන් ගත් කල අති විශාල නීති සමුදායකින් යුක්ත වේ. මානව හිතවාදී නීතියේ මූලධර්ම පහත ආකාරයට වර්ගීකරණයට ලක් කළ හැකිය.

i. ප්‍රාථමික මූලධර්ම (Fundamental Principles).

ii. පොදු මූලධර්ම (Common Principles).

iii. විශේෂ මූලධර්ම (Special Principles).

3.2.2.1. ප්‍රාථමික මූලධර්ම.

මානව හිතවාදී මූලධර්මයන්ට අනුව ප්‍රචණ්ඩත්වය හෝ යුද්ධය තහනම්ය. එහෙයින් යුද්ධය වූ කලි මානව හිතවාදයට නැතහොත් මානව වර්ගයාට අදාළ මූලධර්මයක් නොවේ. ඊට පටහැනි මූලධර්මයක් වන්නේ ය. ''යුද නීතියේ එන සිද්ධාන්තයන්හි මුඛ්‍ය පරමාර්ථය වන්නේ යුද්ධයෙන් පීඩාවට පත්වන්නා වූ සිවිල් ජනතාවටත්, රණකාමීන්ටත් සිදු වන්නා වූ සියලු වේදනාවන් අවම කිරීමයි" (කරුණාදාස, 2007, 57 පිටුව).

මානව හිතවාදී නීතියේ ප්‍රාථමික සිද්ධාන්ත මානව නීතිය (Human Law) ඇසුරින් බිහිවූවකි. මානව නීතිය වූ කලි යුද්ධයට අදාළ නීතිය හා මානුෂික අයිතිවාසිකම්වලට අදාළ නීති ශාඛාවන්ගේ සංයෝගයක් වේ. මෙම මානව නීතියේ පළමු සිද්ධාන්තය වන්නේ, "සාම කාලවල දී මෙන්ම යුද කාලවල දීත් සියලු ම මනුෂ්‍යයන්ගේ මානුෂික ගරුත්වය රැකෙන පරිදි එය සුරක්ෂිත කළ යුතුය යන්නයි" (කරුණාදාස, 2007, 58 පිටුව). එමෙන් ම, "යුද්ධයේ දී සතුරා මර්දනය කිරීමට හෝ දුර්වල කිරීමට අවශ්‍ය ප්‍රමාණයට වඩා වැඩි බලයක් නොයෙදිය යුතුය" (කරුණාදාස, 2007, 58 පිටුව). යනුවෙන් යෙදෙන පළමු සිද්ධාන්තය අපරාධ නීතියේදි ස්වයං ආරක්ෂාවට (Self defence) තිබෙන අයිතියට සමාන වූ රීතියකි. මෙම අයිතිය යුද්ධයට අදාළ ව කතා කරන විට සතුරු පාර්ශ්වයට හානි කිරීම හෝ කෲරත්වය හෝ හිංසනය වැනි දේවල් තුළින් සතුරාට පීඩා සිදුකිරීමට ඇති අයිතිය සීමා කෙරේ. මෙම සිද්ධාන්තය සාම්ප්‍රදායික ව මානව හිතවාදී නීතිය සංකේතවත් කෙරේ.

මානව හිතවාදී නීතියේ දෙවන සිද්ධාන්තය වන්නේ,"තුවාල වීම හෝ ආබාධිත වීම නිසා සටන් කළ නොහැකි (hors de combat) හා සෘජුව සටනට සම්බන්ධ නොවූවන්ට ගරු කළ යුතුය. ආරක්ෂා කළ

යුතුය. මිනිසත් බවින් (මානව හිතවාදීව) සත්කාර කළ යුතුය" (කරුණාදාස, 2007, 60 පිටුව).

මෙහි සමස්ත අර්ථය වන්නේ, යුද්ධයෙන් පීඩාවට පත්වන අයට වුව ද ඔවුනට පිළිගත හැකි ජීවිත පැවැත්මක් ආරක්ෂා කර ගැනීමට ඇති අයිතිය සුරක්ෂිත වන අයුරු මානව දයාවෙන් යුතුව ගරු කිරීම, ආරක්ෂා කිරීම හා සංග්‍රහ කිරීම ද කළ යුතු බවයි.

මානව හිතවාදී නීතියේ තෙවන සිද්ධාන්තය වන්නේ, "ගැටුමක (යුද්ධයක) සටන්කාමී පාර්ශ්වකරුවන්ට සතුරාට හානි කිරීමෙහි ලා සංග්‍රාම උපක්‍රම හෝ එවැනි මාධ්‍යයන් තෝරා ගැනීමේ අසීමිත අභිමතයක් නොමැත" (කරුණාදාස, 2007, 60 පිටුව).

මෙම සිද්ධාන්තයෙන් පැහැදිලි වන්නේ පුද්ගලයන්ගේ මූලික අයිතිවාසිකම් හා නිදහස එම පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වය ඵලදායි අයුරින් සංවර්ධනය කරගත හැකි ආකාරයේ වාතාවරණයක් උදා කිරීමට වගබලා ගැනීම සන්නද්ධ අරගලයක නිරත සටන්කාමී රාජ්‍යයක පවා යුතුකම වන බවයි.

3.2.2.2. පොදු මූලධර්ම.

ඕනෑම නීතියක පොදු මූලධර්ම ගොඩනැඟෙන්නේ ප්‍රාථමික මූලධර්ම පදනම් කරගෙනය. ජිනීවා නීතියටත් මානුෂික අයිතිවාසිකම් නීතියටත් පදනම් වන එවන් මූලධර්මයක් වන්නේ අනුල්ලංඝනීත්වය (Inviolability) පිළිබඳ සිද්ධාන්තයයි. මානව හිතවාදී නීතියට පොදු වූ එවැනි මූලධර්ම කිහිපයක් පවතී.

පොදු මූලධර්ම අතර පළමු මූලධර්මය වන්නේ අනුල්ලංඝනීයත්වය පිළිබඳ මූලධර්මයයි. එනම්, "සෑම පුද්ගලයෙකුටම තම ජීවිතයට භෞතික හා සදාචාරාත්මක පරිපූර්ණත්වයට හා පෞද්ගලිකත්වයට බැඳුණ ආවේණික ගුණාංගවලට ගරුකිරීමේ අයිතියක් ඇත" (කරුණාදාස, 2007, 61 පිටුව).

මෙහි දී අනුල්ලංඝනීයත්වය අදාළ සිද්ධාන්ත කිහිපයක් පමණි.

I. යුද්ධයේ දී වැටෙන පුද්ගලයෙකුගේ අයිතිය අනුල්ලංඝනීය වේ. යටත් වන සතුරාට හානි නොකළ යුතුයි.

II. වධහිංසා පැමිණීම, අවමන් කිරීම හෝ අමානුෂික දඬුවම් දීම තහනම්ය.

III. සියල්ල ම නීතිය ඉදිරියේ පුද්ගලයන් වශයෙන් පිළිගැනීමට හිමිකම් ලබන්නේය.

IV. තමන්ගේ ගරුත්වයට, තම පවුලේ අයිතිවාසිකම්වලට තම විශ්වාසයන්ට හා සම්ප්‍රදායන්ට ගරු කිරීමේ අයිතිවාසිකම් සියල්ල ම සතුය.

V. පවුලේ ඥාතීන් සමඟ ප්‍රවෘත්ති හුවමාරු කර ගැනීමට හා සහනයන් ලැබීමේ අයිතිය සියල්ලන් ම සතුය.

VI. කිසිම පුද්ගලයෙකු හිතුවක්කාර අන්දමින් තම දේපළවලින් බැහැර නොකළ යුතුය.

VII. පීඩාවෙන් පෙළෙන්නෙකුට රැකවරණයක් ලබාදිය යුතුවාක් මෙන් ම එවැන්නකුගේ තත්ත්වයට අදාළ නිසි සැලකිල්ල ද ලබාදිය යුතුය.

දෙවන මූලධර්මය ලෙස වෙනස්කම් නොකිරීමේ මූලධර්මය පෙන්වාදීමට පුළුවන. "පුද්ගලයන්ගේ වාර්ගිකත්වය, ලිංගිකත්වය, ජාතිකත්වය, භාෂාව, සමාජ තරාතිරම, ධනය, දේශපාලනය, දාර්ශනික හෝ ආගමික මතවාද හෝ වෙනත් එවැනි කිසිම මිනුම් දණ්ඩක පදනමක් මත කිසිදු විශේෂත්වයකින් තොරව සියලුම පුද්ගලයන්ට එක හා සමාන ව සැලකිය යුතුය" (කරුණාදාස, 2007, 65 පිටුව).

තුන්වන මූලධර්මය වන්නේ ආරක්ෂාව පිළිබඳ මූලධර්මයයි. පුද්ගල ආරක්ෂාව පිළිබඳ අයිතිවාසිකම් සෑම පුද්ගලයෙකුට ම සතු වෙයි. මෙම භාවිතයේ දී පැන නගින තවත් මූලධර්ම දෙකක් වේ. එනම්,

I. තමන් විසින් සිදු නොකරන ලද ක්‍රියාවකට කිසිදු පුද්ගලයකු වගකිය යුතු නොවන්නේය.

II. පළිගැනීම, සාමූහික දඬුවම් දීම, ප්‍රාණ ඇපකරුවන් වශයෙන් තබා ගැනීම හා රටින් නෙරපීම තහනම්ය.

මෙම සිද්ධාන්තයට අනුව යුද්ධයට සම්බන්ධ නොවන සිවිල් වැසියන්ගේ පළිගැනීම තහනම් වේ. ඒ අනුව ගුවනින් බෝම්බ ප්‍රහාර එල්ල කිරීම සිවිල් වැසියන්ගේ ආරක්ෂාවට තර්ජනයක් වන හෙයින් එය තහනම් වේ.

3.2.2.3. විශේෂ මූලධර්ම.

මෙහි දී පළමුවන මූලධර්මය වන්නේ ගැටුම්වලින් විපතට පත් වූවන් සඳහා යෙදෙන නීතිමය මූලධර්මයයි. ජිනීවාහි දී පිළිගත් එබඳු ප්‍රධාන මූලධර්ම තුනක් වේ. එනම්,

(i) මධ්‍යස්ථ බව හෙවත් අපක්ෂපාති බව.

මෙයින් පැන නැගෙන ප්‍රධාන සිද්ධාන්තය වන්නේ "ගැටුමක දී මානව දයාවෙන් යුතුව සහාය දැක්වීම කිසිදු ආකාරයේ මැදිහත්වීමක් හෝ අවහිරයක් (Interference) නොවන්නේය" (කරුණාදාස, 2007, 68 පිටුව) යනුවෙනි. එහිදී,

(a). වෛද්‍ය සේවාවන්ට අයත් පුද්ගලයන්ට දී ඇති විනර්මුක්තීන් හේතුවෙන් ඔවුන් සතුරු ක්‍රියාවන්හි යෙදීමෙන් වැළකිය යුතුය.

(b). රෝගීන් සුවපත් කරන්නන් වශයෙන් වෛද්‍ය වෘත්තිකයන්ට රැකවරණය හිමි වේ. මධ්‍යස්ථාන මූලධර්මයට අයත් මෙම රීතියට අනුව රණබිමේ සේවය කරන වෛද්‍යවරුන්ට හා හෙදියන්ට සැහෙන වරප්‍රසාද (privileges) දෙනු ලැබීය. මෙම රීතිය අනුව වෛද්‍ය වෘත්තිකයන්ට සහාය දක්වන හැම කෙනෙක් ම රෝග සුවපත් කරන්නන් වශයෙන් යුද බිමේදී රැකවරණය ලබති.

(c). තමන් භාරයේ සිටින තුවාලකරුවෙකු හෝ අසනීප වූවකු පිළිබඳ ව කිසියම් තොරතුරක්, එය ඔවුන්ට හෝ ඔවුන්ගේ පවුල්වල අයට හානිදායක වන බව තම මතය වන විට කිසිම ආකාරයකින් එවැනි තොරතුරක් ලබාදීමට බලපෑම් නොකළ යුත්තේය" (කරුණාදාස, 2007, 69/70 පිටුව).

(ii) ප්‍රකෘති තත්ත්වය (Normality)

ප්‍රකෘති තත්ත්වය නැතහොත් යථා තත්ත්වය පවත්වා ගැනීම ජිනීවා නීතියෙන් පිළිගන්නා දෙවන සිද්ධාන්තය වේ. එහිදී,"යුද්ධයට සම්බන්ධ නොවන ආරක්ෂිත පුද්ගලයන්ට (Protection Persons) හැකිතාක් දුරට සාමාන්‍ය ජීවිතයක් පවත්වා ගැනීමට හැකියාව ලබාදිය යුතුය" (කරුණාදාස, 2007, 70 පිටුව)

(iii) රැකවරණය (Protection)

ජිනීවා නීතියේ වැදගත් තෙවන සිද්ධාන්තය වන්නේ, රැකවරණය පිළිබඳ මූලධර්මයයි. එනම්, "තමන්ගේ බලය යටතට පත් වූ ජාතික මෙන් ම විජාතික පුද්ගලයන්ට ද රැකවරණය සැපයීමට රාජ්‍යයන් විසින් සහතික විය යුතු වේ." මෙම මූලධර්මය භාවිත වන අවස්ථා තුනකි,

(a). අල්ලා ගනු ලැබූ සිරකරුවකු ඔහු අල්ලා ගත් හමුදාවේ බලය යටතේ නොව, එම හමුදාව අයත් රාජ්‍යයේ බලය යටතට පත් වේ.

(b). සතුරා විසින් අත්පත් කරගනු ලැබූ ප්‍රදේශයන්හි මහජන සාමය හා සේවා පවත්වා ගැනීම මෙන් ම සතුරා භාර ව සිටින පුද්ගලයන්ගේ තත්ත්වය යහපත් අයුරින් පවත්වා ගැනීම ද කළ යුත්තේ ය.

(c). කිසියම් ගැටුමකදී එහි ගොදුරු බවට පත්වුවන්ට (victims) තවදුරටත් ස්වාභාවික රැකවරණය සපයන්නෙකු නොවූ විට ඔවුන් සඳහා ජාත්‍යන්තර ආරක්ෂකයකු (protector) සැපයිය යුතුය" (කරුණාදාස, 2007, 71-72 පිටුව).

විශේෂ මූලධර්මවල දෙවන මූලධර්මය වන්නේ, යුද්ධය සීමා කිරීම සම්බන්ධයෙන් යෙදෙන්නා වූ මූලධර්මයයි. එහි පළමු සිද්ධාන්තය වන්නේ, යුද්ධය සීමා කරණයයි. එහිදී, "යුධ ක්‍රියාන්විතයන්හි දී පැන නගින්නා වූ අනතුරුදායක තත්ත්වයන්ගෙන් ආරක්ෂා වීමේ අයිතිය භුක්ති විඳීමට සියලු ම සිවිල් ජනතාවට මෙන් ම සිවිල් පුද්ගලයන්ට ද හිමිවිය යුතුය" (කරුණාදාස, 2007, 27 පිටුව).

සිවිල් වැසියන්ට අදාළ මෙම රීතිය සාම්ප්‍රදායික නීතියේ හා පොදු මූලධර්මයන්හි සක්‍රීය නීතියක් ලෙසින් 1977ට පෙර සඳහන් නොවිය. එහෙත් 1977 දී ඇතිකරගත් පළමු ප්‍රොටෝකොලයෙහි 51වන වගන්තියේ පළමුවන ඡේදයේ එය සඳහන් කර ඇත. එම පොදු නීති සිද්ධාන්ත භාවිත කිරීමේ දී ඉන් පැන නගින්නා වූ රීති කිහිපයකි.

''(අ) ගැටුමක පාර්ශ්වකරුවන් විසින් සියලු ම අවස්ථාවන්හි දී සිවිල් ජනගහනය හා සිවිල් වස්තූන්ට හානි කිරීමෙන් වැළකෙනු වස් සිවිල් ජනතාව හා රණකාමීන් අතර වෙනස හඳුනා ගත යුතුය.

(ආ) සිවිල් ජනතාව හෝ සිවිල් පුද්ගලයන් පිළිගැනීම් හෝ වෙනත් එවැනි කිසිම අරමුණක් සඳහා ප්‍රහාරයක ඉලක්කයක් නොවිය යුතුය.

(ඇ) සිවිල් ජනතාව අතර නීතිය පැතිරවීමේ මූලික අභිප්‍රායෙන් යුතුව ප්‍රචණ්ඩකාරී ක්‍රියාවක් හෝ බිය ගැන්වීම් සිදුකිරීම තහනම්ය.

(ඈ) සිවිල් ජනතාවට හානි නොකරනු වස් අවම වශයෙන් අනියම් ආකාරයෙන් (Incidential) සිදු වන්නා වූ පාඩු හා තුවාල සිදු කිරීම අවම කරනු සඳහා ගැටුමක පාර්ශවකරුවන් විසින් හැකි හැම අයුරින් ම පූර්වාවධානය (Precautions) යොමු කළ යුතුය.

(ඉ) සතුරාට පහරදීම හෝ විරෝධය පෑම් (resist) කළ හැක්කේ සන්නද්ධ හමුදා සාමාජිකයන්ට පමණි" (කරුණාදාස, 2007, 73, 74 පිටුව).

යුද්ධය සීමා කිරීම සම්බන්ධයෙන් පවතින්නා වූ දෙවන සිද්ධාන්තය වන්නේ ප්‍රහාරයක් එල්ල කිරීම සම්බන්ධයෙන් සීමා පැනවීමයි. එනම්, "ප්‍රහාරයක් එල්ල කිරීම් වැඩි වශයෙන්/නියත වශයෙන් ම (strictly) අභිප්‍රායක් (Objectives) සඳහා විය යුතුය" (කරුණාදාස, 2007, 74 පිටුව). යනුවෙනි. එය 1977 සම්මත ප්‍රෝටොකෝල 1හි 52වන වගන්තියේ 2 ඡේදයෙහි යුදමය අභිප්‍රායන් යටතේ සවිස්තරාත්මක ව දක්වා ඇත. මෙම සිද්ධාන්තය ප්‍රායෝගික ව යෙදීමේ දී යෙදෙන රීතීන් කිහිපයක් වේ. එනම්,

"(අ) අනාරක්ෂිත ප්‍රදේශවලට (Localities) ප්‍රහාර එල්ල කිරීම තහනම්ය.

(ආ) විද්‍යාව හෝ පුන්‍යායතන සඳහා වෙන් වූ ගොඩනැගිලිවලට එරෙහි ව මනුෂ්‍යයන්ගේ සංස්කෘතික හෝ ආධ්‍යාත්මික උරුමයන්ගෙන් සංස්ථාපිත ඓතිහාසික ගොඩනැගිලි, කලා කෘතීන් හෝ වන්දනීය පූජනීය වූ ආගමික ස්ථානවලට එරෙහි ව කිසියම් හෝ සතුරු ක්‍රියාවක් කිරීම තහනම්ය.

(ඇ) සිවිල් ජනතාවට අනතුරුදායක වන්නා වූ බලවේගයන් (forces) මුදා හරින්නා වූ ස්ථාපිත යන්ත්‍රෝපකරණ හෝ එවැනි කෘත්‍යයන්ට (work and miltary installation) ප්‍රහාර එල්ල කිරීම තහනම්ය.

(ඈ) ප්‍රහාරයන්ගෙන් යුදමය අභිප්‍රායයන් නැතහොත් වස්තූන් (objections) ආරක්ෂා කිරීම සඳහා ජනතාව පළිහක් (ආවරණයක්) වශයෙන් යොදා ගැනීම නොකළ යුතුය.

(ඉ) සිවිල් වස්තූන් (නැතහොත් සිවිල් ඉලක්ක) ප්‍රහාරයකට හෝ පළිගැනීමට නතු නොවිය යුතුය.

(ඊ) කොල්ලකෑම (pillage) තහනම්ය" (කරුණාදාස, 2007, 75-76 පිටුව).

සීමාකිරීම සම්බන්ධයෙන් පවතින්නා වූ තෙවන සිද්ධාන්තය වන්නේ යුද අවි, යුද උපක්‍රම සහ සීමාකරණය සම්බන්ධයෙන් සීමා පැනවීමයි. එහි සිද්ධාන්තයට අනුව, "වැඩිමනක් හානි (superfous injury) හා අනවශ්‍ය පීඩාවන් ඇතිකිරීමට හේතුවන ස්වභාවයේ යුද අවි සහ යුද උපක්‍රමයන් කිසිවෙකුටත් එරෙහිව භාවිත කිරීම සිදු කිරීම තහනම්ය" (කරුණාදාස, 2007, 77 පිටුව).

මෙම සිද්ධාන්තය ප්‍රායෝගික වශයෙන් යෙදෙන රීති කිහිපයක් වේ. එනම්,

i. අවිචාර පහරදීම් සිදුකිරීම තහනම්ය.

ii. සිවිල් වැසියන්ට හා සිවිල් අභිප්‍රායන්ට (objects) සීමා හා හානි සිදුකළ හැකියි බලාපොරොත්තු විය හැකි ප්‍රහාර අපේක්ෂිත යුද්මය වාසියේ සීමාව ඉක්මවා යන්නේ නම් එවැනි ප්‍රහාර තහනම්ය.

iii. සංග්‍රාමයේ දී ස්වාභාවික පරිසරය ආරක්ෂා කිරීම කෙරෙහි සැලකිල්ලක් දක්විය යුතුය.

iv. යුද උපක්‍රමයක් වශයෙන් සිවිල් ජනතාව නිරාහාර ව තැබීම තහනම්ය.

v. ද්‍රෝහිකම (perfidy) පදනම් කරගෙන යුද්ධ ක්‍රියාවන්හි නිරතවීම තහනම්ය" (කරුණාදාස. 2007, 79 පිටුව).

මෙම සිද්ධාන්තවලින් පැහැදිලි වැදගත් ම කරුණක් වන්නේ, මානව හිතවාදී නීතිය යුද්ධය විධිමත් ව හැසිරවීමටත්, යුද්ධයෙන් වන පීඩාව අවම කිරීමටත් අරමුණු කර ගන්නා නීති පද්ධතියක් බවයි. මෙම නීති පද්ධතිය මානුෂික අයිතිවාසිකම් නීතිය මෙන් සාම කාලයේ දී නොව යුද්ධ කාලයේ දී යෙදෙන බැවින් මානව හිතවාදී නීතිය ඇතැම්විට යුද නීතිය වශයෙන් ද සන්නද්ධ අරගලවලට අදාළ නීතිය වශයෙන් ද බොහෝ විට හඳුන්වනු ලැබේ.

3.3 අපරාධය හා යුද අපරාධ.

3.3.1. අපරාධයක් යනු කුමක්ද?

යුද අපරාධ පිළිබඳ ව අවධානය යොමු කිරීමේ දී එය සමාජ විද්‍යාත්මක දෘෂ්ටිකෝණයකින් අධ්‍යයනය කිරීම ඉතා වැදගත් වේ. එහිදී යුද අපරාධ යන්න සමාජමය සහ නීතිමය සංසිද්ධියක් ලෙස හඳුනාගත හැකිය. එමෙන් ම යුද අපරාධ යන්න ඉතාමත් ගැඹුරු හා පුළුල් සංකල්පයක් ලෙස පෙන්වා දීමට පුළුවන්ය. එයට ප්‍රධාන හේතුව වන්නේ, යුද අපරාධ සඳහා ඓතිහාසික ක්‍රියාවලියක් ද සෑම මානව සමාජයක ම, එනම් ගෝත්‍රික, සාම්ප්‍රදායික සහ නූතන සමාජ තුළ ද යම් අපරාධයක දී එම අපරාධ සිදු කරන්නා, ඊට ගොදුරු වන්නා සේ ම නීතිය, සිරිත සහ දඬුවම යන සංකීර්ණ ක්‍රියාවලීන් සමුදායකින් සමන්විත වන බැවින්ය. එහෙයින් යුද අපරාධ පිළිබඳ අවධානය යොමු කිරීමේ දී අපරාධය යන්න අර්ථ දක්වා සිටීම ඉතා වැදගත්ය. "නීතිමය සහ අපරාධ විද්‍යාත්මක විග්‍රහයන් තුළ අපරාධ යන්න වචන කිහිපයකින් විග්‍රහ කිරීමට ගොඩනැගුණු නිර්වචන හඳුනාගත නොහැකිය. ඒ පිළිබඳ ව ඇති නිර්වචන ඉතාමත් සංකීර්ණ ස්වරූපයක් ගන්නා බැවින් අපරාධයක් යන්න පහසුවෙන් විග්‍රහ කර ගැනීම දුෂ්කර කරුණක් බවට පත් ව තිබේ. ඉංග්‍රීසි භාෂාවෙන් අපරාධය යන්න හඳුන්වා ඇත්තේ Crime යන වචනයෙනි" (කරුණාතිලක, 1998, 11 පිටුව).

ඒ අනුව Crime යන්න "නීති විරෝධී ක්‍රියාව, නීති කඩකිරීමක්" ලෙස මලලසේකර ඉංග්‍රීසි සිංහල ශබ්ද කෝෂයේ දක්වා ඇත. (මලලසේකර. 2002, ඉංග්‍රීසි සිංහල ශබ්ද කෝෂය, 259 පිටුව).

මහාචාර්ය නන්දසේන රත්නපාලට අනුව "අපරාධය" යන්න විග්‍රහ කිරීමට මාර්ග දෙකක් ඇත. එයින් පළමු වැන්න වන්නේ, නෛතික දෘෂ්ටි කෝණය ඔස්සේ අපරාධය දෙස බැලීමයි. දෙවැන්න සමාජීය දෘෂ්ටිය ඔස්සේ අපරාධය යන්න විග්‍රහ කිරීමයි. ඒ අනුව, "මින් පළමුවන දෘෂ්ටි කෝණය අප විසින් ප්‍රයෝජනයට ගතහොත්

අපරාධයක් යනු පණවන ලද අපරාධ නීතිය කඩා බිඳ දමන මිනිස් ක්‍රියාවක් හැටියට හඳුන්වා දිය හැකිය" (රත්නපාල, 1990, 09 පිටුව). "නීතිමය අර්ථකතනයට අනුව අපරාධය යනු ව්‍යවස්ථාපිත අපරාධ නීතිය උල්ලංඝනය කිරීමයි" (රත්නපාල, 1990, 10 පිටුව).

අපරාධය නැමැති ක්‍රියාවේ ඓතිහාසික පදනම පිළිබඳ විමසා බැලීමේ දී, එය ප්‍රාථමික සමාජය කරා දිව යයි. "ප්‍රාථමික සමාජ අපරාධයක් යනුවෙන් සලකනු ලැබුයේ පෞද්ගලික වැරැද්දක් සහ පළිගැනීමේ ක්‍රියාවක් ලෙසයි" (කරුණාතිලක, 1998, 12 පිටුව).

එහෙත් මානව සමාජ ක්‍රමයෙන් පරිණාමයට පත් වීමත් සමඟ ම විවිධ සමාජ යුගවල දී අපරාධ ක්‍රියාවන් සම්බන්ධයෙන් විවිධ නීති ගොඩනඟා ගෙන ඇත. "ක්‍රිස්තු පූර්ව 1900 දී පමණ බැබිලෝනියාවේ "හමුරාබි" නීති සංග්‍රහය (code of Hammurabhi) නමින් නීති පද්ධතියක් ගොඩ නැඟුණි. එය පිළිගැනීමේ මූලධර්මය මත පදනම් කර ගත්තකි. එනම් ඇසට ඇසත්, දතට දතත් යන අදහස එහි දැකිය හැකි විශේෂ ලක්ෂණයකි. හිබෲ සමාජයේ (Hebrew society) මොසැයික් නීතිය (Mosaic Law) න්‍යාත්මක ස්වභාවයකින් වර්ධනය විය" (කරුණාතිලක, 1998, 12 පිටුව).

මේ ආකාරයට විමසා බලන විට යම්කිසි සමාජ විරෝධී ක්‍රියාවක් සමාජයක් තුළ දැඩි කම්පනයක් ඇති කරන්නේ නම්, එය අපරාධයක් ලෙස අර්ථ දැක්වීමට පුළුවන. ඒ අනුව අපරාධයක් යනු අපරාධ නීතියෙන් තහනම් කරන ලද චර්යාත්මක ක්‍රියාවකි. එම නීතිය පනවනු ලබන්නේ යම්කිසි රජයක් වැනි දේශපාලන බලායතනයක් මඟින්ය. අපරාධයක් කළ විට ඊට සාපේක්ෂ ව හිමි වන්නා වූ දණ්ඩනය ද එම නීතිය තුළ ම සඳහන් කොට ඇත.

"ටැපන් නැමති නීතිවේදී සමාජ විද්‍යාඥයා පවසන අන්දමට අපරාධයට ලබා දිය හැකි වන්නේ නෛතික විවරණයක්ය. එය,

(a) අපරාධ නීතිය උවමනාවෙන් ම උල්ලංඝනය කිරීමක් හෝ පැහැර හැරීමකි.

(b) එය සිදු කිරීම අරභයා දක්විය හැකි යුක්ති සහගත බවක් හෝ ඒ ක්‍රියාවට හේතුවක් ඉදිරිපත් කළ නොහේ.

(c) රජය විසින් මේ (අපරාධය සිදු කිරීමේ) වරද බරපතල අපරාධයක් හෝ සුළු අපරාධයක් ලෙස සලකනු ලැබේ" (රත්නපාල, 1990, 14 පිටුව).

අපරාධය, නීතියේ සහ නීති ශාස්ත්‍රයේ නිර්වචනය කර ඇත්තේ "නීතියෙන් සුවිශේෂී ව තහනමට ලක් කොට ඇති යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක්" (කරුණාතිලක, 1998, 13 පිටුව) ලෙසින්ය.

ඒ අනුව අපරාධයක් සිදු වූ විට ඊට දඬුවමක් ද අන්තර්ගත වන බව මෙම නිර්වචනයෙන් පැහැදිලි වේ. එමෙන් ම අපරාධය පිළිබඳ ව නීතිමය දෘෂ්ටි කෝණයෙන් නිර්වචන ඉදිරිපත් කරන ඩී.ආර්. ටැප්ට් (Donald R. Taft) පෙන්වා දෙන්නේ,"සමාජ සම්මත නීති කැඩීම පෙරලා සමාජයට අහිතකර ආකාරයෙන් බලපාන බැවින් එම සමාජ විරෝධී චර්යාව අපරාධ ලෙසින් පවතින නීතිය විසින් සලකනු ලබයි" (කරුණාතිලක, 1998, 14 පිටුව). යනුවෙන්ය. මෙම නිර්වචනය පිළිබඳ ව සලකා බලන විට අපරාධය යන්නට ගතිකත්වයක් එක් වී ඇත. එහිදී ඕනෑ ම සමාජයක් වෙනස්වීමත් සමඟ එහි ඇති සමාජ සම්මත නීති රීතීන් ද වෙනස්වීමට ලක් වේ. එම නීතීවලට පටහැනි ව කටයුතු කිරීම අපරාධයක් වේ. ඒ අනුව සමාජයක පැවැත්මට හේතු වන්නා වූ පුද්ගල ක්‍රියා අපරාධ ලෙස පවතින නීතිය තුළින් තහනමට ලක් කළ යුතු බවත්, එම ක්‍රියාවන් අපරාධ ලෙස සැලකිය හැකි බවත් ඩී. ආර්. ටැප්ගේ අදහස වේ.

එලියට් නැමති විද්‍යාඥයා දක්වන අන්දමට අපරාධ, නීති ක්ෂේත්‍රයට අදාළ ව විග්‍රහ කළ යුතුය. ඒ අනුව,"අපරාධ යනු, නීතියෙන්

නොකළ යුතු යැයි සඳහන් කරන ලද ක්‍රියාවක් හෝ නොසැලකිලිමත් ලෙස පැහැර හරිනු ලැබූ ක්‍රියාවකි" (රත්නපාල, 1990, 14 පිටුව).

මේ අනුව අපරාධ යනු කුමක්දැයි අපට අවබෝධ කර ගත හැකිය. එහිදී අපරාධය අර්ථ දක්වීමට නීතිය යන්න ප්‍රධාන මෙවලම ඒ අනුව සමස්ත නීති ක්ෂේත්‍රය (Law) දෙකකට බෙදා දැක්වීමට පුලුවන. එනම් සිවිල් නීතිය (Civil Law) සහ අපරාධ නීතිය (Criminal Law) වශයෙන්ය. මෙහිදී ප්‍රධාන වශයෙන් අපගේ අවධානයට යොමු වන්නේ අපරාධ නීතිය සම්බන්ධයෙන්ය. "අපරාධ නීතියේ ප්‍රධාන අරමුණ වන්නේ අපරාධයක් සංයුක්ත වන අංග නිර්වචනය කිරීම, අපරාධයක් සඳහා දිය යුතු දඬුවම් තීරණය කිරීම, අපරාධ වැළැක්වීම සඳහා ක්‍රියා කිරීමයි. ශ්‍රී ලංකා අපරාධ නීතියේ හරයාත්මක අංශය දණ්ඩ නීති සංග්‍රහයේ ඇතුළත් විධානවල අඩංගු වී තිබේ" (ගුණරත්න, 2009, 29 පිටුව).

අන්තර්ජාතික අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාවේ උසාවියේ අධිකරණ බලය සමස්තයක් වශයෙන් අන්තර්ජාතික ප්‍රජාවේ අවධානයට ලක්වන ඉතාමත් බරපතල ආකාරයේ අපරාධවලට සීමා විය යුතු බවට දක්වා ඇත. ඒ අනුව උසාවියේ අධිකරණ බලය යටතට අපරාධ කිහිපයකි.

(අ) ජන ඝාතන පිළිබඳ අපරාධ.

(ආ) මානව වර්ගයාට එරෙහි අපරාධ.

(ඇ) යුද අපරාධ.

(ඈ) ආක්‍රමණයේ අපරාධ.

3.3.2 යුද අපරාධ.

මනුෂ්‍ය ජීවිත ඉතා වටින්නේය. ලෝකයේ ඇති භෞතික වස්තූන්ට මිලක් තැබිය හැකි වුවත්, මනුෂ්‍ය ජීවිතවලට එවැනි මිලක් තැබිය නොහැකිය. නමුත් යුද්ධය නොවැළැක්විය හැක්කකි. එම නිසා යුද්ධයක දී සිදුවන විනාශය ද ඉතාමත් ඉහළය. එසේ වුවත් යුද වැදුණු ඇතැම් ජාතීන් නැතහොත් මනුෂ්‍ය කණ්ඩායම් යුද්ධයේ දී සිදුවන විනාශයන් වළක්වා ගැනීමට ඓතිහාසික යුගයේ පටන් ක්‍රියාකර ඇත."සාම්ප්‍රදායික යුද නීතිය (Laws and / customs of war) යනුවෙන් පසුකාලයේ දී සහතික කරනු ලැබූ නීති රීති සමුදායක් බිහි වී තිබීම මීට හොඳම නිදසුනකි. සාම්ප්‍රදායික ව පිළිගැනුණු මෙකී යුද නීතියට නවතම නීති ශාඛාවක් එක්වනු දහනව වන සියවසේ පටන් සුලභව දක්නට ලැබේ. ඓතිහාසික යුගයේ පටන් ම යුද්ධයට අදාළ ව විකාශය වූ මෙකී සම්ප්‍රදායික හා නවතම නීති ශාඛාවන් දෙකට යුද නීතිය (Laws of war) වශයෙන් හඳුන්වනු ලැබුව ද, අද එය වඩාත් ජනප්‍රිය ලෙසින් හඳුන්වන්නේ මානව හිතවාදී නීතිය යනුවෙන්ය" (කරුණාදාස, 2007, 12 පිටුව).

මහාචාර්ය කරුණාදාස දක්වන ආකාරයට, "මානව හිතවාදී නීතිය යනු යුද්ධයට, එහි පාර්ශවකරුවන්ට හා ඊට අතරමැදිවන්නා වූ සිවිල් වැසියන්ට අදාළ වූත් මානව වර්ගයාගේ ආරක්ෂාව සහ ශුභ සිද්ධිය වෙනුවෙන් යෙදෙන්නා වූත් යුද නීතියේ හා මානව අයිතිවාසිකම් නීතියේ සුසංයෝගයකින් බිහි වූ ජාත්‍යන්තර නීති පද්ධතියට අයත් එක් නීති ශාඛාවක් වන්නේය" (කරුණාදාස, 2007, 11 පිටුව).

මානව හිතවාදී නීතිය හඳුනා ගැනීමේ දී වඩාත් වැදගත් වන්නේ උක්ත පටු අර්ථකථනයකට වඩා පුළුල් අර්ථකථනයකි. එය පුළුල් ව ගත්විට, "ජාත්‍යන්තර මානව හිතවාදී නීතිය යනු පුද්ගලයන්ට ගරුකිරීම හා ඔවුන්ගේ දියුණුව ප්‍රවර්ධනය කිරීමෙහි ලා ව්‍යවස්ථාපිත (සම්මුතීන්) හා පොදු නීතිය ඇතුළු සෙසු ජාත්‍යන්තර

ප්‍රතිපාදනයන්ගෙන් සමන්විත වූ නීතියක් වන්නේය" (කරුණාදාස, 2007, පිටුව 14).

මේ අර්ථයෙන් ගත් විට නූතන මානව හිතවාදී නීති ශාඛා දෙකකින් යුක්ත වේ. එනම්,

(i) යුද නීතිය (The Law of war).

(ii) මානුෂික අයිතිවාසිකම් නීතිය (The Law of Human Rights).

යුද නීතිය නැතහොත් සන්නද්ධ ගැටුම්වලට අදාළ නීතිය පුළුල් අර්ථයෙන් ගත් කල එයින් අදහස් වන්නේ යුද්ධමය අවශ්‍යතාවන් විසින් ඉඩදෙනු ලබන තාක් යුද පාර්ශවකරුවන්ගේ අසීරුතාවන් තුනී කිරීම හා එදිරිවාදිකම් පාලනය කිරීමයි. මහාචාර්ය කෙල්සන් හා වෙනත් සාම්ප්‍රදායික විද්වතුන්ට අනුව, "යුද්ධයට අදාළ නීතිය හා සම්ප්‍රදාය උල්ලංඝනය කිරීම යනු යුද අපරාධයක්" (කරුණාදාස, 2007, 164 පිටුව). ලෙස දක්වා ඇත. මේ අනුව යුද අපරාධයක් යනු ජාත්‍යන්තර නීතිය උල්ලංඝනය කිරීමෙන් සිදු කරනු ලබන අපරාධයක් ලෙස සරල ව හැඳින්විය හැකිය. යුද අපරාධ යන්න ඉංග්‍රීසි භාෂාවෙන් යෙදෙන්නේ War Crime ලෙසයි. මලලසේකර ශබ්ද කෝෂයට අනුව War Crime යනු, "අන්තර්ජාතික යුද නීතිය උල්ලංඝනය කිරීම" (මලලසේකර, 2002, ඉංග්‍රීසි සිංහල ශබ්ද කෝෂය, 1164 පිටුව) ලෙස දැක්වීමට පුලුවන.

යුද අපරාධ පිළිබඳ හඳුනාගැනීමෙහි ලා වඩාත් උචිත වන්නේ විවිධ ශාස්ත්‍රඥයන් විසින් සිදු කර ඇති අර්ථකථනයන් කිහිපයක් පිළිබඳ ව අවධානය යොමු කිරීමයි. මහාචාර්ය ගශින්ස් දක්වන ආකාරයට යුද අපරාධ ගණයට අයත් වන්නේ, "සන්නද්ධ හමුදා සාමාජිකයින් විසින් සංග්‍රාම නීතිය මඟින් පිළිගත් නීති උල්ලංඝනය කිරීමත්, සතුරු හමුදාවන් විසින් හා සන්නද්ධ හමුදාවන්ට අයත්

නොවන සිවිල් පුද්ගලයන් විසින් නීති විරෝධී සටන්වල නිරත වෙමින් කඩාකප්පල් ක්‍රියාවන් කිරීම, ඔත්තු බැලීම, යුද ද්‍රෝහී වීම, අයුතු පෙලඹවීම් කිරීම හා කොල්ලකෑම් වැනි ක්‍රියාවන්හි නිරත වීමයි" (කරුණාදාස, 2007, 165 පිටුව).

ඒ අනුව යුද අපරාධයක් යනු යුද නීතිය උල්ලංඝනය කිරීමෙන් සිදු කරන්නක් බව යුද්ධමය පාර්ශ්වයන් විසින් පිළිගන්නේ නමුදු එය නූතනයේ නිල වශයෙන් හා අධිකරණාත්මක වශයෙන් පිළිගනු ලබන්නේ ඊට වඩා පුළුල් අර්ථයකිනි. මෙහිදී යුද අපරාධයක් ලෙස අර්ථ දක්වන්නේ යුද නීතිය උල්ලංඝනය කිරීම පමණක් නොව යුද අපරාධ ගණයට කෲරත්වය, ද්‍රෝහිකම් කිරීම, දේපළ කොල්ලකෑම් වැනි ම්ලේච්ඡ ක්‍රියාවන් සමගින් තහනම් අවි භාවිතය, තුවාල ලත් රෝගී වූ වෘත්තිකයන්ට වෙනස්කම් කිරීම, යටත් වූ සොල්දාදුවන් ඝාතනය කිරීම, ප්‍රාණ ඇපකරුවන් ඝාතනය කිරීම වැනි පුළුල් පරාසයක් දක්වා ගමන් කරන්නක් වේ.

මීළඟට අපගේ අවධානය යොමු කළ යුත්තේ ජාත්‍යන්තර නීතිය විසින් පිළිගත් ඉහත සඳහන් යුද අපරාධවලට අමතර ව ජාත්‍යන්තර වශයෙන් නූතනයේ පිළිගත් වෙනත් අපරාධ මොනවාද? යන්නයි. මෙවැනි විමර්ශනයක් අවශ්‍ය වන්නේ IIවන ලෝක යුද්ධයෙන් පසුව පවත්වන ලද අධිකරණ විනිශ්චයන් සමඟ විවිධ අන්දමින් යුද අපරාධ හඳුන්වා ඇති බැවින්ය. එවැනි එක් වැදගත් අවස්ථාවක් වන්නේ IIවන ලෝක යුද්ධයේ යුද අපරාධකරුවන්ට දඬුවම් පැමිණ වීම සඳහා පවත්වන ලද නියුරම්බර්ග් නඩු විභාගයයි. මෙම නඩු විභාගයේ දී සාම්ප්‍රදායික ව හඳුනාගත් යුද අපරාධවලට අමතර ව හඳුනාගත් තවත් අපරාධ වර්ග තුනකි.

"(i) සාමයට එරෙහි අපරාධ
(ii) යුද අපරාධ
(iii) මානව වර්ගයාට එරෙහි අපරාධ" (කරුණාදාස, 2007, 168-170 පිටුව).

මේ අනුව යුද අපරාධ සම්බන්ධ ව සවිස්තරාත්මක අර්ථකථනයක් නියුරම්බර්ග් වාර්තාවේ IVවන මූලධර්මය යටතේ සඳහන් කර ඇත. නියුරම්බර්ග් නීතියට අනුව යුද අපරාධයක් යනු, "යුද නීතිය හා සිරිත් විරිත් උල්ලංඝනය කිරීම පමණක් නොව සිවිල් ජනතාව ඝාතනය කිරීම, ඔවුනට අයුතු අයුරින් සංග්‍රහ කිරීම, බලහත්කාරයෙන් වැඩ ගැනීම, යුද සිරකරුවන්ට අනිසි ලෙස සැලකීම, ප්‍රාණ ඇපකරුවන් ඝාතනය කිරීම, මහජන දේපළ විනාශ කිරීම, හේතු විරහිත ව නගර ගම් දනව් විනාශ කිරීම ද යුද අපරාධ වේ" (කරුණාදාස, 2007, 168-169 පිටුව).

මේ අනුව සලකා බලන කල යුද අපරාධ යන්න ඉතා පුළුල් ලෙස විහිදී යන විෂය පථයක් ලෙස අපට හඳුනා ගැනීමට පුළුවන. එහිදී වර්ග ඝාතනය ද යුද අපරාධයක් ලෙසට සැලකීමට පුලුවන. වර්ග ඝාතනය යන්නෙන් අදහස් කරන්නේ ජාතියක්, වර්ගයක්, වංශයක් හෝ ආගමික කණ්ඩායමක් සම්පූර්ණයෙන් ම හෝ කොටසක් විනාශ කිරීමේ අරමුණෙන් සිදු කරනු ලබන කණ්ඩායමක සාමාජිකයන් මැරීම, කණ්ඩායමක සාමජිකයන් බරපතල ශාරීරික හෝ මානසික හානි සිදු කිරීම, කණ්ඩායම සම්පූර්ණයෙන් ම හෝ කොටසක් කායික ව විනාශ කිරීම ඉලක්ක කර ගෙන ජීවත් වීමේ තත්ත්වයන්ට සිතාමතා ම හානි පැමිණවීම, කණ්ඩායම තුළ උපත් වැතිවීම වැළැක්වීමේ අදහසින් නීති පැනවීම හා කණ්ඩායමක ළමයින් බලහත්කාරයෙන් වෙනත් කණ්ඩායමකට පැවරීම ආදියයි.

අන්තර්ජාතික අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාවේ 8 වන වගන්තිය මඟින් යුද අපරාධ පිළිබඳ ව විග්‍රහ කොට ඇත. 1949 අගෝස්තු 12වන දා ජිනීවා සම්මුතිය බරපතල ලෙස උල්ලංඝනය කිරීම, එනම් අදාළ ජිනීවා සම්මුතිවල ප්‍රතිපාදනයන් යටතේ ආරක්ෂා කරන ලද පුද්ගලයන් හෝ දේපළවලට එරෙහි ව සිදු කෙරෙන අපරාධ යුද අපරාධ ලෙස දැක්වීමට පුළුවන. ඒ අනුව පහත දැක්වෙන ක්‍රියාවන් යුද අපරාධ ලෙස විග්‍රහ කිරීමට පුළුවන.

"(අ) (i) සිතාමතා මිනිසුන් මැරීම.

(ii) ජෛව විද්‍යාත්මක පර්යේෂණ ඇතුළත් වද හිංසා පැමිණවීම හෝ අමානුෂික ලෙස සැලකීම.

(iii) සිතාමතා ම විශාල වේදනාවක් ඇති කිරීම හෝ සිරුරට හෝ සෞඛ්‍යයට බරපතල හානි සිදු කිරීම.

(iv) හමුදා කටයුතු සඳහා අවශ්‍යතාවයකින් හේතු යුක්ති කළ නොහැකි හා නීති විරෝධී ව හා හිතුවක්කාර ලෙස සිදු කළ විශාල වශයෙන් දේපළ විනාශ කිරීම හා අත්පත් කර ගැනීම.

(v) යුද සිරකරුවෙකුට හෝ ආරක්ෂා කළ වෙනත් පුද්ගලයෙකුට සතුරු බලයේ හමුදාවන්හි සේවය කිරීමට බල කිරීම.

(vi) යුද සිරකරුවෙකුට හෝ ආරක්ෂා කළ වෙනත් පුද්ගලයෙකුට සිතා මතාම සාධාරණ හා විධිමත් නඩු විභාගයක් ලබා නොදීම.

(vii) නීත්‍යානුකූල නොවන ලෙස පිටුවහල් කිරීම හෝ මාරු කිරීම හෝ නීත්‍යානුකූල නොවන සිරගත කිරීම.

(viii) ප්‍රාණ ඇපකරුවන් ගැනීම.

(ආ) ජාත්‍යන්තර නීතියේ ස්ථාපිත රාමුව තුළ ජාත්‍යන්තර සන්නද්ධ ගැටුමක දී යෙදෙන නීති හා සම්ප්‍රදායන් බරපතල ලෙස උල්ලංඝනය කිරීම්, එනම් පහත සඳහන් කුමන ක්‍රියාවක් හෝ සිදු කිරීම,

I. සිවිල් ජනතාව හෝ එවැනි එදිරිවාදිකම්වලට සෘජු සම්බන්ධයක් නැති සාමාන්‍ය පුද්ගලයන්ට එරෙහි ව සිතාමතා ම ප්‍රහාර එල්ල කිරීම.

II. සාමාන්‍ය දේවලට එනම් හමුදාමය අරමුණු නොවන දේවලට හිතාමතා ම ප්‍රහාර එල්ල කිරීම.

III. එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට අනුකූල ව මානුෂිකවාදී ආධාර හෝ සාම සාධක මෙහෙයුමක යෙදී සිටින පුද්ගලයන්, ආයතන, ද්‍රව්‍ය, ඒකක හෝ වාහන සන්නද්ධ ගැටුම් පිළිබඳ ජාත්‍යන්තර නීතිය යටතේ සාමාන්‍ය ජනතාවට හෝ සාමාන්‍ය ජනතාව පරිහරණය කරන දේවලට ලබා දී ඇති රැකවරණයට හිමිකම් කිබියදීත් හිතාමතා ම ප්‍රහාර එල්ල කිරීම.

IV. සාමාන්‍ය ජනතාවගේ ජීවිතයට හෝ සාමාන්‍ය ජනතාවට තුවාල හෝ සාමාන්‍ය ජනතාව පරිහරණය කරන දේ වලට හානියක් වන හෝ අපේක්ෂා කරන සෘජු හා සත්‍යාම වූ හමුදාමය සමස්ත වාසියට, සාපේක්ෂව, ස්වභාවික, පරිසරයට පැහැදිලිව ම සීමාන්විත පුළුල් දීර්ඝ කාලීන හා බරපතල හානියක් අහම්බෙන් විය හැකි බව හෝ දැනුවත්ව සිතාමතාම ප්‍රහාර එල්ල කිරීම.

V. අපේක්ෂා නොකළ හෝ හමුදාමය ඉලක්ක නොවන නගර, ගම්, නිවාස හෝ ගොඩනැගිලිවලට බෝම්බ දැමීමෙන් හෝ වෙනත් කුමන ආකාරයකින් හෝ ප්‍රහාර එල්ල කිරීම.

VI. තම ආයුධ බිම තැබූ හෝ ආරක්ෂාවීමේ මාර්ගයක් නැවදුරටත් නැති සටන්කරුවෙකු කැමැත්තෙන්ම යටපත් වූ පසු මරා දැමීම හෝ තුවාල කිරීම.

VII. මරණයට හෝ පුද්ගලයින්ට බරපතල තුවාල සිදු කෙරෙන ආකාරයට සටන් විරාමයක කොඩියක් හෝ සතුරාගේ හෝ එක්සත් ජාතීන්ගේ හමුදා ලාංඡන සහ නිල ඇඳුම් මෙන්ම ජිනීවා සම්මුතියේ සුවිශේෂ සලකුණු නුසුදුසු ආකාරයට යොදා ගැනීම.

VIII. අත්පත් කරගත් බලවතා විසින් එසේ අල්ලාගත් භූමි ප්‍රදේශයට තමන්ගේ ම ජනතාවගේ කොටස් සෘජු ව හෝ වක්‍රව හෝ මාරු කර යැවීම හෝ අල්ලාගත් භූමි ප්‍රදේශයේ ජනතාවගෙන් කොටසක් හෝ සියලු දෙනා ම එම භූමි ප්‍රදේශය තුළ ම හෝ ඉන් පිටතට පිටුවහල් කිරීම හෝ මාරු කිරීම.

IX. ආගමික, අධ්‍යාපනික, කලාව, විද්‍යාව හෝ පුණ්‍ය කටයුතු, ඓතිහාසික ස්මාරක, රෝහල් සඳහා වෙන් වූ ගොඩනැගිලි සහ රෝගී සහ තුවාල වූවන් රඳවා සිටින ස්ථානවලට, ඒවා හමුදාමය අරමුණු සඳහා නොවන්නේ නම්, සිතාමතා ම සෘජුව ම ප්‍රහාර එල්ල කිරීම.

X. විරුද්ධ පාර්ශ්වයේ බලයේ සිටි පුද්ගලයන්, අදාළ තැනැත්තාගේ වෛද්‍ය, දන්ත වෛද්‍ය හෝ රෝහල් ප්‍රතිකාර සඳහා කුමන ආකාරයෙන් හෝ හේතු යුක්ති කළ නොහැකි හෝ ඔහුගේ හෝ ඇයගේ යහපත සඳහා නොවන සහ එවැනි පුද්ගලයාගේ හෝ පුද්ගලයන්ගේ සෞඛ්‍යයට බරපතල හානි විය හැකි හෝ ඔවුන් මරණයට පත් විය හැකි කුමන ආකාරයේ හෝ කායික විකෘතියකට හෝ වෛද්‍ය හෝ විද්‍යාත්මක පරීක්ෂණයකට ලක් කිරීම.

XI. සතුරු ජාතියට හෝ හමුදාවට අයත් වන පුද්ගලයන් ද්‍රෝහීන් ලෙස මරා දැමීම හෝ තුවාල සිදු කිරීම.

XII. අනුකම්පාවක් නොදක්වන බව ප්‍රකාශ කිරීම.

XIII. යුද්ධයේ අවශ්‍යතාවන් සඳහා ම විනාශ කිරීම හෝ අත්පත් කර ගැනීම හෝ විය යුතු වන්නේ නම් හැර සතුරාගේ දේපළ විනාශ කිරීම හෝ අන්සතු කර ගැනීම.

XIV. සතුරු පාර්ශ්වයේ ජාතියේ අයිතීන් හා ක්‍රියාවන් අහෝසි කළ බව, අත්හිට වූ බව හෝ අධිකරණයේ පිළිගත නොහැකි බව ප්‍රකාශ කිරීම.

XV. යුද්ධය ඇරඹීමට පෙර සිට ම සංග්‍රාමික රාජ්‍යයේ සේවයේ යෙදී සිටි නමුත් තමන්ගේම රටට එරෙහි ව සිදු කරන යුද මෙහෙයුම්වලට සහභාගි වීමට එම ජාතියේ පුද්ගලයන්ට බල කිරීම.

XVI. ප්‍රහාරයකින් අල්ලා ගත් නමුත් නගරයක් හෝ ස්ථානයක් කොල්ලකෑම.

XVII. වස හෝ වස ගැන්වූ ආයුධ පාවිච්චි කිරීම.

XVIII. ශ්වාසරෝධක, වස හෝ වෙනත් ගෑස් වර්ග හා සියලු සමකාරක ද්‍රව, ද්‍රව්‍ය හෝ උපකරණ යොදා ගැනීම.

XIX. මධ්‍යය සම්පූර්ණයෙන් ම ආවරණය නොවූ හෝ කැපුම්වලින් සිදුරුව ඇති දැඩි කවරයක් සහිත උණ්ඩ වැනි මිනිස් සිරුර තුළ පහසුවෙන් ම පැතිර යන හෝ තැලීමට ලක්වන උණ්ඩ යොදා ගැනීම.

XX. 121 හා 128 වගන්තිවලින් දැක්වෙන අදාළ ප්‍රතිපාදනවලට අනුකූල ව සංශෝධනයක් මඟින් මෙම ව්‍යවස්ථාවට ඇමුණුමක් වශයෙන් ඇතුළත් කළ හා සම්පූර්ණ තහනමක විෂයක් වන ආයුධ, උණ්ඩ හා ද්‍රව්‍ය හා යුද ක්‍රමවේදයන් වන්නේ නම් සන්නද්ධ ගැටුම් පිළිබඳ අන්තර්ජාතික නීතිය

නෛසර්ගිකව ම වෙනස් කිරීමක් නැතිව ම අනවශ්‍ය ආකාරයෙන් තුවාල සිදු කෙරෙන හෝ අනවශ්‍ය පීඩාවක් ගෙන දෙන ස්වභාවයෙන් යුත් ආයුධ, උණ්ඩ හා ද්‍රව්‍ය හා යුද්ධයේ ක්‍රමවේද යොදා ගැනීම.

XXI. පුද්ගල අභිමානයට විශේෂයෙන් ම අවමන් සහගත සහ නින්දා සහගත සැලකීම වැනි සාහසිකකම් සිදු කිරීම.

XXII. 7වන වගන්තියේ 2 (ඊ) ඡේදයේ නිර්වචනය කර ඇති ආකාරයට බලහත්කාරයෙන් වන්දිකරණය හෝ වෙනත් කුමන ආකාරයක හෝ ලිංගික ප්‍රචණ්ඩත්වයන් ජිනීවා සම්මුතීන් බරපතල උල්ලංඝනය කිරීමක් වන්නා වූත් දූෂණය, ලිංගික වහල්භාවය, බලහත්කාරයෙන් ගණිකා වෘත්තියේ යෙදවීම, බලහත්කාරයෙන් ගැබ් ගැන්වීම.

XXIII. සිවිල් වැසියන් හෝ වෙනත් ආරක්ෂිත පුද්ගලයන්ගේ සිටීම උපයෝගී කර ගනිමින් සමහර ස්ථාන, ප්‍රදේශ හෝ හමුදා බලකායන් හමුදා මෙහෙයුම්වලින් විනිර්මුක්ත කිරීම.

XXIV. අන්තර්ජාතික නීතියට අනුකූල ව ජිනීවා සම්මුතීන්ගේ සුවිශේෂ සලකුණු යොදා ගන්නා ගොඩනැගිලි ද්‍රව්‍ය, වෛද්‍ය ඒකක හා ප්‍රවාහනය හා පුද්ගලයන් ඉලක්ක කර ගත් ප්‍රහාර සිතාමතා ම එල්ල කිරීම.

XXV. ජිනීවා සම්මුතීන් යටතේ ප්‍රතිපාදනය කර ඇති ආකාරයට සහන සැපයුම්වලට සිතාමතා ම බාධා පැමිණවීම ඇතුළත්ව සාමාන්‍ය ජනතාවගේ පැවැත්මට අත්‍යවශ්‍ය වූ දේ ඔවුන්ට අහිමි කිරීම, යුද උපක්‍රමයක් ලෙස යොදා ගැනීමෙන් සාමාන්‍ය ජනතාව සාගින්නෙන් තැබීම.

XXVI. වයස අවුරුදි 15ට අඩු ළමයින් ජාතික සන්නද්ධ හමුදාවලට බඳවා ගැනීමෙන් හෝ ඇතුළත් කර ගැනීම හෝ ඔවුන් ක්‍රියාත්මක ව එදිරිවාදිකම්වලට සහභාගි කරවීම.

(ඇ) අන්තර්ජාතික ස්වරූපයේ නොවන සන්නද්ධ ගැටුම්වල දී 1949 අගෝස්තු 12වන දා අත්සන් කළ ජිනීවා සම්මුතීන් හතරට ම පොදු වන්නා වූ 3 වන වගන්තිය බරපතල උල්ලංඝනය කිරීම් වන, තම ආයුධ බිම තැබූ සන්නද්ධ සාමාජිකයන් හා රෝගී වීම, තුවාල සිදු වීම, රඳවා ගැනීම හෝ වෙනත් කුමන හේතුවක් නිසා හෝ සටන් කළ නොහැකි පුද්ගලයන් ඇතුළත් එදිරිවාදිකම්වලට ක්‍රියාත්මකව සම්බන්ධ නොවන තැනැත්තන්ට එරෙහි ව සිදු කෙරෙන පහත සඳහන් ක්‍රියාවන්,

I. විශේෂයෙන් ම සියලු ආකාරයේ ඝාතන, අංග ඡේදන, කුරිරු ලෙස සැලකීම සහ වධ බන්ධනය.

II. විශේෂයෙන් අවමන් සහගත හා නින්දා සහගත සැලකීම වැනි පුද්ගල අභිමානයට සිදු කෙරෙන ඝාතසික ක්‍රියා.

III. ප්‍රාණ ඇපකරුවන් ගැනීම.

IV. සාමාන්‍යයෙන් අත්‍යාවශ්‍ය යැයි පිළිගත් අධිකරණ සහතික ලබා දෙමින් විධිමත් ව ස්ථාපනය කරන ලද උසාවියකින් ප්‍රකාශයට පත් කළ තීන්දුවකින් තොර ව දඬුවම් නියම කිරීම හා ක්‍රියාත්මක කිරීම.

(ඈ) 2(ඇ) ඡේදය යෙදෙන්නේ අන්තර් ජාතික ස්වරූපයේ නොවන සන්නද්ධ ගැටුම්වලදීය. එය කැරලි කෝළාහල, තැනින් තැන වරින් වර සිදුවන ප්‍රචණ්ඩ හෝ සමාන වූ වෙනත් ක්‍රියාවන් වැනි අභ්‍යන්තර කැළඹීම් සහ නොඉවසුම්කාර තත්ත්වයන්හි දී නොයෙදේ.

(ඈ) අන්තර්ජාතික නීතියේ ස්ථාපිත නීති රාමුව තුළ අන්තර් ජාතික ස්වරූපයේ නොවන සන්නද්ධ ගැටුම්වලදී යෙදෙන නීති හා සම්ප්‍රදායන් වෙනත් බරපතල උල්ලංඝනය කිරීම් වන පහත සඳහන් ක්‍රියාවන්,

I. එදිරිවාදීකම්වලට සෘජුව ම සම්බන්ධ නොවන සිවිල් ජනතාවට හෝ සාමාන්‍ය පුද්ගලයන්ට එරෙහි ව සිතාමතා ම සෘජු ප්‍රහාර එල්ල කිරීම.

II. අන්තර්ජාතික නීතියට අනුකූල ව ජිනීවා සම්මුතීන්ගේ සුවිශේෂ සලකුණු යොදා ගන්නා ගොඩනැගිලි ද්‍රව්‍ය වෛද්‍ය ඒකක හා ප්‍රවාහනය හා පුද්ගලයන් ඉලක්ක කර ගත් ප්‍රහාර සිතා මතාම එල්ල කිරීම.

III. එක්සත් ජාතීන්ගේ ප්‍රඥාප්තියට අනුකූල ව මානුෂිකවාදී ආධාර කටයුතුවල හෝ සාම සාධක මෙහෙවරවලට සම්බන්ධ පුද්ගලයන්, ආයතන, ද්‍රව්‍ය, ඒකක හෝ වාහන සන්නද්ධ ගැටුම් පිළිබඳ අන්තර්ජාතික නීතිය යටතේ සාමාන්‍ය ජනතාවට හා සාමාන්‍ය ජනතාවගේ දේවලට ලබා දී ඇති ආරක්ෂාවට හිමිකම ලැබෙන තාක් ඒවාට එරෙහි ව සිතාමතා ම ප්‍රහාර එල්ල කිරීම.

IV. ආගමික, අධ්‍යාපනික, කලාව, විද්‍යාව හෝ පුණ්‍ය කටයුතු, ඓතිහාසික ස්මාරක, රෝහල් සඳහා වෙන් වූ ගොඩනැගිලි සහ රෝගී සහ තුවාල වූවන් රඳවා සිටින ස්ථානවලට, ඒවා හමුදාමය අරමුණු සඳහා නොවන්නේ නම්, සිතාමතා ම සෘජුව ම ප්‍රහාර එල්ල කිරීම.

V. ප්‍රහාරයකින් අල්ලාගත් නමුත් නගරයක් හෝ ස්ථානයක් කොල්ලකෑම.

(අන්තර්ජාතික, අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාව, 8 වන වගන්තිය, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව)

3.3.3. වර්ග ඝාතනය (Genocide).

Raphael Lemkin (1900-1959) නම් පෝලන්ත-යුදෙව් ජාතික නීති විශාරද විසින් "Genocide" යන දෙය මුල්වරට ප්‍රකාශ කරන ලදී. "gennos" යන ග්‍රීක වචනයෙන් ද, "cide" යන ලතින් වචනයෙන් ද සැදුම් ලද්දකි. ග්‍රීක භාෂාවෙන් genos යන්නෙහි අර්ථය වන්නේ පවුල, ගෝත්‍රය, ජාතිය වේ. ලතින් භාෂාවෙන් cide යන්නෙහි අර්ථය සමූල ඝාතනයයි. මෙය යුදෙව් ජන ඝාතනය සමයේ නිර්මාණය කරන ලද්දක් බැවින් ඔහුගේ අර්ථ නිරූපණය පටු එකක් වේ. නාසිවරුන්ගේ යුදෙව් ජන සංහාරය හා ආර්මේනියානු ජන සංහාරය යන සිද්ධින්ට පමණක් සීමා වූවකි. නමුත් වර්ග ඝාතනය යන්න භෞතික වශයෙන් සිදුවන හානියක් පමණක් නොව යම් ජන සමූහයකගේ සංස්කෘතිය, ජීවන පැවැත්ම අහිමි කිරීම ද ඊට අයත් වේ. "ස්විට්සර්ලන්ත ජාතික මහාචාර්ය Juliya Fribourg ට අනුව වර්ග ඝාතනය යන්නට යම් ජන කොට්ඨාසයකගේ සංස්කෘතික වාසස්ථාන භූමි අහිමි කිරීමේ අරමුණින් ඔවුන් අවතැන් භාවයට පත් කිරීම ද ඇතුළත් වේ" (<http://www.peprasiya,blogspot.com/2011/05/271genocide.html).

වර්ග ඝාතනය යනු කුමක්ද? යන්න සලකා බැලීමේ දී වර්ග ඝාතනය යන අපරාධය වැළැක්වීමේ හා දඬුවම් පැමිණවීම් පිළිබඳ සම්මුතියේ දෙවන ව්‍යවස්ථාව දක්වන ලෙසට "යම් ජන වර්ගයක් ජාතියක්, ආගමික කණ්ඩායමකට අයත් පිරිසක් මරා දැමීම, බරපතල ලෙස ශාරීරක හා මානසික හානි සිදු කිරීම, හිතාමතා ම ඔවුන්ගේ ජීවන තත්ත්වයට හානි කිරීම, ශාරීරික වශයෙන් දුබලතාවයට පත් කිරීම, උපත් පාලනය කිරීම, බලහත්කාරයෙන් ළමුන් එක් ජන කොට්ඨාසයකින් තවත් ජන කොට්ඨාසයකට මාරු කිරීම" වර්ග ඝාතනය ලෙස හැඳින්විය හැකිය. මෙහිදී එක් ජන කොට්ඨාසයක්

යන්නෙහි දී මුළුමනින් ම ජන කොටස හෝ එහි කොටසක් ද ඝාතනයට ලක් කිරීම අදහස් වේ.

අන්තර්ජාතික අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාවේ 06 වන වගන්තිය මගින් ද වර්ග ඝාතනය අර්ථ දක්වා ඇත. මෙම ව්‍යවස්ථාවේ කාර්යයන් සඳහා වර්ග ඝාතනය යන්නෙන් අදහස් වන්නේ

''ජාතියක්, වර්ගයක්, වංශයක් හෝ ආගමික කණ්ඩායමක් සම්පූර්ණයෙන් ම හෝ කොටසක් විනාශ කිරීමේ අරමුණින් සිදුකළ පහත සඳහන් ක්‍රියාවන්ගෙන් එකකි.

(අ) කණ්ඩායමක සාමාජිකයින් මැරීම.

(ආ) කණ්ඩායමක සාමාජිකයන්ට බරපතල ශාරීරික හෝ මානසික හානි සිදු කිරීම.

(ඇ) කණ්ඩායම සම්පූර්ණයෙන් ම හෝ කොටසක් කායික ව විනාශ කිරීම ඉලක්ක කරගෙන ජීවත්වීමේ තත්ත්වයට හිතාමතා ම හානි පැමිණවීම.

(ඈ) කණ්ඩායම තුළ උපත් ඇති වීම වැළැක්වීමේ අදහසින් නීති පැනවීම.

(ඉ) කණ්ඩායමක ළමයින් බලහත්කාරයෙන් වෙනත් කණ්ඩායමකට පැවරීම''
(අන්තර්ජාතික අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාව, 6වන වගන්තිය).

"Helen Fein" අර්ථ දක්වන ආකාරයට වර්ග ඝාතනය යන්න තුළ ජීව විද්‍යාත්මක වශයෙන් මෙන් ම සමාජමය වශයෙන් ද අදාළ පුද්ගල කොට්ඨාසය නැවත බිහි කිරීම වළක්වනු ලබයි. Lemkin නැමති නීති විශාරදයා දක්වන පරිදි වර්ග ඝාතනයේ දී ක්ෂණික ව යම් ජාතියක්

විනාශ වීම අදහස් වන්නේ නැත. එය අදාළ පුද්ගල කොට්ඨාසයේ පදනම විනාශ කිරීම අරමුණු කරගත් යම් සැකැස්මක් සේ ම ඒ තුළින් ඔවුන්ගේ ජීවන තත්ත්වය විනාශ කර දැමීමක් ද සිදුවිය හැකිය"
(<http://www.peparasiya.blogspot.com/2001/05/27/gwnocide.htm)

මනුෂ්‍යයන් උප්පත්තියෙන් ම යම් අයිතිවාසිකම් සමූහයකට උරුමකම් කියයි. එම අයිතිවාසිකම් අද වන විට ලෝකයේ විවිධ සම්මුති මඟින් තව දුරටත් සුරක්ෂිත කර තිබේ. නමුත් වර්ග ඝාතනය තුළින් මිනිසුන්ගේ ජීවිතයට ඇති අයිතිය, ජාතිකත්වයට ඇති අයිතිය, කෲර හා අමානුෂික වධ හිංසාවන්ට ලක් නොවී සිටීමේ අයිතිය ද බරපතල ලෙස උල්ලංඝනය කරයි. මෑත කාලීන ලෝක ප්‍රවණතාව අනුව පෙනී යන්නේ ජාත්‍යන්තර ප්‍රජාව අමානුෂික ගණයේ අපරාධයක් ලෙස සලකන වර්ග ඝාතනය විවිධ සම්මුති ඔස්සේ ප්‍රකාශිත ව ප්‍රතික්ෂේප කර ඇති බවයි. "Convention on the Prevention and punishment of the crime genocide - 1948 තුළ වර්ග ඝාතනය මනුෂ්‍යත්වයට එරෙහි වූ අපරාධයක් ලෙස දක්වා ඇත. එහි පළමු වගන්තිය මඟින් වර්ග ඝාතනය යන්න යුද සමයේ සිදු වූවත්, ඝාමකාමී කාලයක සිදු වූවත් අන්තර්ජාතික නීතිය යටතේ අපරාධයක් බව දක්වා ඇත"
(<http://www.peparasiya.blogspot.com/2011/05/27genocide.html).

වර්ග ඝාතනය සම්බන්ධයෙන් සිදු වූ අපරාධ අතර පහත ඒවා ප්‍රධානකොට දැක්වීමට පුලුවන. එනම්,

i. 1914-1928 කාලයේ ආර්මේනියානුවන්ට එරෙහි තුර්කි වර්ග ඝාතනය.

ii. 1933-1945 කාලයේ ජර්මනියේ ඒකාධිපති පාලක ඇඩොල්ෆ් හිට්ලර් නාසි හමුදාව යුදෙව්වන්, රෝම රුසියානුවන් හා වහල්

ජනයාටත් විරුද්ධ දේශපාලන මතධාරින්ටත් එරෙහිව සිදු කරන ලද වර්ග ඝාතනය.

iii. 1975-1979 කාලයේ කාම්පූචියාවේ වියට්නාම, මුස්ලිම්, චීන සුළුතරයට එරෙහිව සිදු කරන ලද වර්ග ඝාතනය.

iv. 1994 රුවන්ඩාවේ ටුට්සි සුළුතරයට හා හුටු විරෝධීන්ට එරෙහිව සිදු කරන ලද වර්ග ඝාතනය.

20වන සියවසේ ප්‍රධාන වශයෙන් සිදු වූ මෙම වර්ග ඝාතනයන්ට අමතර ව මෑත කාලීන ඉතිහාසය තුළ තවත් උදාහරණ කිහිපයකි.

i. 1971 බංගලාදේශ (නැගෙනහිර පකිස්ථාන) සමූළ ඝාතනය.

ii. සෝවියට් කොම්යුනිස්ට් රජය දේශපාලන, ආර්ථික හේතු මත කොම්යුනිස්ට් විරෝධී ජාතික හා ආගමික කොටස් ඝාතනය.

iii. චීන කොම්යුනිස්ට් රජය විසින් කරන ලද ටිබෙට් ජාතීන් ඇතුළු සුළුතර කොටස් ඝාතනය.

iv. නැම්බියාවේ හෙරෝරෝ ඝාතන.

v. බොස්නියාවේ මුස්ලිම් ඝාතන.

vi. ඩාෆුර්හි කළු අප්‍රිකානු ඝාතන.

vii. ඉරාකයේ කුර්දි ජනයා ඝාතන.

viii. ඇතම්හු ඕස්ට්‍රේලියානු රජය විසින් ඇබොරිජියන් පවුල් වෙතින් ඔවුන්ගේ ළමුන් ඉවත් කිරීමට පියවර ගැනීම ද සමූළ ඝාතනයක් ලෙස දකිති.

04

යුද අපරාධ සම්බන්ධයෙන් පවතින්නා වූ නීති මූලාශ්‍ර.

සැබවින් ම නූතන අර්ථයෙන් ගත් කල යුද නීතිය සන්නද්ධ අරගලවලට අදාළ වූ නීතිය හා මානව හිතවාදී නීතිය වශයෙන් නීති ප්‍රකාර දෙකකින් යුක්ත වන්නේය. එයින් යුද නීතියට අදාළ නීති පද්ධතිය හේග් නීතිය මුල් කරගෙන බිහි වූ අතර මානව හිතවාදයට අදාළ නීති පද්ධතිය ජිනීවා නීතිය මුල් කරගෙන බිහි වී ඇත. නමුත් මෙම නීති පද්ධතීන් එකවර බිහි වූ නීති පද්ධතීන් නොව කාලාන්තරයක් තිස්සේ සංශෝධනය වෙමින් වර්ධනය වූවකි. එවන් සුවිශාල වූ නීති සංග්‍රහයක අන්තර්ගතය මෙම කොටසින් අධ්‍යයනය කරනු ලැබේ.

4.1 හේග් නීතිය.

හේග් නීතියෙහි අන්තර්ගත ප්‍රධාන ප්‍රතිපාදන බිහි වූයේ 1899 ඇති කරගත් හේග් සම්මුතියෙනි. නමුත් එයට මූලික පදනම වැටෙන්නේ 1868 පීටර්ස්බර්ග් ප්‍රකාශනයයි. හේග් නීතිය වශයෙන් මෙහි දැක්වෙන්නේ යුද්ධය පාලනය කිරීමට අදාළ ව වරින් වර පැන නූ සම්මුතීන්, යෝජනා හා ප්‍රකාශනයන්ය. හේග් නීතිය සම්බන්ධයෙන්

සඳහන් කළ යුතු තවත් වැදගත් කරුණක් වන්නේ, එම නීතිය පෝෂණය වන්නේ යුරෝපයේ වෙනත් අගනුවරවල් මුල් කරගෙන බිහි වූ ඇතැම් නීති බණ්ඩයන් ද එක් වූ බවයි. එහිදී ප්‍රධාන නීති බණ්ඩයක් බවට පත් වන්නේ නෙදර්ලන්තයේ අගනුවර වූ ශාන්ත පීටර්ස්බර්ග් මුල් කරගෙන බිහි වූ සෙන්ට් පීටර්ස්බර්ග් ප්‍රකාශනය (1868) යි. හේග් නීතියට අදාළ නීති ලේඛනයන් මේ යටතේ සාකච්ඡා කරනු ලැබේ.

(i) 1868 පීටර්ස්බර්ග් ප්‍රකාශනය.

"මෙම ප්‍රකාශනය අදාළ වූයේ යුද්ධ සමයන්හි දී ඇතැම් දුර විදිය හැකි අවි තහනම් කිරීමට අදාළවය. 1868 නොවැම්බර් 29-දෙසැම්බර් 11 අතරතුර අත්සන් කෙරිණි" (කරුණාදාස, 2007, 83 පිටුව).

(ii) 1899 හේග් ජාත්‍යන්තර සාම සමුළු ප්‍රකාශනය (උද්ධමනය අංක 03).

"මෙම ප්‍රකාශනය අදාළ වූයේ මනුෂ්‍ය ශරීරය තුළට පහසුවෙන් විසිර යා හැකි මූනිස්සම් (bullets) භාවිතය තහනම් කිරීමට අදාළවය" (කරුණාදාස, 2007, 83 පිටුව).

(iii) 1907 ඔක්තොම්බර් 18 හේග් සම්මුතියේ උද්ධෘතය (හේග් සම්මුති අංක 10).

"මෙම සම්මුතිය අදාළ වූයේ ගොඩබිම් සංග්‍රාම නීතියට අදාළ චාරිත්‍ර හා නීතිවලට ගරු කිරීම සම්බන්ධයෙනි. මෙම ගොඩබිම් සංග්‍රාම නීතිය වූ කලි පූර්ව ඓතිහාසික යුගයෙන් ආරම්භ වී කාලයක් තිස්සේ විකාසනය වී ඇවිත් හේග් නීතිය වශයෙන් සංගෘහිත වූවකි. '1856 පාරිස් ප්‍රකාශනය, 1864 ජිනීවා සම්මුතිය, 1868 පීටර්ස්බර්ග් ප්‍රකාශනයේ සිට විවිධ අවස්ථාවන්හි දී රාජ්‍යයන් ඇතිකරගත් බහුපාර්ශ්වික සම්මුතීන් රාශියක් ඒකරාශි වීමෙන් බිහි වූවකි" (කරුණාදාස, 2007, 112 පිටුව).

(iv) 1907. ඔක්. 18 හේග් සම්මුතියේ උද්ධෘතය
(හේග් සම්මුති අංක v).

මෙම සම්මුතිය අදාළ වූයේ ගොඩබිම සංග්‍රාමයක් ඇති වුවහොත් එහිදී මධ්‍යස්ථ රටවල නැතහොත් මධ්‍යස්ථ බලවතුන්ගේ හා පුද්ගලයන්ගේ අයිතිවාසිකම් හා යුතුකම්වලට අදාළ වය.

(v) 1907. ඔක්තොම්බර් 18 හේග් සම්මුතියේ උද්ධෘතය
(හේග් සම්මුති අංක viii).

මෙම සම්මුතිය සබ්මැරීනයන්හි ස්පර්ශයෙන් ස්වයංක්‍රීය ව ක්‍රියාත්මක වන බෝම්බ අත හැරීමට අදාළ වූ සම්මුතියකි.

(vi) 1907. ඔක්තොම්බර් 18 හේග් සම්මුතියේ උද්ධෘතය
(හේග් සම්මුති අංක ix).

මෙම සම්මුතිය අදාළ වූයේ යුද්ධමය අවස්ථාවක දී නාවික හමුදා විසින් බොම්බ දැමීම සම්බන්ධයෙන්ය.

(vii) 1925 ජූනි ජිනීවා ප්‍රොටොකෝලය.

මෙම ප්‍රොටොකෝලය මගින් සංග්‍රාමයේ දී විෂ වායු හෝ වෙනත් වායු වර්ග ජීව විද්‍යාත්මක උපක්‍රම භාවිත කිරීම තහනම් කරනු ලැබුණි.

(viii) 1954 මැයි 14 හේග් සම්මුතිය.

සන්නද්ධ අරගලයක් ඇති වූ කල්හි සංස්කෘතික දේපළ ආරක්ෂාව සඳහා පැන වූ රීති මෙහි විය.

(ix) 1954 මැයි හේග් රෙගුලාසි.

මෙම රෙගුලාසි පැනවූයේ යුද්ධයක් ඇති වූ අවස්ථාවක දී සංස්කෘතික දේපළ ආරක්ෂා කිරීමට අදාළව පැනවුන 1954 මැයි 14 හේග් සම්මුතියේ සඳහන් විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙනි.

(x) 1954 මැයි හේග් ප්‍රෙටොකෝලය.

මෙම ප්‍රොටොකෝලය පනවනු ලැබුවේ සන්නද්ධ අරගලයක් ඇති වූ අවස්ථාවන්හි දී සංස්කෘතික දේපළ ආරක්ෂාවට අදාළ වය.

(xi) 1954 හේග් හි පැවැත්වූ අන්තර් ආණ්ඩු සමුළුවේ යෝජනාව.

මෙම යෝජනාව ද ඉදිරිපත් කරනු ලැබුයේ යුද්ධයක් ඇති වූ විටක සංස්කෘතික දේපළ ආරක්ෂා කිරීම සම්බන්ධයෙනි.

(xii) 1972 අප්‍රේල් 10 (හේග්) සම්මුතිය.

''මෙම සම්මුතිය පනවනු ලැබුයේ ජීව විද්‍යාත්මක හා විෂ (Toxin) අවි වර්ධනය නිෂ්පාදනය හා එක් රැස් කර තබා ගැනීම තහනම් කරනු පිණිසය'' (කරුණාදාස, 2007, 83-85 පිටු)

4.2 ජිනීවා නීතිය (Laws of Geneva).

ජිනීවා නීතිය වශයෙන් මෙහි සඳහන් වන්නේ මානව හිතවාදයට අදාළව නැතහොත් යුද්ධය හේතුවෙන් මනුෂ්‍යයන්ට සිදුවන පීඩාව අවම කිරීමට වරින් වර සම්මත වූ සම්මුතීන්, යෝජනා හා ප්‍රොටෝකෝලයන් (වෛකල්පිත හිවිසුම්) යනාදියයි. "මානව හිතවාදයට අදාළ ව 1949 අගෝස්තු 12වන දින ජාතීන් අතර සම්මත කරගත් ප්‍රධාන සම්මුතීන් අතර මානව හිතවාදී නීතිය ප්‍රධාන අංගය ලෙස සැලකෙන අතර ඉන් අනතුරුව ඇති කර ගත් නීතිරීති හා එකඟතාවන් ප්‍රධාන සම්මුතීන්ට ආනුෂංගිකව අතිරේක වශයෙන් ඇතිකරගන්නා වූ ඒවාය" (කරුණාදාස, 2007, 86 පිටුව).

ජිනීවා සම්මුතීන් යටතේ යුද්ධවලින් පීඩා විඳින්නන් ආරක්ෂා කර ගැනීම පිළිබඳ ව ප්‍රධාන මූලධර්ම 03ක් ඉදිරිපත් වේ. එනම්, "පීඩාවට ලක් කුමන වර්ගයකට අයත් සටන්කාමීන් (comatants) හෝ සටන්කාමීන් නොවන අය (non-combatants) අයත් වූවන් සැමදෙනාට ම ගෞරවය (Respect) ආරක්ෂාව (Protection) හා මානව හිතවාදී සත්කාර (humane treatment) ලැබෙන අයුරු කටයුතු කළ යුතුය" (ඩයස්, 1997 පිටුව 265).

මෙහිදී සටන්කාමීන් කවුරුන් ද යන්න පිළිබඳ ව 1949 යුද සිරකරුවන් පිළිබඳ සම්මුතියේ 4 (a) (2) වගන්තියේ දක්වා ඇත. ඒ අනුව සටන්කාමීන් යනු,

"(1) ජාත්‍යන්තර යුද නීතිය අනුව කටයුතු කරන

(2) ආයුධ ප්‍රසිද්ධියේ රැගෙන යන

(3) ඈතින් වුවත් හඳුනාගත හැකි ලකුණු දරන

(4) වගකිව යුතු පුද්ගලයෙකුගේ අණ යටතේ කටයුතු කරන අයයි"

(ඩයස්, 1997, 265 පිටුව)

මේ අනුව මතු දක්වෙන්නේ මානව හිතවාදයට අදාළ මූලාශ්‍රයන් නැතහොත් නීතිමය ලේඛනයන්ය.

(i) ජිනීවා සම්මුතිය I (1949)

ජිනීවා පළමු සම්මුතිය වශයෙන් හඳුන්වන මෙම සම්මුතිය 1949 අගෝස්තු 12වන දින එහි ප්‍රථම පාර්ශ්වකරුවන් වූ රාජ්‍යයන් විසින් අත්සන් කරනු ලැබූවකි. එනම් මෙම සම්මුතිය වන්නේ, සටන් බිමේ දී තුවාල වූ හා රෝගී වූ සන්නද්ධ හමුදා සාමාජිකයන් සුවපත් කිරීමට අදාළ ජිනීවා සම්මුතියයි. "මෙම සම්මුතිය පරිච්ඡේද නවයකින් ද, අවසන් ප්‍රතිපාදන ඇතුළු වගන්ති 64කින් හා ඇමුණුම් දෙකකින් ද යුක්ත වූවකි. එහි පළමු ඇමුණුමෙහි සඳහන් වන්නේ රෝහල් පිහිටි කලාපයන් හා ප්‍රදේශයන්ට අදාළ වූ වගන්ති 13කින් යුත් පනත් කෙටුම්පතකි" (කරුණාදාස, 2007, 86 පිටුව)

(ii) ජිනීවා සම්මුතිය II (1949)

මෙම ජිනීවා සම්මුතිය ද 1949 අගෝසතු 12වන දින අත්සන් කරනු ලැබූවකි. එයින් ප්‍රකාශ කරන්නේ සාගරයේ දී තුවාල වූ, රෝගාතුර වූ හෝ මුහුදුබත් වූ සන්නද්ධ හමුදා සාමාජිකයන් සුවපත් කිරීම අදාළ නීති මූලාශ්‍රයන්ය. "මෙම සම්මුතිය පරිච්ඡේද අටකින් හා අවසන් ප්‍රතිපාදන වශයෙන් සඳහන් කොටසකින් ද සමන්විත වූ වගන්ති 63කින් යුක්ත ලේඛනයකි" (කරුණාදාස, 2007, 86/87 පිටුව).

(iii) ජිනීවා සම්මුතිය III (1949)

මෙම සම්මුතිය අදාළ වන්නේ යුද සිරකරුවන් සම්බන්ධ ව ක්‍රියාකළ යුතු ආකාරය පිළිබඳවයි. "එහි අවසාන ප්‍රතිපාදන (Final Provision) සමඟ කොටස් හයකින් හා අනුබණ්ඩ (sections) එකක්, දෙකක් හෝ තුනක් බැගින් ද යුක්ත වගන්ති 143කින් සමන්විත

දීර්ඝ ලේඛනයකි. මෙම ලේඛනයට අදාළ ඇමුණුම් පහක් ද වේ" (කරුණාදාස, 2007, 87 පිටුව).

(iv) **ජිනීවා සම්මුතිය** IV (1949)

මෙම සම්මුතියෙන් ප්‍රකාශ වන්නේ සිවිල් ජනතාව යුද්ධ සමයේ දී ආරක්ෂා කිරීම සම්බන්ධ නීති මූලාශ්‍රයන්ය. "එය විවිධ කොටස් යටතේ (section) අංකිත පරිච්ඡේද 12කින් හා අවසන් ප්‍රතිපාදන ඇතුළත් ව වගන්ති 158කින් යුක්ත වේ. එයට යා කරන ලද ඇමුණුම් 03ක් ද වේ" (කරුණාදාස, 2007, 87 පිටුව).

(v) **1949 ජිනීවා රාජ්‍යතාන්ත්‍රික සමුළු යෝජනාව**(Resolution)

මෙම යෝජනා සම්මතය වගන්ති 11කින් යුක්ත වූවකි. එම යෝජනාවේ මූලික හරය වන්නේ මෙම සම්මුතිය භාවිතයේ දී පාර්ශ්වකරුවන් අතර පැන නඟින කිසියම් කරුණක් වෙනත් අයුරකින් විසඳිය නොහැකි වන විට එය ජාත්‍යන්තර අධිකරණය වෙත ගෙනයාමට පාර්ශ්වකරුවන් එකඟ වන බවයි.

මෙම සම්මුතීන් 04 සම්බන්ධ ව ව්‍යතිරේඛ අවස්ථා 2ක් පවතී. එහි පොදු නයාය නම්, රාජ්‍යය පාර්ශ්ව රටවල් 2ක් අතර යුද්ධයක දී සම්මුතීන් 4ම ක්‍රියාත්මක වේ. එයට අදාළ ව්‍යතිරේඛ 02 නම්,

1. "සම්මුතීන් හතරට ම පොදු වගන්ති අංක 02 අනුව සම්මුතීන් ක්‍රියාත්මක වන්නේ, ජාත්‍යන්තර සන්නද්ධ අරගලයක දී පමණ ය.

2. සම්මුති හතරට ම පොදු වගන්ති අංක 03 අනුව රාජ්‍යය පාර්ශ්වයන් වූ, හැම රාජ්‍යයක් ම සටනකදී රජය සහ කැරලිකරුවන් අතර සටනක් විය හැකි අවස්ථාවන් වලදී ද,

සෑම පුද්ගලකුටම එනම් සටනට සම්බන්ධ අය භටයන් සහ නොවන යුද්ධ භටයන්ටත් රෝගී වූ, තුවාල වූ, රඳවා ගෙන තැබීම් නිසා හෝ වෙනත් හේතුවක් නිසා සටනට බැහැරව සිටින භටයන් ද මානවවේදිව සැලකිය යුතුය..... සටනේදී ජාති, ආගම්, වර්ණ, කුල, ලිංගික, උත්පත්තිය ධනය හෝ සමාන හේතු මත භේද ව කටයුතු නොකළ යුතුය.

තහනම් තවත් ක්‍රියාවල්,

(a) ජීවිතයට හෝ පුද්ගලයාට හානි (මිනීමැරුම් අත් පා කපා දැමීම, දරදඬු හිරිහැර හා වද දීම)

(b) ප්‍රාණ ඇපකරුවන් ලෙස ගැනීම.

(c) පෞරුෂත්වය කෙලෙසන ක්‍රියා මාර්ග.

(d) නීත්‍යානුකූල අධිකරණයකට නොයවා දඬුවම් පැමිණවීම" (ඩයස්, 1997, 266 පිටුව)

(vi) 1949 ජිනීවා සම්මුතියට අදාළ අතිරේක පළමු ලේඛනය (Prtocole I)

එනම් ජාත්‍යන්තර සන්නද්ධ අරගලවල ගොදුරු බවට පත් වූවන් ආරක්ෂා කිරීමට අදාළ ජිනීවා පළමු ලේඛනයයි. මෙම ලේඛනය 1974-77 පැවැත්වුණු රාජ්‍යතාන්ත්‍රික සම්මේලනයෙන් අනතුරු ව ජාත්‍යන්තර සන්නද්ධ අරගලවලට (International Armed Conflict) අදාළ ව 1977 ජූනි මස 08වන දින අත්සන් කරනු ලැබූවකි. එහි දැක්වෙන්නේ සිවිල් ආරක්ෂක නිලධාරීන්, වෛද්‍ය හා ආගමික සේවාවන් යුද බිමේ දී නාවිතා කළ යුතු විවිධ සංකේත හා හැඳුනුම්පත් යනාදිය පිළිබඳ ව පිළිපැදිය යුතු රීති වේ.

(vii) 1949 ජිනීවා සම්මුතියට අදාළ අතිරේක දෙවන ලේඛනය (Protocole II)

මෙම ප්‍රොටෝකෝලය ජාත්‍යන්තර නොවන සන්නද්ධ අරගලවලට (Non-International Armed Conflict) අදාළවය. වගන්ති 28කින් සමන්විත ලේඛනයකි.

4.3. ළමා අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියේ 38වන වගන්තිය

"1989 නොවැම්බර් 20වන දින සම්මත වූ මෙම සම්මතයෙන් කියවුන ප්‍රධාන කරුණු 04කි.

1. සන්නද්ධ අරගලවල දී ළමුන්ට අදාළ ව ජාත්‍යන්තර මානව හිතවාදී නීතිය ගරු කළ යුතුය.

2. වයස අවුරුදු 15ට අඩු ළමුන් සෘජුවම යුද්ධයට සම්බන්ධ නොවීමට රාජ්‍යයන් වග බලා ගත යුතුය.

3. වයස අවුරුදු 15ට අඩු ළමුන් සොල්දාදුවන් වශයෙන් බඳවා නොගැනිය යුතුය.

4. සන්නද්ධ අරගල හේතුවෙන් ළමුන්ට සිදුවන බලපෑම්වලින් ළමුන් ආරක්ෂා කිරීමට රජය ක්‍රියා කළ යුතුය" (කරුණාදාස, 2007, 90 පිටුව).

4.4 සාම්ප්‍රදායික ජාත්‍යන්තර මානව හිතවාදී නීතිය (Customary International Humanitarian Law)

මෙම නීතිය විමර්ශනය කිරීමේදී වඩාත් පහසුවෙන් මාතෘකා කිහිපයක් යටතේ කරුණු අධ්‍යයනය කළ හැකිය.

(I) වෙන්කර හඳුනාගැනීමේ සිද්ධාන්ත (The Principles of Distinctions).

(a) ගැටුමෙහි පාර්ශ්වකරුවන් විසින් සියලු අවස්ථාවන්හි දී රණකාමීන් (combatants) හා සිවිල් වැසියන් (civilians) විශේෂ කොට නැතහොත් වෙන්කර හඳුනාගැනීමක් කළ යුතුය. ඒ අනුව ප්‍රහාර එල්ල කළ හැක්කේ රණකාමීන්ට විනා සිවිල් වැසියන්ට නොවේ.

(b) සිවිල් වැසියන් අතර සන්ත්‍රාසය හෝ භීතිය වපුරවන පරමාර්ථයෙන් කිසිවක් ප්‍රචණ්ඩ ක්‍රියාවක් හෝ බිය වැද්දවීමක් කිරීම තහනම් වන්නේ ය.

(c) ගැටුමක පාර්ශ්වකරුවන් වන්නා වූ සන්නද්ධ හමුදාවක වෛද්‍ය හා පූජක පක්ෂය හැර සියලු ම සාමාජිකයෝ රණකාමීන් වෙති.

(d) සන්නද්ධ හමුදාවක සාමාජිකයන් නොවන්නා වූ සියල්ලෝ ම වැසියෝය.

(e) සෘජු ව ම එදිරිවාදිකම්වලට සහභාගි නොවන තෙක් සිවිල් වැසියන් ප්‍රහාරවලින් ආරක්ෂිතය.

(II) සිවිල් අභිප්‍රායන් (objectives) හා යුදමය අභිප්‍රායන් වෙන්කර හඳුනා ගැනීම.

(a) ගැටුමක (යුද්ධයක) පාර්ශ්වකරුවන් විසින් සියලු ම අවස්ථාවන්හි දී සිවිල් අභිප්‍රායන් යුදමය අභිප්‍රායන්ගෙන් වෙන්කර හඳුනාගත යුත්තේය. එහෙයින් ප්‍රහාර එල්ල කළ යුත්තේ යුදමය අභිප්‍රායන්ට (ඉලක්කයන්ට) විනා සිවිල් ඉලක්කයන්ට නොවේ.

(b) යුදමය අභිප්‍රායන් විය යුත්තේ යුද්ධමය ඉලක්කයෙහි ස්වභාවය, පිහිටීම හා අරමුණු අනුව එය විනාශ කිරීමෙන්, අල්ලා ගැනීමෙන් හෝ උදාසීන කිරීමෙන් (neutralise) එම අවස්ථාවේ හැටියට නියත යුදමය වාසියක් අත්කර ගත හැකි අභිප්‍රායන් සඳහා පමණි.

(c) සිවිල් අභිප්‍රායන්, ඒවා යුදමය අභිප්‍රායන් නොවන තාක් කල් ප්‍රහාරවලින් ආරක්ෂා විය යුතුය.

(III) අවිචාරාත්මක ප්‍රහාර එල්ල කිරීම (Indiscriminate Attack)

(a) අවිචාරාත්මක ප්‍රහාර එල්ල කිරීම තහනම්ය. අවිචාරාත්මක පහරදීමක් වන්නේ නිශ්චිත යුදමය අභිප්‍රායකට එල්ල නොවන ප්‍රහාරයකි. එසේත් නැත්නම් යොදා ගනු ලබන යුද උපක්‍රමය මඟින් එවැනි අභිප්‍රායකට එල්ල කිරීමට අසමත් ප්‍රහාරයකි.

(b) සිවිල් වැසියන්ගෙන් හෝ සිවිල් අභිප්‍රායෙන් යුක්ත නගරයක හෝ ගමක පවත්නා වූ කිසියම් මිලිටරි අභිප්‍රායකට හෙළීම තහනම්ය.

(IV) ප්‍රහාරයන්හි දී පූර්වාවධානය දැක්වීම.

(a) යුද්ධ ක්‍රියාන්විතයන්හි දී සිවිල් ජනතාවට හා සිවිල් අභිප්‍රායන්ට හානි නොකිරීම (Spare) හැකි සෑම අයුරකින් ම පූර්ව අවධානය යොමු කළ යුතුය.

(b) ගැටුමක එක් එක් පාර්ශ්වකරුවන් විසින් යොදා ගනු ලබන යුද්ධ උපක්‍රමවල දී සිවිල් වැසියන්ට, ඔවුන්ගේ ජීවිතවලට, දේපළවලට සිදුවිය හැකි හානි අවම කිරීමට හැකි සියලු ම ආරක්ෂක පියවර ගත යුතු වේ.

(c) ලබා ගැනීමට අවශ්‍ය යුදමය වාසිය අභිභවා යන තරම් හානියක් සිවිල් වැසියන්ට සිදුවන ආකාරයේ පමණ ඉක්මවා යන ප්‍රහාරයන් එල්ල කිරීම තහනම්ය.

(d) ප්‍රහාරයක් එල්ල කිරීමට පෙර ගැටුමක පාර්ශ්වයක් විසින් කල් තබා අනතුරු ඇඟවීමක් කළ යුත්තේය.

(V) නිශ්චිත සාංග්‍රාමික උපක්‍රම (Specific Methods of warefare)

(අ) 1. සතුරාට කිසිදු නවාතැනක් නොදෙන බවට නියෝග කරමින් සතුරා බියවද්දමින් සතුරුකම් පවත්වා ගෙන යාම තහනම්ය.

2. යුදබිමේ දී තුවාල වීමෙන් සුව කළ නොහැකි බවට පත්වන්නා සොල්දාදුවන් (Hors de coombat) වශයෙන් හඳුනා ගන්නවුන්ට ප්‍රහාර එල්ල නොකළ යුතුය. සටන් කළ නොහැක්කු බවට සලකනු ලබන

පුද්ගලයන් වන්නේ, සතුරු පාර්ශ්වයට අයත් පුද්ගලයන්.

(a) සිහිමුර්ජා වීම, රෝගාතුර වීම, තුවාල වීම හෝ මුහුදුබත් වීම නිසා ආරක්ෂාවට කිසිත් හවිහරණක් නොමැති පුද්ගලයන්ය.

(b) පැහැදිලි ව යටත්වීම ප්‍රකාශ කරන පුද්ගලයන්ට.

3. හදිසි ආපදාවක දී ගුවන් යානයකින් බිමට බසින පැරෂුට් භටයන්ට එරෙහිව ප්‍රහාර එල්ල කිරීම තහනම් ය.

(ආ) දේපළ විනාශ කිරීම හා අත්පත් කර ගැනීම.

1. ගැටුමක පාර්ශ්වකරුවන් විසින් සතුරාට අයත් යුද උපකරණ යුද්ධයෙන් කොල්ල කෑ වස්තුවක් (war booty) ලෙස අත්පත් කර ගත හැකිය.

2. එහෙත් යුදමය අවශ්‍යතාවන් නිසා අවශ්‍යයෙන් ම සිදු කරන බලකිරීමකින් නිසා මිස සතුරාගේ දේපළ විනාශ කිරීම හෝ අත්පත් කරගැනීම තහනම්ය.

3. අත්පත් කරගත් ප්‍රදේශයක පවත්නා දේපළ අතුරින්,

(a) යුදමය කාර්යයන් සඳහා යොදාගත හැකි මහජන චංචල දේපළ රාජ සන්තක කළ හැකිය.

(b) චංචල නොවන මහජන දේපළක් එය අන්සතු දේපළක් ලෙසින් එම දේපළට හානි නොකිරීමේ දී

හෝ අපතේ නොහැරීමේ රීතිය (rule of usfruct) යටතේ සතුරා විසින් භාවිත කළ හැකිය.

(c) පෞද්ගලික දේපළ අයිතියට ගරු කළ යුතු හා රාජසන්තක නොකළ යුතු වේ.

4. දේපල කොල්ල කෑම (pillage) තහනම්ය.

(ඇ) නිරාහාර ව හාමතේ තැබීම හා මානව සහනාධාරයන්ට ප්‍රවිශ්ට වීම.

1. සංග්‍රාම උපක්‍රමයන් ලෙසින් සිවිල් ජනතාව නිරාහාර ව තැබීමේ උපක්‍රමය භාවිත කිරීම තහනම්ය.

2. සිවිල් ජනතාවගේ පැවැත්මට අවශ්‍යවන්නා වූ අරමුණුවලට පහරදීම, විනාශ කිරීම, ඉවත් කිරීම හා ඒවා නැතිව බැර (In dispensible) භාණ්ඩ බවට පත් කිරීම තහනම්ය.

3. සිවිල් වැසියන් සඳහා වන මානව හිතවාදී සහනයන් (අත්‍යවශ්‍ය ආහාර, බෙහෙත් ද්‍රව්‍ය යනාදිය) වහා ම හා බාධාවකින් තොරව සැපයීමට ගැටුමේ පාර්ශ්වකරුවන් විසින් අවසර දිය යුත්තේය.

4. අවසර ලත් මානව හිතවාදී සහන සේවකයන්ට අත්‍යවශ්‍ය කටයුතු පවත්වා ගැනීම සඳහා ඔවුන්ට නිදහසේ එහා මෙහා යෑමේ අයිතිය ගැටුමේ පාර්ශ්වකරුවන් විසින් සුරක්ෂිත කළ යුත්තේය.

(ඈ) මුලා කිරීම හෝ රැවටීම (desption)

1. ජාත්‍යන්තර මානව හිතවාදී නීතිය කඩ නොකරන තාක් කල් (Infinage) යුද උපායන්/රැවටිලි (rules of war) තහනම්ය.

2. තාවකාලික සාම ධජය වූ ශ්වේත වර්ණ ධජය (white flag od truce) අනිසි අයුරින් භාවිත කිරීම තහනම්ය.

3. ජිනීවා සම්මුතීන්ට අදාළ විශේෂ සංකේත නැතහොත් සලකුණු (emblems) අනිසි අයුරින් භාවිත කිරීම තහනම්ය.

4. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සංකේත/සලකුණු හා නිල ඇඳුම්, සංවිධානය විසින් අවසර දුන් අවස්ථා හැර භාවිත කිරීම තහනම්ය.

5. ජාත්‍යන්තර වශයෙන් පිළිගත් වෙනත් සලකුණු ද අනිසි අයුරින් ප්‍රයෝජනයට ගැනීම තහනම්ය.

6. සතුරාට අයත් ධජ හෝ හමුදා සංකේතයන් ද නිල ලාංඡන හෝ නිල ඇඳුම් අනිසි ලෙස අයුරින් ප්‍රයෝජනයට ගැනීම තහනම්ය.

7. යුද්ධයෙහි පාර්ශ්වකරුවන් නොවූ මධ්‍යස්ථ හෝ වෙනත් රාජ්‍යයක් සතු ධජ හමුදා සංකේත නිල ලාංඡන හෝ නිල ඇඳුම් අනිසි ලෙස භාවිතය හෝ අනිසි ප්‍රයෝජනය ගැනීම තහනම්ය.

8. ද්‍රෝහිකම (perfidy) උපයෝගී කර ගනිමින් සතුරකු ඝාතනය කිරීම, තුවාල කිරීම හෝ අල්ලා ගැනීම තහනම්ය.

(VI) යුද අවි භාවිතය

(අ) යුද අවි භාවිතයේ මූලික සිද්ධාන්ත

1. පමණ ඉක්මවා යන හානියක් හෝ අනවශ්‍ය පීඩාවක් කරන්නා වූ ස්වභාවය ඇති සංග්‍රාම උපක්‍රම හා ක්‍රමවේදයන් භාවිත කිරීම තහනම්ය.

2. ස්වභාවය අනුව අවිචාරාත්මක විය හැකි අවි ආයුධ භාවිතය තහනම්ය.

(ආ) විෂ භාවිතය හෝ විෂ යෙදූ අවි භාවිතය තහනම්ය.

1. ජීව විද්‍යාත්මක අවි (Bio logical weapons)
2. රසායනික අවි (Chemical weapons)
3. විස්තීරණ මූනිස්සම් (Expanding Bullets)

(ඇ) පුපුරණ වෙඩි උණ්ඩ (Exploding bullets)

1.මනුෂ්‍ය ශරීරය තුළ දී පුපුරණ පුද්ගල නාශක උණ්ඩ (Anti Personnel use of bullets) භාවිතය තහනම්ය.

2.මනුෂ්‍ය ශරීරය තුළ ඉතා සියුම් කොටස්වලට කැඩෙන පහසුවෙන් අනාවරණය කර ගත නොහැකි එක්ස්රේවලින් පවා සොයාගත නොහැකි අන්දමේ තුවාල සිදු කරන අවි ආයුධ භාවිතය තහනම්ය.

(ඇ) බිම් බෝම්බ ඇටවීම (Land mines)

1. බිම් බෝම්බ භාවිත කරනු ලබන අවස්ථාවනිහි දී ඉන් සිදු වන්නා වූ අවිචාරාත්මක හානි අවම කිරීම සඳහා විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය.

2. ගැටුමක පාර්ශ්වකරුවෙකු විසින් බිම් බෝම්බ අටවන විට හැකිතාක් දුරට ඒවා ඇටවූ ස්ථානය පිළිබඳ වාර්තා තබා ගත යුතුය.

3. බිම් බෝම්බ ඇටවූ පාර්ශ්වය විසින් එදිරිවාදිකම් (සතුරු ක්‍රියා) අවසන් වූ පසු ව, ඒවා ඇටවූ පාර්ශ්වය විසින් ඉවත් කිරීම හෝ සිවිල් වැසියන්ට හානියක් නොවන අයුරින් ඉවත් කිරීම හෝ එසේ ඉවත් කිරීමට සහාය දැක්විය යුතුය.

(ඉ) 1. ගිනි බෝම්බ ආයුධවලදි (In cendiary weapons) සිවිල් නැසියන්ට තුවාල කිරීම හෝ ජීවිත හානි අවම වන පරිද්දෙන් ඒවා භාවිත කිරීමට විශේෂ සැලකිල්ලක් දැක්විය යුතුය.

2. පුද්ගලයන්ට එරෙහි ව ගිනි බෝම්බ භාවිතය තහනම්ය.

(VIII) රණ බිමේ දී ආබාධිත වූවන්ට හා සිවිල් වැසියන්ට සැලකිලි දැක්වීම (Treatment of civillians and Persons horse de combat)

(අ) මූලික වගකීම්/සහතික වීම් (Fundemental Guarantess)

1. යුද බිමේ දී රෝගාතුර වූවන්ට හා සිවිල් වැසියන්ට මානුෂික වශයෙන් සැලකිය යුතුය.

2. වර්ගය, වර්ණය, ලිංගිකත්වය, භාෂාව, ආගම, විශ්වාස දේශපාලන හෝ වෙනත් මතයන්, ජාතික හෝ සමාජීය ප්‍රභවය, ධනය, උත්පත්තිය හෝ වෙනත් ඊට සමාන කරුණු පදනම් කරගෙන කිසිදු වෙනස්කමක් නොකළ යුත්තේය.

3. මනුෂ්‍ය ඝාතනය කිරීම තහනම්ය.

4. වදදීම (torture) කෲර හෝ අමානුෂික අයුරු සංග්‍රහ කිරීම සහ විශේෂයෙන් ම පෞද්ගලික අභිමානයට අවමන් වන ආකාරයෙන් සැහැසිකම් (outrages) සිදු කිරීම තහනම්ය.

5. ශාරීරික දඬුවම් දීම තහනම්ය.

6. ස්ත්‍රී දූෂණය හා වෙනත් ආකාරයක ලිංගික අපරාධ කිරීම තහනම්ය.

7. සියලු ම ආකාරයේ වහල් භාවය හා වහල් වෙළෙඳාම තහනම්ය.

8. වන්දි නොගෙවා හෝ අයුතු ලෙස බලහත්කාරයෙන් වැඩ ගැනීම තහනම්ය.

9. ප්‍රාණ ඇපකරුවන් වශයෙන් අල්ලා ගැනීම තහනම්ය.

10. මිනිස් පළිහක් වශයෙන් අල්ලා ගැනීම තහනම්ය.

11. බලහත්කාරයෙන් අතුරුදහන් කිරීම තහනම්ය.

12. හිතුවක්කාර අන්දමින් නිදහස අහිමි කිරීම තහනම්ය.

13. සාමූහික දඬුවම් දීම තහනම්ය.

(ආ) යුද කරන්නන් හා යුද සිරකරුවන්ගේ තත්ත්වය (Combatants and Prisoners of war)

1. ප්‍රහාරයක් කරන විට හෝ ප්‍රහාරයකට සූදානම් වන විට සටන් කාමීන්/යුද්ධ කරන්නන් විසින් තමන් සිවිල් ජනතාවගෙන් වෙන්කර හඳුනා ගත යුතුය.

2. ඔත්තු සෙවීමේ දී අල්ලා ගනු ලැබූ සටන්කරුවන්ට යුද සිරකරු තත්ත්වය හිමි නොවේ. ඔවුන්ට පූර්ව නඩු විභාගයකින් (trial) තොර ව වරදකරුවෙකු (convicted) කළ නොහැකිය.

3. කුලී හමුදාවන්ට (merceneries) සටන්කාමීන් හෝ යුද සිරකරුවන්ගේ තත්ත්වය හිමි නොවේ. පූර්ව පරීක්ෂණයකින් තොර ව ඔවුන් වරදකරුවන් කළ නොහැකිය" (කරුණාදස, 2007, 92-103 පිටුව).

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

මුද්‍රිත ග්‍රන්ථ

- අලහකෝන්, උදිත. (2007). ත්‍රස්තවාදයට එරෙහි ගෝලීය යුද්ධය, ඇස් ගොඩගේ සහ සමාගම, කොළඹ.
- අලහකෝන්, එම්.ජේ. (2004). යුරෝපීය ඉතිහාසය 1815-1918, කර්තෘ ප්‍රකාශනයක්.
- කටුගම්පොළ, රාජා. (2007). එක්සත් ජාතීන්ගේ සංවිධානය, ඇස් ගොඩගේ සහ සමාගම, කොළඹ.
- කරුණාතිලක, කේ. (1998). අපරාධ බාලාපරාධ සහ පුනරුත්ථාපනය, මාලිංග ප්‍රකාශකයෝ, කඩවත.
- කරුණාදාස, ඩබ්ලිව්. එම්. (1999). ජාත්‍යන්තර දේශපාලනය, ඉමේජ් ලංකා ප්‍රකාශකයෝ, දෙහිවල.
- කරුණාදාස, ඩබ්ලිව්. එම්. (2000). ජාත්‍යන්තර අර්බුද 1 කොටස, ඉමේජ් ලංකා ප්‍රකාශකයෝ, දෙහිවල.
- කරුණාදාස, ඩබ්ලිව්. එම්. (2003). ගැටුම් නිරාකරණයට හැදින්වීමක්, ඉමේජ් ලංකා ප්‍රකාශකයෝ, දෙහිවල.
- කරුණාදාස, ඩබ්ලිව්. එම්. (2003). ජාත්‍යන්තර මානව හිතවාදී නීතිය, ඉමේජ් ලංකා ප්‍රකාශකයෝ, දෙහිවල.

- කරුණාදාස, ඩබ්ලිව්. එම්. (2004). ජාත්‍යන්තර සබඳතා ප්‍රවේශය, ඉමේජ් ලංකා ප්‍රකාශකයෝ, දෙහිවල.
- කරුණාදාස, ඩබ්ලිව්. එම්. (2007). ජාත්‍යන්තර මානුෂික අයිත්වාසිකම් නීතිය, ඉමේජ් ලංකා ප්‍රකාශකයෝ, දෙහිවල.
- කංකානම්ගේ, සුගත්. (2006). ලෝක යුද්ධයේ සෝවියට් පෙරමුණ, කර්තෘ පූකාශනයක්.
- කුමාර, දර්ශන අශෝක. (2009). වත්මන් මාධ්‍යය අධ්‍යයන ප්‍රවණතා, ඇස් ගොඩගේ සහ සමාගම, කොළඹ.
- කොස්තා, ජයතිස්ස. (1986). අන්තර්ජාතික නීතිය, කර්තෘ ප්‍රකාශනයක්.
- ගුණරත්න, රාජා. (2009). අපරාධ නීතිය, කර්තෘ ප්‍රකාශනයක්.
- ජගත්චන්ද්‍ර, නිහාල්. (2003). ප්‍රවෘත්ති සහ වාර්තාකරණය, ඇස් ගොඩගේ සහසමාගම, කොළඹ.
- ඩයස්, නොයෙල්. (1997). ජාත්‍යන්තර තුලනාත්මක හා මානව හිමිකම් පිළිබඳ නීතිය, කර්තෘ ප්‍රකාශනයක්.
- ඩයස්, සිඩ්නි මාක්ස්. (2007). සන්නිවේදනය හා මාධ්‍යය අධ්‍යයනය, තෝතැන්න ප්‍රකාශකයෝ, ආණමඩුව.
- දිසානායක. විමල්. කුමාරසිංහ, කුලතිලක. (2009). සන්නිවේදනය සමජය හා පුවත්පත් කලාව, ඇස් ගොඩගේ සහ සමාගම, කොළඹ.

- දොඹගහවත්ත, ආරියන්නද. (2009). ඊළමේ කථාව, වාසනා පොත් ප්‍රකාශකයෝ, දංකොටුව.
- පතිරණ, සමන් සංජීව. (2008). එක්සත් ජාතින්ගේ සාම ක්‍රියාවලිය 1945-2008, කර්තෘ ප්‍රකාශනයක්.
- පීරිස්, ජී. එල්. (1979). ලංකාවේ අපරාධ නීතිය, ලේක් හවුස් ඉන්වෙස්මන්ට්ස්, කොළඹ 02.
- ප්‍රනාන්දු, සංජීව කේ. ඒ. (2007). එක්සත් ජාතින්ගේ සංවිධානය හා ශ්‍රී ලංකාව, ආකර්ෂා ප්‍රකාශකයෝ, හෙට්ටිමුල්ල.
- මහේන්ද්‍ර, සුනන්ද සහ වෙනත් අය. (1993). පුවත්පත් කලා සමීක්ෂා, පුවත්පත් මණ්ඩලය, කොළඹ.
- මලලසේකර, තිලිණ රුවන්. (2001). අන්තර්ජාලය හා ඊළම් සටන් ව්‍යාපාරය, ඇස් ගොඩගේ සහ සමාගම,' කොළඹ.
- රත්නපාල, නන්දසේන. (1990). අපරාධ විද්‍යාවේ මූලධර්ම, ආරිය ප්‍රකාශකයෝ, වරකපොළ.
- වන්නිආරච්චි, ජයතිලක. (1975). එක්සත් ජාතින්ගේ සංවිධානය, ගුණසේන සහ සමාගම, කොළඹ 11.
- ශ්‍රී ලංකාව, එක්සත් ජාතින්ගේ සංවිධානය. (1995). එක්සත් ජාතින් පිළිබඳ මූලික තතු, එක්සත් ජාතින්ගේ ප්‍රවෘත්ති කේන්ද්‍රය, කොළඹ 07.

- ශ්‍රී ලංකාව, එක්සත් ජාතින්ගේ සංවිධානය. (1995). ශ්‍රී ලංකාව තුළ එක්සත් ජාතින්ගේ ක්‍රියාකාරීත්වය, එක්සත් ජාතින්ගේ ප්‍රවෘත්ති කේන්ද්‍රය, කොළඹ 07.

- ශ්‍රී ලංකාව, එක්සත් ජාතින්ගේ සංවිධානය. (2001). එක්සත් ජාතින් අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව, එක්සත් ජාතින්ගේ ප්‍රවෘත්ති කේන්ද්‍රය, කොළඹ 07.

- ශ්‍රී ලංකාව, එක්සත් ජාතින්ගේ සංවිධානය. (2001). එක්සත් ජාතින් පිළිබඳව ඔබට දැන ගැනීමට අවශ්‍යව තිබූ දේ, එක්සත් ජාතින්ගේ ප්‍රවෘත්ති කේන්ද්‍රය, කොළඹ 07.

- ශ්‍රී ලංකාව, එක්සත් ජාතින්ගේ සංවිධානය. (2002). සමාජ අධ්‍යයනය හා එක්සත් ජාතින්, එක්සත් ජාතින්ගේ ප්‍රවෘත්ති කේන්ද්‍රය, කොළඹ 07.

- ශ්‍රී ලංකාව, එක්සත් ජාතින්ගේ සංවිධානය. (2003). එක්සත් ජාතින් අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව, එක්සත් ජාතින්ගේ ප්‍රවෘත්ති කේන්ද්‍රය, කොළඹ 07.

- ශ්‍රී ලංකාව, එක්සත් ජාතින්ගේ සංවිධානය. (2005). එක්සත් ජාතින් 60 වසරක කාර්යය සාධනය, එක්සත් ජාතින්ගේ ප්‍රවෘත්ති කේන්ද්‍රය, කොළඹ 07.

- ශ්‍රී ලංකාව, එක්සත් ජාතින්ගේ සංවිධානය. (2006). එක්සත් ජාතින් ගේ සංවිධානය ශ්‍රී ලංකාව පිළිබඳ සමාලෝඡනය, එක්සත් ජාතින්ගේ ප්‍රවෘත්ති කේන්ද්‍රය, කොළඹ 07.

- ශ්‍රී ලංකාව, එක්සත් ජාතින්ගේ සංවිධානය. (2007). එක්සත් ජාතින්ගේ සංක්ෂිප්ත තොරතුරු සංග්‍රහය, එක්සත් ජාතින්ගේ ප්‍රවෘත්ති කේන්ද්‍රය, කොළඹ 07.

- solish,gary. (2010). the law of armed conflict interítioíl humanitarian law in war, combridge university press.

පනත් කෙටුම්පත්

- අන්තරජාතික අපරාධ අධිකරණයේ රෝම ව්‍යවස්ථාව (1998). ශ්‍රී ලංකාව, මනව හිමිකම් කොමිෂන් සභාව.

- ජිනිවා සම්මුති පනත (2006). ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේතුව.

- යුද්ධ හමුදා පනත, 357 වන අධිකාරිය, අංක 17, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

ශබ්ද කෝෂ

- මලලසේකර, ගුණපාල. (2002). ඉංග්‍රීසි සිංහල ශබ්ද කෝෂය, ගුණසේන සහ සමාගම, කොළඹ.

අන්තර්ජාල ප්‍රකාශන

- http://en.wikipedia.org/wiki/ruwandan_gencoide
- http://en.wikipedia.org/wiki/yugoslav_wars
- http://hondaokkoma.com/norway%20sebalunge%20yuda%20aparada.html
- http://peparasiya.bloápot.com/2011/05/genocide.html
- http://si.wikipedia.org/wiki/
- http://vikalpa.org/?p=2051/22/02/2011
- http://vikalpa.org/?p=2231/26/03/2010
- http://vikalpa.org/?p=6406/30/04/2011
- http://vikalpa.org/?p=7118/08/07/2011
- http://vikalpa.org/?p=7400/04/08/2011
- http://vikalpa.org/?p=7544/21/08/2010
- http://www.wsws.org/sinhala/2011/2011jul/pers17j.html
- http://www.wsws.org/sinhala/2011/2011jul/pers27j.html
- http://www.wsws.org/sinhala/2011/2011jul/pers30j.html
- http://www.wsws.org/sinhala/2011/2011jun/cha424j.html
- http://www.wsws.org/sinhala/2011/2011jun/mxho03j.html

- http://www.wsws.org/sinhala/2011/2011may/slgtosm.html
- http://www.wsws.org/sinhala/2011/2011may/unrt24m.html
- www.lankatruth.com
- www.un.org/news/dh/infocus/sri-lanka/poe-report-fullpdf